සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
DEPARTMENT OF SAMURDHI DEVELOPMENT

2024
කාර්යසාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development,
Social Security and Community Empowerment

කාර්යසාධන වාර්තාව - 2024

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පටුන

පිටුව

අන්තර්ගතය

01	පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	05 - 09
02	පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10 - 52
03	පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	53 - 94
04	පරිච්ඡේදය 04 -	කාර්යසාධන දර්ශක	95 - 96
05	පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	97 - 99
06	පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	100 - 109
07	පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	110 - 117
08	සංවර්ධන වැඩසටහන්වලට අදාළ ඡායාරූප		

පරිච්ඡේදය- 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනත මඟින් ස්ථාපිත මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ සමෘද්ධිලාභී දිළිඳු පවුල් ලක්ෂ 17 ට සමෘද්ධි සුබසාධනය සලසමින් ඔවුන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමය. සමාජ ආරක්ෂණ අරමුදල මඟින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවල දී ආරක්ෂණය සැලසීමට අදාළව දීමනා ලබා දේ. ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින් උපුටා දැමීම සඳහා එම පවුල් සවිබලගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1097 ක් මඟින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍ය කරන විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය කිරීම සිදු කෙරේ. මීට අමතරව, දිළිඳු පවුල් සහ අඩු ආදායම්ලාභී ජනතාව, ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාමත්, ඔවුන්ගේ සමාජ හා ආර්ථික සංවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කෙරේ.

1.2 දැක්ම හා මෙහෙවර

දැක්ම

"වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"

මෙහෙවර

අවාසි සහගත තත්ත්වයට පත් ජනතාව ආර්ථික, සමාජීය, භෞතික, මානසික, නෛතික, හා පාරිසරික වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා සඵලදායී වැඩසටහන් ප්‍රජා සහභාගීත්වය ලබා ගනිමින් තිරසාර ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවට නැංවීම.

පරමාර්ථ

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 4 වන වගන්තිය අනුව දෙපාර්තමේන්තුවේ පරමාර්ථ පහත දක්වා ඇත.

(අ) දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.

(ආ) පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ජීවනෝපාය ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.

(ඇ) එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.

(ඇ) ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජනතාව ඒකරාශී කිරීම සහ සවිබලගැන්වීම.

(ඉ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ නැංවීමේ කාර්ය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම.

(ඊ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(උ) ජනතාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අවශ්‍ය විය හැකි අධ්‍යන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම.

(ඌ) ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සහ සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම.

1.3 ක්‍රියාත්මක ප්‍රධාන ධාරාවන්

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ විධි විධාන අනුව, දෙපාර්තමේන්තුව පහත පරිදි ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

1. නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව
2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව
3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

1. නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව

සමෘද්ධි පනතේ 7 (1), (2), (3) වගන්ති අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස්වලට අනුව ජාතික සභාවක් පත් කර ඇත. එහි සාමාජිකයින් 11 දෙනෙකු සිටී. දෙපාර්තමේන්තුවේ සංයුතිය පහත පරිදි වන නිල තන්ත්‍රයකින් සමන්විත වේ. අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල නායකත්වය යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් තිදෙනෙකු සහ ප්‍රධාන අංශ 16 ක ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක වේ. එනම්, පාලන, ආයතන, විමර්ශන, නීති, තොරතුරු තාක්ෂණ, විශ්‍රාම වැටුප්, මානව සම්පත් සංවර්ධන, සමාජ ආරක්ෂණ හා සුබසාධන, ජීවනෝපාය සංවර්ධන, සමාජ සංවර්ධන හා පරිසර, ප්‍රජාමූල සංවිධාන, ව්‍යවසාය සංවර්ධන, සැලසුම් හා මෙහෙයුම්, ක්ෂුද්‍රමූල්‍ය (බැංකු / මහා සංගම්), මාධ්‍ය, මුදල් හා විගණන, යන අංශ භාර ප්‍රධානීන් ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් 25 ආවරණය වන ලෙසින් තම අංශවල රාජකාරී කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මෙහෙයවීම යටතේ ඇති දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් සහ එම කාර්ය මණ්ඩලය මඟින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, කලාප හා ග්‍රාමනිලධාරී වසම් මට්ටමින් සමෘද්ධි පනතේ අරමුණු ලඟාකර ගැනීමට අදාළ රාජකාරී ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජාමූල බැංකු කටයුතු, ප්‍රජාමූල සංවිධාන ගොඩනැඟීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් ප්‍රාදේශීය නිලධාරීන් වන සමෘද්ධි කළමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි. සමස්ත සේවක සංඛ්‍යාව 22,944 වේ.

2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව

සමෘද්ධි පනතේ 25(1),(2),(3),(4) ,29 (1),(2),(3),(4) හා 34 වගන්ති අනුව ප්‍රජාමූල බැංකු, බැංකු සමිති හා මහා සංගමයේ කටයුතු අධීක්ෂණය හා නියාමනය සඳහා සාමාජිකයින් 8 දෙනෙකුගෙන් යුත් කළමනාකරණ මණ්ඩලයක් පත් කර ඇත. මෙම අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ හා මහා සංගමය යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මඟින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 335 ට අදාළ ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල බැංකු සමිති, කලාප සහ ග්‍රාම

නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1,097 කට අදාළ සියලු කාර්ය මණ්ඩලය මඟින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමයි. එම පද්ධතිය මගින් ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීමේ තැන්පතු පවත්වාගෙන යාම, ප්‍රතිලාභීන්ගේ තැන්පතු පවත්වාගෙන යාම හා ඉතුරුම් වර්ධනය, ප්‍රතිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට ක්ෂුද්‍රමූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

2024 වර්ෂය තුළ දී ජීවනෝපාය සංවර්ධන කටයුතු නිවාස, පාරිභෝගික, ආපදා සහ වෙනත් ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට ණය යෝජනා ක්‍රම 21 ක් යටතේ ලබා දී තිබූ මුළු ණය වටිනාකම රු.මි. 54,197.04 කි. ඊට අදාළ ව නිකුත් කර ඇති ණය සංඛ්‍යාව 284,290 කි. 2000 සිට 2024 වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ මුළු ණයවල සමුච්චිත වටිනාකම රු.මි. 519,881.86 කි. ඊට අදාළ සමුච්චිත ණය සංඛ්‍යාව 12,608,212 කි. සාමාජික කොටස් ඇතුළු සමස්ත බැංකු ගිණුම් සංඛ්‍යාව 13,673,026 කි. මුළු තැන්පතු මුදල රු.මි. 162,956.86 කි. තව ද මෙම අංශයේ සියළු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක කර ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ඉන් ලබා දීමට පියවර ගෙන ඇත.

3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතට අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා සමෘද්ධි දිස්ත්‍රික් සංවිධාන පිහිටුවීම සඳහා අවශ්‍ය නියෝග හා ව්‍යවස්ථා (සමෘද්ධි පනතේ 42 වන වගන්තිය) ඇතුළත් 2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්විය. ඒ අනුව සමෘද්ධි පනතේ මූලික අරමුණ වන දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය ඉටු කිරීම උදෙසා සෑම ග්‍රාම නිළධාරි වසමක්ම ආවරණය වන පරිදි ස්වේච්ඡාවෙන් සංවිධානය වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 09 වන වගන්තිය) ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 15 වන වගන්තිය) සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 19 වන වගන්තිය) සිදුකර ඇත. ප්‍රජා මූල සංවිධානවල කටයුතු පිළිබඳ අධීක්ෂණය, මෙහෙයවීම හා උපදෙස් ලබා දීමට සාමාජිකයින් 18 කින් සැඳුමලත් සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල නමින් කමිටුවක් ජාතික මට්ටමින් රැස් වේ. ප්‍රජාමූල සංවිධාන පිහිටුවා, ශක්තිමත් කොට, ප්‍රජාව බලගන්වා, ඔවුන් ආර්ථික, සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින්, ප්‍රජා මූල බැංකු හා ජීවනෝපාය වැඩසටහන් සඳහා යොමු කිරීමේ අරමුණින්, 2024 වර්ෂය වන විට ප්‍රජා මූල සංවිධාන 29,814 ක් ද ප්‍රාදේශීය සංවිධාන 335ක් සහ දිස්ත්‍රික් කමිටු 25ක් ක්‍රියාත්මකව පවතී.

1.4. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා එහි කාර්ය භාරයන්

අ.අ	අංශය	කාර්යභාරය
1	පාලන අංශය	මානව සම්පත් බඳවා ගැනීම මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය
2	ආයතන අංශය	උසස් කිරීම හා පෞද්ගලික ලිපි ගොණු නඩත්තු කිරීම
3	ගිණුම් අංශය	රාජ්‍ය මුදල් හා ගිණුම් කටයුතු පාලනය කිරීම හා දෙපාර්තමේන්තුව සතු වත්කම් පවරා ගැනීම හා කලමණාකරණය කිරීම
4	ජීවනෝපාය සංවර්ධන අංශය	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ග්‍රාමිය හා ප්‍රජා මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

අ.අ	අංශය	කාර්යභාරය
5	ක්ෂුද්‍ර මූල්‍ය අංශය / මහා සංගම් අංශය	ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීම, ඉතුරුම් හා ආයෝජන ප්‍රවර්ධනය, බැංකු හා බැංකු සමිති අධීක්ෂණය
6	ව්‍යවසාය සංවර්ධන අංශය	ව්‍යවසායකත්ව සංවර්ධනය හා අලෙවි සංවර්ධනය සඳහා ප්‍රාදේශීය, ග්‍රාමීය හා ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
7	සමාජ සංවර්ධන හා පරිසර අංශය	පරිසර හා සමාජ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
8	සැලසුම් හා මෙහෙයුම් අංශය	වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම්කරණය, ප්‍රගති සමාලෝචනය, පසුවිපරම් කිරීම, අධීක්ෂණය, වාර්තා කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා සහාය වීම.
9	ප්‍රජාමූල සංවිධාන අංශය	ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටු පිහිටුවීම හා පවත්වගෙන යාම හා ප්‍රාජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
10	විගණන අංශය	සමෘද්ධි පනත හා පොදු උපදෙස් අනුව විගණන කටයුතු පවත්වාගෙන යාම හා කළමනාකරණය.
11	තොරතුරු තාක්ෂණ අංශය	තොරතුරු තාක්ෂණ කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය.
12	මාධ්‍ය අංශය	මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාතමක කිරීම.
13	මානව සම්පත් සංවර්ධන අංශය	නිලධාරීන්ගේ (මානව සම්පත්) ධාරිතා සංවර්ධනය කිරීම.
14	සමාජ සුබසාධන හා සමාජ ආරක්ෂණ අංශය	රජයේ සහනාධාර හා සමාජ ආරක්ෂණ අරමුදලේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .
15	නීති අංශය	නීති උපදෙස් ලබාදීම හා නෛතික කටයුතු ක්‍රියාත්මක කිරීම.
16	විමර්ශන අංශය	සේවක විනයානුකූල කටයුතු හා විමර්ෂණ කටයුතු පවතවාගෙන යාම.
17	විශ්‍රාම වැටුප් ඒකකය	සේවක විශ්‍රාම ගැනීම් සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම.

1.5 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය



පරිච්ඡේදය - 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්වල ප්‍රගතිය

2.1.1. පාලන අංශය

පාලන අංශයේ කාර්යභාරය

පාලන, ආයතන, නීති හා විමර්ශන අංශවලට අදාළ කටයුතු හා විශ්‍රාම වැටුප් ඒකකයට අදාළ කටයුතු සිදු කරනු ලබයි. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු සහ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය යටතේ ඉටු කෙරෙන ප්‍රධාන රාජකාරි වේ.

ප්‍රධාන අරමුණු

- බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය පවත්වාගෙන යාම, දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන ව්‍යුහය සකස් කිරීම.

දෛනික රාජකාරි

- දෛනික තැපැල පිළිබඳ කටයුතු කිරීම.
- අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
- සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම හා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ සියලු රාජකාරි සිදු කිරීම.
- ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- සේවක වැටුප්, දීමනා හා ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාළ කටයුතු.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග, තරඟ විභාග හා උසස්වීමේ විභාග සංවිධානය කිරීම.
- නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධ සංඛ්‍යා ලේඛන වාර්තා නඩත්තු කිරීම.
- අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු කටයුතු.
- නිලධාරින් හා සම්බන්ධ විනය පරිපාලන කටයුතු.

විශේෂ පැවරුම්

- පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ලබාදීම හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය.
- මහජන පෙත්සම් කාරක සභා රාජකාරි කටයුතු.
- පාලන අංශයට අදාළ විගණන විමසුම සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම්වලින් පැන නඟින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනෙකුත් උසස්වීම් විභාග පැවැත්වීම / සන්නිවේදන කාර්ය සපුරාලීම.
- පවතින පුරප්පාඩු පිළිබඳ සලකා බලා නව නිලධාරින් බඳවා ගැනීම.
- තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ තොරතුරු ලබා දීම.

- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කෙටුම්පත් සහ මානව හිමිකම් රාජකාරී කටයුතු

2024 වර්ෂයේ පහත සඳහන් පරිදි දෙපාර්තමේන්තුගත නිලධාරින් වෙනුවෙන් කාර්යක්ෂමතා කඩයිම් විභාග පවත්වන ලදි.

2024 වර්ෂයේ පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

(සංඛ්‍යා සටහන - I)

අනු අංකය	විභාගය පැවැත්විය යුතු නිලධාරීන්	පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
01	විධායක නිලධාරි (අභ්‍යන්තර විගණක) (SL-1)	දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
02	සමෘද්ධි කළමනාකරු (MN- 4)	පළමුවන සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
03	සමෘද්ධි කළමනාකරු (MN - 6)	පළමුවන සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
04	කාර්මික නිලධාරී (MT- 1)	දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
05	කාර්යාල කාර්ය සහායක (PL- 1)	තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2.1.2. ආයතන අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දිස්ත්‍රික් කාර්යාල වල සේවය කරන සියළුම සමෘද්ධි කළමණාකරුවන්ගේ සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු වල පහත දක්වා ඇති රාජකාරී කටයුතු ආයතන අංශය මඟින් සිදු කරනු ලබයි.

- නිලධාරීන්ගේ අන්තර්ග්‍රහණ කටයුතු
- පරිවාස කාලයෙන් පසු සේවය ස්ථිර කිරීම
- ශ්‍රේණි උසස්වීම් ලබා දිම
- විශ්‍රාම ගැන්වීම
- සේවයෙන් මුදාහැරීම්
- දේශීය නිවාඩු සහ විදේශීය නිවාඩු අනුමත කිරීම

2.1.3. විමර්ශන අංශය

අරමුණ

1. නිලධාරින් විසින් සිදු කරන විෂමාචාරයන් විමර්ශනය කර, විනය දඬුවම් පැමිණවීම මඟින් ඔවුන් නිසි මගට ගැනීමට කටයුතු කිරීම.
2. දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය සේවයේ කීර්ති නාමය ආරක්ෂා කිරීම.
3. දෙපාර්තමේන්තු සේවකයින් තුළ විනය පවත්වාගෙන යාම සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම සහතික කිරීම.
4. වංචා හා අක්‍රමිකතා වැලැක්වීම සඳහා අවශ්‍ය යෝජනා / නිර්දේශ ඉදිරිපත් කිරීම.

අංශයේ කාර්යභාරය

- ලැබෙන පැමිණිලි අනුව මූලික විමර්ශන පැවැත්වීම.
- අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන විශේෂ විගණන පරීක්ෂණ සම්බන්ධ ඉදිරි විනය ක්‍රියාමාර්ග සිදු කිරීම.
- නිදහසට කරුණු විමසීම හා චෝදනා පත්‍ර නිකුත් කිරීම.
- විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම.
- විනය නියෝග නිකුත් කිරීම.
- මාණ්ඩලික නිලධාරින්ට අදාළ චෝදනා පත්‍ර කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.
- විනය නියෝගවලට එරෙහි අභියාචනා සඳහා රාජ්‍යසේවා කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- ජනාධිපති විමර්ශන අංශය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව හා පාර්ලිමේන්තු පෙත්සම්කාරක සභාව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු.

2024 වර්ෂයේදී සිදු කළ කාර්යයන්හි සංක්ෂිප්ත වාර්තාව

මූලික විමර්ශන රාජකාරී සිදු කරනු ලබන සමෘද්ධි කළමනාකරුවන් සඳහා 2024/06/05 දින සිට 2024/06/07 දින දක්වා නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේදී පැමිණිල්ල මෙහෙයවීම පිළිබඳ පුහුණු වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ඒ සඳහා දැනට මූලික විමර්ශන රාජකාරී සිදු කරනු ලබන නිලධාරීන් 30 ක් පමණ සහභාගී වී ඇත.

(සංඛ්‍යා සටහන - II)

අනු අංකය	කාරණය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්/මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්/ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
1	පසුගිය මාසය අවසානයේ ක්‍රියා කිරීමට ඇති ඉතිරි විනය ගොනු සංඛ්‍යාව	596	558	563	564	543	533	511	487	476	476	
2	මූලික විමර්ශන සඳහා පත් කරන ලද සංඛ්‍යාව	5	4	4	22	3	2	1	2	3	1	47
3	I මූලික විමර්ශන වාර්තා සංඛ්‍යාව	5	9	10	6	2	8	5	6	7	7	65
	II විශේෂ විගණන පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව	4	2	8	5	2	1	1	2	1	0	26
4	අලුතින් ආරම්භ කරන ලද විෂය ගොනු සංඛ්‍යාව	11	10	18	19	5	17	6	12	16	9	123
5	අනිවාර්ය නිවාඩු/ස්ථාන මාරුවීම්/වැඩතහනම් කරන ලද නිලධාරින් සංඛ්‍යාව	5	4	4	13	2	12	2	4	9	2	57
6	විනය පරීක්ෂණවලට යටත්ව නැවත සේවයේ පිහිටුවීම	0	0	1	0	2	1	1	1	0	0	6
7	වැඩතහනම් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවන ලද වාර්තා සංඛ්‍යාව	0	0	2	3	0	3	2	1	0	1	12
8	නිදහසට කරුණු විමසීම් සංඛ්‍යාව	16	29	5	16	6	9	7	17	7	3	115
9	නිදහසට කරුණුවලට අදාළව තිරණ දැනුම් දුන් සංඛ්‍යාව	6	7	6	28	2	9	3	8	3	2	74

අනු අංකය	කාරණය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්/මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්/ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
10	(a) නිකුත් කරන ලද චෝදනාපත්‍ර සංඛ්‍යාව	16	18	6	24	5	7	16	12	11	11	126
	(b)රා.සේ.කො.සභාව වෙත යවන ලද චෝදනාපත්‍ර කෙටුම්පත් සංඛ්‍යාව	3	0	0	2	1	4	1	1	0	1	13
11	සංශෝධනය කරන ලද චෝදනා පත්‍ර සංඛ්‍යාව	1	4	2	5	2	3	3	7	5	3	35
12	(a)පත් කරන ලද විනිශ්චය සභා සංඛ්‍යාව	2	4	2	7	1	6	2	3	2	3	32
	(b) පරික්ෂණ මණ්ඩල/වෙත අදාළ ලේඛන ලබා දීම, පැමිණිල්ල මෙහෙයවන නිලධාරි/චූදිත	1	3	1	7	1	1	3	5	1	0	23
13	ලැබුණු පරික්ෂණ වාර්තා සංඛ්‍යාව	12	1	1	4	1	3	0	0	1	1	24
14	(a) ලබා දුන් විනය නියෝග සංඛ්‍යාව	16	10	18	15	18	21	14	12	15	2	141
	(b) රා.සේ.කො.සභාව වෙත නිර්දේශ කර යවන ලද විනය නියෝග කෙටුම්පත් සංඛ්‍යාව	0	2	0	1	0	0	2	1	1	0	7
15	පත්වීම් අවසන් කළ/සේවයෙන් පහ කළ නිලධාරීන් සංඛ්‍යාව	2	3	0	2	1	2	1	0	1	0	12
16	අභියාචනා සඳහා රා.සේ.කො.සභාව වෙත ඉදිරිපත් කළ 3 පරිශිෂ්ඨ වාර්තා සංඛ්‍යාව	0	3	1	7	3	2	1	1	3	4	25
17	අභියාචනා තීරණ දැනුම් දුන් සංඛ්‍යාව	2	5	6	1	0	5	1	3	2	0	25
18	නිම කරන ලද ගොනු සංඛ්‍යාව	34	22	23	25	18	49	19	21	19	14	244
19	තවදුරටත් ක්‍රියා කිරීමට ඉතිරි ගොනු සංඛ්‍යාව	567	486	553	543	529	509	490	473	476	474	

2.1.4. විශ්‍රාම වැටුප් ඒකකය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගෙන් මුල් සේවා හා නව සේවා මනාපය පල කරමින් අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රධානය කිරීම විශ්‍රාම වැටුප් ඒකකය මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යය වේ.

මේ අනුව 2019 වර්ෂයේ අගොස්තු මස 01 වන දින සිට දෙපාර්තමේන්තුවේ පාලන අංශය යටතේ මෙම ඒකකය ස්ථාපිත කරන ලදි. එතැන් සිට මේ දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ හා අමතර වශයෙන් ලබා දී ඇති උපදෙස්වලට අනුගත වෙමින් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පිළිගැන්වීම ක්‍රියාත්මක කරන ලදි.

මෙහිදී අධිකාරියක් තුළ කටයුතු කරමින් ඒ අනුව පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරමින් කටයුතු කළ ආයතනික ක්‍රියාවලිය තුළ පොදු 53 චර්යා සටහන ආදිය මුල් පත්වීමේ දින සිට නිලධාරියා විශ්‍රාම යන / මිය යන දිනය දක්වා පත්වීමට අදාළ සියළු තොරතුරු ක්‍රමානුකූලව ඇතුළත් කරමින්, සටහන් කිරීම ඇතැම් අවස්ථාවල ගැටළු සහගත තත්ත්වයක පැවති අතර, මෙම කරුණු නිරාකරණය කර ගැනීම සඳහා දැඩි වෙහෙසක් දැරීම සියළු නිලධාරීන් මුහුණ දුන් අභියෝගයක් විය.

මෙම සියළු කාරණා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ, අණ පනත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා ගලපා ගනිමින් 2019 වර්ෂයේ ආරම්භ කල මෙම ඒකකය මඟින් 2024.12.31 දිනට විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 3,975 අතරින් නිලධාරීන් 2,935 දෙනෙකුට අදාළ ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර, ඒ අතරින් නිලධාරීන් 2,801 ක් මේ වන විට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබමින් සිටියි.

විශ්‍රාම වැටුප් ගෙවීමේ ප්‍රගතිය 2024.12.31 දිනට

(සංඛ්‍යා සටහන - III)

අනු අංකය	කාරණය	විශ්‍රාම ගිය සංඛ්‍යාව	මිය ගිය සංඛ්‍යාව	එකතුව
1	විශ්‍රාම ගිය සංඛ්‍යාව	3,401	574	3,975
2	නිලධාරීන් විසින් අවශ්‍ය තොරතුරු ලබා නොදීම මත ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි ගොණු සංඛ්‍යාව	30	44	74
3	විශ්‍රාම වැටුප් ගෙවිය යුතු මුළු සංඛ්‍යාව	3,371	530	3,901
***4**	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ සංඛ්‍යාව	2,569	366	2,935
5	විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා තවදුරටත් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ඉතිරි සංඛ්‍යාව	802	164	966
***4**	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ සංඛ්‍යාව	2,569	366	2,935
	2024.11.10 දිනට සමස්ත ගෙවීම් එකතුව	2,481	320	2,801
	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගෙවීමට ඉතිරි	88	46	134

2.1.5. නීති අංශය

දෙපාර්තමේන්තු කාර්යයන් පහසුවෙන් ඉටුකිරීම සඳහා අවශ්‍යවනු ලබන මූලික ප්‍රඥප්තියෙහි ප්‍රතිපාදනයන් පිළිබඳ අධ්‍යයනය කිරීම හා එකී ප්‍රඥප්තිය ප්‍රකාර කළ යුතු නියෝග හා රීති පිළියෙල කිරීමත්, සමෘද්ධි බැංකු සහ සමෘද්ධි බැංකු සමිති රජයේ විගණනයට යටත් කිරීම සඳහා 2013 අංක 1 දරන සමෘද්ධි පනත සංශෝධනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීමත්, දෙපාර්තමේන්තුවට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභා පැමිණිලි සඳහා ඒවාට වගකීම් දරණ අංශ හා නිලධාරීන් මඟින් නිසි පිළිතුරු පිළියෙල කරවා කොමිෂන් සභාව වෙත යැවීම හා පරීක්ෂණ සඳහා සම්බන්ධ වීමත්, දෙපාර්තමේන්තුව විසින් හා ඊට එරෙහිව පැවරෙන නීති කෘත්‍යයන් සඳහා ඒවාට වගකීම් දරණ අංශ හා නිලධාරීන් ගේ සහයෝගය ඇතිව නිරීක්ෂණ සපයමින් නීතිපති දෙපාර්තමේන්තුව හා මනා සම්බන්ධීකරණයක් පවත්වමින් එකී නඩුකටයුතු සඳහා සම්බන්ධ වීමත්, දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන වත්කම් හා සේවාවන් මිලදීගැනීම් හා බැහැර කිරීම් වලට අදාළ නෛතික ලේඛණ පිළියෙල කිරීම සඳහා අවශ්‍ය නීති උපදෙස් සැපයීම හා සම්බන්ධීකරණය කිරීමත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති නිලධාරීන් සඳහා නීතිමය දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සමෘද්ධිලාභීන් හා අඩු ආදායම් ලාභීන්ගේ නෛතික ගැටළු විසඳීම සඳහා නීතිමය දැනුවත් කිරීමේ වැඩසටහන් හා නීති සායන නීති ආධාර කොමිෂන් සභාවේ සහාය ඇතිව සංවිධානය කිරීමත් වේ.

2024 වර්ෂයේ නීති අංශය මගින් බදුල්ල, මොණරාගල, අනුරාධපුරය, පොළොන්නරුව, හම්බන්තොට සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභී පුද්ගලයින් 600ක් පමණ සඳහා නීතිමය සවිබලගැන්වීමේ සායන පවත්වන ලද අතර මේ සඳහා රු.මි. 0.849ක පමණ මුදලක් වියදම්කර ඇත.

2.1.6. සමාජ ආරක්ෂණ හා සුබසාධන අංශය

හැඳින්වීම

අංක 8 දරණ භාරකාර ඔප්පුව මගින් 1997.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. සමාජ ආරක්ෂණ අරමුදල ලාභ නොලබන පදනමින් සුබසාධන අරමුණ පෙරදැරිව සංස්ථාපනය කොට ඇත. බැංකු ආයෝජනයන් සහ සමාජ ආරක්ෂණ අරමුදල මගින් පාලනය වන නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය මගින් ලැබෙන ආදායම් තුලින් සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ගොඩනැගී ඇත.

2013 අංක 01 දරණ දිවිනැගුම සංවර්ධන පනතට අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ දී, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කටයුතු එලෙසම ක්‍රියාත්මක කිරීම සඳහා මීට සම්බන්ධ කරන ලදී. ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස ක්‍රියාත්මක වූ අතර, 2017 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තු නාමය සංශෝධනය වීමත් සමග මෙම අරමුදල සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල නමින් ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සභාපතිත්වයෙන් යුතුව සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මගින් අරමුදලේ කළමනාකරණය,පරිපාලනය හා පාලන කටයුතු සිදු වේ.

අරමුණු

- අස්වැසුම නොලබන සමෘද්ධිලාභීව සිටි සහ සමාජයේ අවාසි සහගත තත්ත්වයට පත් පුද්ගලයන්, කණ්ඩායම්, අනපේක්ෂිතව හා අපේක්ෂිතව මුහුණ දීමට සිදුවන මූල්‍යමය දුෂ්කරතා අවමකර ඔවුන්ගේ සමාජීය හා ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- අස්වැසුම නොලබන සමෘද්ධිලාභීව සිටි ප්‍රජාව ගේ පෝෂණ මට්ටම ඉහල නැංවීම සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම තුලින් ඔවුන්ගේ සමාජීය හා ආර්ථික තත්ත්වය නගා සිටුවීමට ක්‍රියා කිරීම.
- අතිරික්ත මුදල් ඉහල පොලී අනුපාතයන් යටතේ රාජ්‍ය බැංකුවල ආයෝජනය කිරීම තුලින් සහ නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ ආදායම ඉහල නැංවීම තුලින් අරමුදල තර කර ගැනීම.

මෙම අරමුදලෙන් බලාපොරොත්තුවන සමාජ ආර්ථික ප්‍රතිඵල:-

- ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය පහත වැටීමට සිදු වන අවස්ථාවල දී මූල්‍යම හා වෙනත් ආධාර සැපයීම තුලින් ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම.
- අ.පො.ස (සා.පෙළ) සමත් අ.පො.ස (උ.පෙළ) හැදෑරීමට වරම් ලද අස්වැසුම නොලබන සමෘද්ධිලාභීව සිටි දරුවන්ගේ ද්විතීක අධ්‍යාපනය සඳහා දිරිගැන්වීම.
- ඉහල පොලී අනුපාතයන් යටතේ ආයෝජනය කිරීම තුලින් අරමුදලේ මූල්‍ය තත්ත්වය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම.

ක්‍රියාකාරකම් පිළිබඳව හැඳින්වීම

2023 ජුලි මස සිට අස්වැසුම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමත් සමඟ සමෘද්ධි සහනාධාර වැඩසටහන සමග සිටි පවුල් 1,640,000 ක පමණ ප්‍රමාණයකට මෙතෙක් ලබාදුන් රක්ෂණ පහසුකම් අහෝසි වී යන අතර සමෘද්ධි සහනාධාර ලාභීන් විසින් මාසිකව සමාජ ආරක්ෂණ අරමුදලට ලබාදෙන දායක මුදල ද අහිමි වී ඇත. එබැවින් සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සමාජයේ අවාසි සහගත තත්ත්වයට පත් පුද්ගලයින්, කණ්ඩායම්, ආයතන සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ලබා දෙනු ඇත.

සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන දිවයින පුරා විසිරී සිටින සහනාධාරලාභී පවුල්වල අ.පො.ස (උසස් පෙළ) හදාරන සියළුම සිසු දරු දැරියන්ට මසකට රු. 1,500/= බැගින් වසර දෙකක අධ්‍යන කාලයක් සඳහා ශිෂ්‍යත්ව ලබා දේ.

එසේම අරමුදලට අයත් ස්ථාවර වත්කමක් වන නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය මඟින්, අභ්‍යන්තර සහ වෙනත් බාහිර ආයතන වෙත නේවාසික පහසුකම්, පුහුණුවීම්,දේශණ,වැඩමුළු පවත්වනු ලැබේ.

- නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය ත්‍රිකුණාමල පුල්මුඩේ මාර්ගයේ පිහිටා ඇත.
- දේශීය විදේශීය සංචාරක ආකර්ශණයක් සහිත නිලාවේලි වෙරල තීරය ආසන්නයේ පිහිටා ඇති නිසා විදේශීය සංචාරකයන්ටද කාමර 5 කින් යුත් නවීන පහසුකම් සහිත නේවාසික මධ්‍යස්ථානයකි.
- රැස්වීම් ශාලා හා අවශ්‍යම කාමර වායු සමීකරණය කටයුතු යොදමින් සිටින නිසා ඉදිරියේදි අපේක්ෂිත ආදායම තවදුරටත් වර්ධනය කර ගැනීමට පියවර ගෙන ඇත.
- තාක්ෂණික සම්බන්ධතා පුළුල් කරමින් අන්තර්ජාලය හරහා වෙන් කිරීම් සිදුකල හැක.

ක්‍රියාත්මක ක්‍රමවේදය

සිප්දොර ශිෂ්‍යත්ව ලබා දෙනු ලබන්නේ අ.පො.ස (සා.පෙළ) සමත්ව උසස් පෙළ හදාරණ අස්වැසුම නොලබන සමෘද්ධිලාභිව සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහාය. 2022-2024 හා 2023-2025 අධ්‍යනය වර්ෂ වලට අදාළ සිසුන් 40,341 දෙනෙක් සඳහා වාරික 445,672 ක් වෙනුවෙන් රු.668,514 ,000 ක මුදලක් 2024 වර්ෂයේ ගෙවීම් කර ඇත.

ගෙවීම් ක්‍රියාවලිය

දිවයින පුරා විසිරී සිටින සහනාධාරලාභී පවුල්වල අ.පො.ස උසස් පෙළ හදාරන සියළුම සිසු දරු දැරියන්ට මසකට රු. 1,500/= බැගින් වසර දෙකක අධ්‍යයන කාලයක් සඳහා ශිෂ්‍යත්ව ලබා දේ.

වසම → කලාප කාර්යාලය (සමෘද්ධි ප්‍රජාමූල බැංකුව) → ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (සමෘද්ධි මූලස්ථානය) → දිස්ත්‍රික් ලේකම් කාර්යාලය → ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

ඒ අනුව වර්ෂය ආරම්භයේ දී ඊට අදාළ මුදල් ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අංශය මඟින් සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉල්ලුම් කරන ලද මුදල් නිදහස් කරනු ලැබේ. එම මුදල් උපයෝගී කර ගෙන ශිෂ්‍යත්ව සඳහා ගෙවීම් කල යුතුය.

වසම භාර සංවර්ධන නිලධාරියා විසින් නිසි ලෙස සම්පූර්ණ කරන ලද සිප්දොර ශිෂ්‍යත්ව අයදුම්පත්‍ර සමග අදාළ ලිපි ලේඛන කලාපභාර කළමනාකරු හෙවත් ප්‍රජාමූල බැංකු කළමනාකරු වෙත භාර දිය

යුතුය. ඔහුගේ නිර්දේශය සහිත එම අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කලමණාකරු වෙත භාර දිය යුතු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂයභාර නිලධාරි විසින්, සකස් කරන ලද ලේඛනය ප්‍රාදේශීය ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී විසින් වියදම් සහතික කිරීමෙන් පසු අදාළ ශිෂ්‍යත්වලාභීන්ට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හරහා ගෙවීම් සිදුකරනු ලැබේ.

මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව, අස්වැසුම නොලබන සමෘද්ධිලාභිව සිටි,අඩු ආදායම්ලාභීන්ට හා සමාජයේ අවාසිසහගත තත්ත්වයට පත් පුද්ගලයන්,කණ්ඩායම්,ආයතනයන් හි අවස්ථානුකූලව පැන නැගෙන විවිධ අවශ්‍යතාවයන් සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර දෙනු ලැබේ. සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මඟින් අනුමත කරනු ලබන වෙනත් අඩු ආදායම්ලාභීන් ඉලක්ක කරගත් ජීවනෝපාය හා අලෙවි සංවර්ධන සනීපාරක්ෂක වැසිකිලි ඉදිකිරීම් වැනි සමාජ සංවර්ධන ව්‍යාපෘතිද අවස්ථානුකූලව ක්‍රියාත්මක කරනු ලබයි.

(සංඛ්‍යා සටහන - IV)

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල

2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

කාර්ය සාධන ප්‍රකාශය

		මුදල රු.
ආදායම		
	ආයෝජන පොලී	1,552,658,284.46
	නිලාවේලි ආදායම්	5,662,916.51
	වෙනත් ලැබීම්	18,275.25
	මුළු ආදායම්	**1,558,339,476.22**
අඩුකලා		
වියදම්		මුදල රු.
	ප්‍රතිලාභී ගෙවීම් (සිප්දොර ශිෂ්‍යත්ව)	668,514,000.00
	නිලාවේලි මධ්‍යස්ථාන වියදම්	3,382,023.25
	පරිපාලන වියදම් (ප්‍රධාන කාර්යාල)	12,828,488.01
	පරිපාලන වියදම් (දිස්ත්‍රික් කාර්යාල)	13,217,653.63
	විශේෂ ව්‍යාපෘති	
	සනීපාරක්ෂක පහසුකම	500,000.00
	නව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන ව්‍යාපෘති	111,717,776.82
	මුළු වියදම	**810,159,941.71**
වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය		**748,179,534.51**

මූල්‍ය තත්ව ප්‍රකාශය

2024.12.31 දිනට

		මුදල රු.
සමුච්චිත අරමුදල		15,427,591,018.30
ජංගම නොවන වත්කම් (ශුද්ධ වටිනාකම)		164,676,907.34
ආයෝජන		**14,966,792,895.99**
කාරක ප්‍රග්ධනය		**296,121,214.97**

ජීවනෝපාය හා අලෙවි සංවර්ධන ව්‍යාපෘති

නව ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ තේ පැල තවාන් ව්‍යාපෘති, කුරුදු ආශ්‍රිත නිෂ්පාදන, කොහු කර්මාන්තය කුකුල් පාලන ව්‍යාපෘති නිමි අඳුම් නිෂ්පාදන, වැල්දොඩම් වගා ව්‍යාපෘති, බුලත් වගාව රට පුවක් වගාව, එළු පාලනය, බිම්මල් වගා ව්‍යාපෘති, කිරිගව පාලන ව්‍යාපෘති, දාස්මල් වගා ව්‍යාපෘති, මැනික් ගල් කැපීමේ හා ඔප දැමීමේ ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික්ක 20 ක ප්‍රතිලාභීන් 1,078 වෙනුවෙන් රු.111,717,776.82 ලබාදී ඇත.

(සංඛ්‍යා සටහන - V)

අනු අංකය	දිස්ත්‍රික්කය	ලබා දුන් මුදල (රු.)	ඉතිරි මුදල (රු.)	වියදම (රු.)
01	කොළඹ	9,187,910.00	398,531.54	8,789,378.46
02	ගම්පහ	12,611,850.00	-	12,611,850.00
03	කළුතර	10,268,274.50	611,521.00	9,656,753.50
04	මහනුවර	8,709,652.44	5,746,477.44	2,963,175.00
05	මාතලේ	5,342,019.03	417,588.83	4,924,430.20
06	නුවරඑළිය	648,320.00	-	648,320.00
07	ගාල්ල	8,707,748.00	998,858.31	7,708,889.69
08	මාතර	2,076,650.00	-	2,076,650.00
09	හම්බන්තොට	7,062,129.50	6.00	7,062,123.50
10	මුලතිව්	5,065,000.00	3,505,010.00	1,559,990.00
11	මඩකලපුව	2,279,250.00	-	2,279,250.00
12	අම්පාර	7,435,420.00	-	7,435,420.00
13	කුරුණෑගල	16,182,675.00	4,260,866.00	11,921,809.00
14	පුත්තලම	7,597,500.00	7,597,500.00	-
15	අනුරාධපුරය	12,941,075.00	1,279,369.50	11,661,705.50
16	පොළොන්නරුව	7,597,500.00	1,716,000.00	5,881,500.00
17	බදුල්ල	3,788,620.00	600.00	3,788,020.00
18	මොණරාගල	6,159,040.00	206,122.11	5,952,917.89
19	රත්නපුර	7,056,558.00	6,448,758.00	607,800.00
20	කෑගල්ල	8,216,696.25	4,028,902.17	4,187,794.08
එකතුව		**148,933,887.72**	**37,216,110.90**	**111,717,776.82**

2.1.7. සමෘද්ධි ක්ෂුද්‍රමූල්‍ය අංශය

හැඳින්වීම

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 1996 දී සමෘද්ධි බැංකු සංගම් ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගනුදෙනු අඩු කිරීමටත්, එමඟින් ඔවුන් ණය බරින් මුදවාලමින් ලාභදායී ආයතනික රටාවක් ඇතිකිරීමේ අරමුණින්, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය / මහා සංගමය, ප්‍රාදේශීය මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335 ක් හා කලාප මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097 ක් ක්‍රියාත්මක වේ.

2013 අංක 1 දරණ දිවිනැගුම පනතේ 33 (1), 33 (2), 33 (9) වගන්ති අනුව බැංකු හා බැංකු සමිති අධීක්ෂණය හා නියාමනය සඳහා සමාජිකයින් 8 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවා ඇත. එම කළමනාකරණ මණ්ඩලය විසින් බැංකු හා බැංකු සමිති වෙත කලින් කල විධාන නිකුත් කරනු ලබයි.

අරමුණු

1. බැංකු පද්ධතිය සඳහා නව ණය ක්‍රම හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මෙහෙයුම් නියෝග නිකුත් කිරීම.
2. අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන්නා වූ මඟ පෙන්වීම්, උපදෙස් නිකුත් කිරීම.
3. තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් නිකුත් කිරීම.
4. බැංකු අරමුදල් ආයෝජනය කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් උපදෙස් නිකුත් කිරීම.
5. ක්ෂුද්‍ර මූල්‍ය රක්ෂණ කටයුතු සිදු කිරීම.
6. සියළු බැංකුවල ජාතික මට්ටමින් විමර්ශණ කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
7. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අවසාන ගිණුම් සඳහා ලබාදෙන විගණන වාර්තා අනුව අවසන් ගිණුම් සහතික කිරීම හා ලාභ විසර්ජනය සඳහා නියෝග ලබාදීම.
8. බැංකු සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සැපයීම හා ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
9. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ඉඩම් පවරා ගැනීම/ මිලට ගැනීම් කටයුතු සහ බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අරමුදල් සැපයීම හා වත්කම් කළමනාකරණය.
10. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය රැස් කිරීමට සහාය වීම, කළමනාකරණ මණ්ඩලික පත්‍රිකා ඉදිරිපත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කිරීම.
11. සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අධීක්ෂණ, ප්‍රගති පාලනය, පසු විපරම් කිරීම.
12. සමෘද්ධි ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකු සමිති හරහා පිළිගත් ආයතන හා සංවිධාන මඟින් දියත් කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය කිරීම.
13. ජීවනෝපාය හා අලෙවි අංශ ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල නිර්මාණශීලී දායකත්වය ලබාදීමට කටයුතු කිරීම.

14. සමෘද්ධි පනත අනුව (34 වගන්තිය) ස්ථාපිත බැංකු මහා සංගමයේ කටයුතු සඳහා සහාය වීම.

15. සමෘද්ධි බැංකු, සමෘද්ධි බැංකු සමිති, මහා සංගමය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය පරිගණක ජාලගත කිරීමට සහාය වීම.

16. සමෘද්ධි බැංකුවල , සමෘද්ධි බැංකු සමිතිවල නිලධාරීන් හා ප්‍රජා නායකයින් පුහුණු කිරීමට පියවර ගැනීම.

17. දිළිඳු ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා අවශ්‍ය මූල්‍ය සහයෝගය ලබා දීමට වැඩසටහන් හඳුන්වා දීම.

බැංකු සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධන ප්‍රගතිය

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් රු.500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සාමාජිකත්වය හිමිවේ. ඒ තුළින් ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකත්ව ප්‍රගතිය - (2020-2024)
(සංඛ්‍යා සටහන - VI)

වර්ෂය	ගැහැණු	පිරිමි	එකතුව	පසුගිය වසරට සාපේක්ෂ වර්ධනය	වර්ධනය අනුපාතය %
2020	2,751,341	1,341,176	4,092,517	-220,501	-5.1
2021	2,791,244	1,300,942	4,092,186	-331	-0.008
2022	2,811,900	1,303,200	4,115,100	22,914	0.56
2023	2,854,351	1,312,790	4,167,141	52,041	1.25
2024	2,790,914	1,254,246	4,045,160	-121,981	-3.01

බැංකු තැන්පතු වැඩසටහන

තැන්පතු (සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා, සිසුරක, ධන ශක්ති)
(2020-2024)
(සංඛ්‍යා සටහන - VII)

වර්ෂය	ගිණුම් සංඛ්‍යාව	ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය	මුදල (රු.මි)	මුදලේ වර්ධනය (රු.මි)
2020	8,715,703	(177,213)	70,338.00	4,840.00
2021	8,538,191	(177,512)	72,835.00	2,497.00
2022	9,463,470	925,279	93,765.53	20,930.55
2023	7,531,371	1.932,099	75,508.55	-18,256.98
2024	6,751,107	-780,264	67,179.52	-8,329.03



ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන

- සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මඟින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට අවශ්‍ය මූල්‍යකරණ පහසුකම් සපයාදීම ප්‍රජාමූල බැංකු ණය ක්‍රමය යටතේ සිදුවේ.

- සාමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා ක්ෂණික මූල්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී දියත් කර ඇත.

- ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.25,000 සිට රු.2,000,000 දක්වා විවිධ ණය යෝජනා ක්‍රම යටතේ සමෘද්ධි බැංකු මඟින් ණය නිකුත් කෙරේ. ඒ අනුව ජීවනෝපාය සංවර්ධන, වගා, වෘත්තිය පුහුණු වැනි ක්ෂේත්‍රයන් සඳහා මෙන්ම ක්ෂණික ණය අවශ්‍යතා වෙනුවෙන් ද ණය නිකුත් කෙරේ.

- නිවාස, පාරිභෝගික, ආපදා වැනි අවශ්‍යතා වෙනුවෙන් බැංකු ණය පහසුකම් ක්‍රියාත්මක වේ. මේ සඳහා රු.25,000 සිට රු. 500,000 දක්වා උපරිම ණය නිකුත් කෙරේ.

- සමෘද්ධි බැංකු ණය වැඩසටහන මඟින් සාර්ථක වූ ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට රු. 2,000,000 සිට රු.5,000,000 දක්වා ණය සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති මඟින් "ඉසුර" සහ නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රමය යටතේ ණය නිකුත් කෙරේ.

- ක්ෂණික මූල්‍ය අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහනයෙන් මිදී ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති, සමෘද්ධි අරුණළු, සමෘද්ධි මිතුරු ණය යෝජනා ක්‍රම තුලින් සමාජිකයින් සඳහා සහනයක් දී ඇත.

- 2024 වසර අවසන් වන විටදී සාමාජිකයින් 12,608,212 ක් සඳහා රු.මි. 519,881.86 ක මුදලක් සමෘද්ධි බැංකු ණය ලෙස ලබා දී ඇත.

ණය නිකුත් කිරීම (2020 - 2024)

(සංඛ්‍යා සටහන - VIII)

වර්ෂය	සංඛ්‍යාව (සමුච්චිත)	සමුච්චිත මුදාහල ණය මුදල (රු.මි.)	වසර තුළ ණය නිකුත් කිරීම (රු.මි)
2020	11,790,396	357,496.70	39,581.44
2021	11,669,343	394,546.41	37,049.71
2022	11,959,271	424,906.65	30,360.24
2023	12,323,922	465,684.82	40,778.17
2024	12,608,212	519,881.86	54,194.04



ණය වර්ගීකරණය 2024.12.31 දිනට සමුච්චිත මුදාහල

(සංඛ්‍යා සටහන - IX)

	ණය වර්ගය	මුදල (රු.මි)
1	වගා	21,380.04
2	පාරිභෝගික	21,822.71
3	ස්වශක්ති	13,445.53
4	ආපදා	2,207.43
5	ජීවනෝපාය චක්‍රිය	13,453.86
6	ජීවනෝපාය සංවර්ධන	192,918.58
7	සමෘද්ධි සම්පත	76,357.27
8	හදිසි ව්‍යාපාරික ණය	2,002.16
9	දිවිනැගුම අරුණළු	5,616.51
10	රන් ප්‍රදීප	26.17
11	සේවක පාරිභෝගික ණය	2,164.62
12	සහන පියවර	5,320.02
13	සමෘද්ධි අභිමාන	734.00
14	උත්සව අත්තිකාරම් ණය	676.10

	ණය වර්ගය	මුදල (රු.මි)
15	නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය	3,407.50
16	සමෘද්ධි මිතුරු ණය	281.11
17	සමෘද්ධි සියපත ණය	238.21
18	තරුණ ව්‍යවසාය ණය	34226.66
19	සමෘද්ධි ලක්ජය ණය	4,023.07
20	සමෘද්ධි ලක් වාසනා ණය	1,560.64
21	සමෘද්ධි ලක්සර ණය	2,834.11
	එකතුව	404,696.30

ප්‍රස්ථාර සටහන III - ණය වර්ගීකරණය



ප්‍රජාමූල බැංකු අතිරික්ත අරමුදල් ආයෝජනය (ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්)

බැංකුවල වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව අතිරික්ත අරමුදල් ප්‍රජාමූල බැංකු සමිති හරහා භාණ්ඩාගාර චක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජනය කිරීමට අවසර ලබාදී ඇත. මේ මගින් ප්‍රජාමූල බැංකු සමිති මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමද අරමුණ වේ.

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල අතිරික්ත මුදල් ආයෝජනය කිරීම. (2020-2024)

(සංඛ්‍යා සටහන - X)

වර්ෂය	මුදල(රු.මි)	වර්ධනය(රු.මි)	වර්ධන ප්‍රතිශතය (%)
2020	89,314	(5859)	6.2%
2021	108,233	18,919	21.18%
2022	149,882	41,649	27.79%
2023	168,260	18,378	10.92%
2024	171,742	3,482	2.03%



ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුළින් ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහන්

2000 වසරේ සිට ස්වයං මූල්‍ය ඒකකයක් ලෙස අංශයේ උපයාගත් පොලී ආදායම් තුලින් විවිධ සංවර්ධන වැඩසටහන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ඔස්සේ අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සිදු කිරීම ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා අංශය තුළ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් පහත පරිදි වේ.

- **අලුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන**

බැංකු වලට ගොනු වී ඇති ගිණුම් හිමියන් සහ අනෙකුත් ජනතාව සඳහා සෑම වසරකම සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව සමෘද්ධි බැංකු මඟින් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් හා අලුත් අවුරුදු උත්සවයක් ජන ක්‍රීඩාවලට මුල් තැන දෙමින් සමෘද්ධි බැංකු 1,097 ක් පුරා එකම දිනයක් තුළ සාර්ථකව ක්‍රියාත්මක කර, සමෘද්ධි බැංකු නාමය හා සේවාවන් පිළිබඳ ජනතාව වෙත පණිවුඩයක් ගෙනයාමට කටයුතු කරන ලදී. එම කාලය තුළ තැන්පත් කරන මුදල් සඳහා ගනුදෙනුකරුවන්ට ප්‍රයෝජනවත් හා වටිනාකමකින් ඉහල තිළිණ ලබාදීම සිදු කරන ලදී. මේ තුලින් අදාළ කලාප තුළ ජනතාව ඒකරාශී වීමත් ප්‍රජාවගේ සංස්කෘතික හැඟීම් ඔප්නැංවීමටත් මෙය අවස්ථාවක් කර ගැනීමට හැකි විය. තවද, සමෘද්ධි බැංකු කටයුතු හා විශ්වාසය තහවුරු කර, අඩු ආදායම්ලාභීන් ඇතුළු ප්‍රජාව තුළ සමෘද්ධි බැංකුවෙහි නාමය ප්‍රචලිත කර, ඔවුන් ආර්ථික / සාමාජීය සවිබලගැන්වීමක් අපේක්ෂා කෙරේ.

- ''රන් ප්‍රදීප'' රන් උකස් ණය සේවාව

සමෘද්ධි බැංකු සාමාජිකයින් විසින් හදිසි මුදල් අවශ්‍යතාවය වෙනුවෙන් තමා සන්තයේ පවතින රන් භාණ්ඩ උකස් කර මුදල් ලබාගැනීමේදී ඇති වන දුෂ්කරතා මඟ හරවා සහන පොලී මත කඩිනමින් මුදල් අවශ්‍යතා සම්පුර්ණ කර ගැනීමට පහසුකම් සැලසීම සිදු වේ.

- **සමෘද්ධි ප්‍රජාමූල බැංකු ආශ්‍රිතව "අරුණළු ක්ෂණික ණය" වැඩසටහන**

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන මඟින් අරුණළු ක්ෂණික ණය වැඩ සටහන හඳුන්වා දීම. දිවයිනපුරා සියළුම ප්‍රජාමූල සංවිධාන හරහා සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් විසින් ඔවුන්ගේ හදිසි මුදල් අවශ්‍යතා වෙනුවෙන් අවිධිමත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන/ පුද්ගලයින් මඟින් ඉහල පොලි අනුපාතයක් හා විවිධ බැඳීම් මත ලබාගන්නා ණය සඳහා විකල්පයක් ලෙස, සහනදායි හා කෙටිකාලීන ණය මුදල් ලබා ගැනීමට පහසුකම් සැලසීම මෙමඟින් සිදුවේ.

- **පුහුණු කටයුතු**

ප්‍රජාමූල බැංකු ජාලයේ 1,097 ක හා ප්‍රජාමූල බැංකු සමිති 335 හි සේවය කරන කාර්ය මණ්ඩල සඳහා බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාළව පුහුණු කිරිම් ප්‍රජාමූල බැංකු අරමුදල් මඟින් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය සම්බන්ධීකරණය සිදුකරයි.

ගනුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායි සේවාවක් සැපයීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරීම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබද මූලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුටම ලබා දීමට කටයුතු කරයි. මෙයට අමතරව ප්‍රජාමූල බැංකු කටයුතු හා ප්‍රජාමූල බැංකු සමිතියේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු ප්‍රජාමූල බැංකු/ බැංකු සමිතියේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට කටයුතු කර ඇත.

- **කළමනාකරණ තොරතුරු ඒකකය**

1,097 ක් වූ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල තොරතුරු කළමනාකරණය සිදු කෙරෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කළමනාකරණ තොරුතුරු ඒකකය මඟිනි. ඒ අනුව සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක්ම මාසිකව තම බැංකු ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මඟින් තොරතුරු කළමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර, එම දත්ත සකස් කර සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පවතින තත්ත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු ඇගයීම් සිදු කිරීමට සැලසුම් කර ඇත. තවද පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතියෙහි තොරතුරු ක්ෂුද්‍රමූල්‍ය අංශය වෙත සම්ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මඟින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් ප්‍රජාමූල බැංකු පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම හා ඇගයීම් කාර්ය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. සමස්ත බැංකු පද්ධතිය තිරසාර මූල්‍ය ඒකක බවට පත්කිරීමේ අරමුණ ඇතිව මෙන්ම සේවක අභිප්‍රේරණය අපේක්ෂාවෙන් බැංකු ශ්‍රේණිගත කිරීම හා ඇගයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. එම වැඩසටහන සෑම වර්ෂයක් පාසාම වැඩිදියුණු කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2024 වර්ෂයේ ලබා කරගත් ප්‍රධාන ප්‍රතිඵලයන්

1. 2024 වර්ෂය තුළ පමණක් රු.මි. 54,197.04 ක ණය මුදල් ලබාදීමට හැකියාව ලැබීම.
2. සමෘද්ධි බැංකුවල ලාභදායි බැංකු ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව බැංකු 1,030 සිට 1,046 දක්වා වැඩිකර ගත හැකි වීම.
3. සමෘද්ධි බැංකුවල ලාභදායිත්වය රු.බිලියන 12.2 ක් දක්වා අඩු වී ඇත. (විගණනයට යටත්ව)
4. ප්‍රජාමූල සංවිධාන හරහා ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්ට "අරුණළු" ක්ෂණික ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදි.
5. අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා 3.6% ක පොලි ප්‍රතිශතයක් ලබාදිය හැකිවීම.
6. ප්‍රතිමූල්‍ය ණය වැඩසටහන නැවත හඳුන්වාදිය හැකිවීම
7. බැංකු අධීක්ෂණ ඒකකය නැවත ස්ථාපිත කල හැකිවීම.
8. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචිය අවසන් කිරීම.
9. සියළුම බැංකු සමිති පරිගණක ජාලගත කිරීම සිදු කිරීමට කටයුතු කිරීම.
10. බැංකු ඇගයීමේ ක්‍රමවේදයන් සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම.
11. සමෘද්ධි පනත අනුව ඉලක්ක ලබා දී ඒ අනුව නිලධාරීන් හා ප්‍රතිලාභීන් ඇගයීමට ලක් කිරීම.
12. ලක් ජය, ලක් වාසනා නමින් ණය වර්ග දෙකක් හඳුන්වා දීම.
13. ධනශක්ති, ධනයෝජන ගිණුම් හඳුන්වා දීම තුලින් ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම.
14. සමෘද්ධි බැංකුවල සාමාජික සංඛ්‍යාව 67,343 කින් වැඩි වී ඇති අතර, කොටස් මුදල් ප්‍රමාණය රු.මි. 2,763.50 කින් වැඩි වී ඇත.

2023 මැයි සිට සමෘද්ධි සහනාධාර වැඩසටහන ඉවත් කර අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමත් සමඟ අනෙකුත් රජයේ බැංකු මඟින් සහනාධාර මුදල් ගෙවීම ආරම්භ විය. සමෘද්ධි ප්‍රතිලාභීන් විශාල ප්‍රමාණයක් සහනාධාර වැඩසටහනින් ඉවත් වීමත් සමඟ ගිණුම් හිමියන් තම ගිණුම්වලින් මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කිරීම නිසා තැන්පත් මුදල්වල අඩු වීමක් සිදු වූ අතර, ඔවුන් සමෘද්ධි බැංකුව හා තිබූ සම්බන්ධතාවය සීඝ්‍රයෙන් අඩු විය. මෙම තත්ත්වය තුළ සමෘද්ධි බැංකු ජාලයට ඇති වූ අයහපත් තත්ත්වයෙන් මුදවා ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ක්ෂුද්‍ර මූල්‍ය ජාලය ස්වයං මූල්‍ය තත්ත්වයට ගෙන ඒම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීන්දු මත ඉදිරියේදී සමෘද්ධි බැංකු, තිරසාර මූල්‍ය බැංකු පද්ධතියක් දක්වා වර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

2.1.8. ජීවනෝපාය සංවර්ධන අංශය

ශ්‍රිලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ ජාතික මෙහෙවර සිය ප්‍රමුඛතම කාර්යය කරගත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රජාව පූර්ණ සවිබලකරණයට ලක් කිරීම සඳහා ආර්ථික, සාමාජීය, මානසික, දේශපාලනික, සංස්කෘතික, නෛතික හා පාරිසරික යන පවුල් පරාසය තුළ සිය ක්‍රියාකාරකම් පෙළගස්වා ඇත. ඒ වෙනුවෙන් දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය තුළ ආර්ථිකමය වශයෙන් සවිබලකරණය සඳහා ස්ථාපිතව ඇති ප්‍රධානතම අංශය වන්නේ ජීවනෝපාය සංවර්ධන අංශයයි.

ජීවනෝපාය සංවර්ධන අංශයේ මූලික වගකීම හා කාර්යභාරය වන්නේ සමෘද්ධි වැඩසටහන වටා ගොනුවී ඇති සමෘද්ධි, අස්වැසුම හා අඩු ආදායම්ලාභි පවුල් වල ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා දැනට ඔවුන් නියැලී සිටින , අළුතින් හඳුනාගත් ව්‍යාපෘති හඳුනා ගෙන ඒවා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය පහසුකම් සැපයීමයි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් 2024 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 21.7 ක සැලසුම් සකස් කර තිබුනි. මේ යටතේ දිවයිනේ සියළුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි සුදුසු ප්‍රතිලාභීන් නිශ්චිතවම හඳුනා ගෙන කෘෂි, සත්ත්ව පාලන, ධීවර , කුඩා හා ප්‍රාථමික කර්මාන්ත ව්‍යාපෘති සහ අගය එකතු කල නිෂ්පාදන යනාදි ක්ෂේත්‍රයන් යටතේ ව්‍යාපෘති හඳුනා ගන්නා ලදි.

එමෙන්ම ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර මත අස්වැසුම ප්‍රතිලාභී පවුල් වල ජීවන තත්ත්වය වැඩිදියුනු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත " ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය " මඟින් මූලික කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.

එම ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමේ දි පහත සඳහන් අරමුණු කිහිපයක් සාක්ෂාත් කර ගන්නා ලදි.

1. ප්‍රතිලාභී පවුලේ මාසික ආදායම රුපියල් 30,000/- ක් දක්වා ඉහල නැංවීම.
2. නිෂ්පාදනය සඳහා පවතින වෙළඳපල අවස්ථා පුළුල් කිරීම.
3. කෘෂි,සත්ව පාලන හා ධිවර ව්‍යාපෘති දිරිමත් කිරීම තුලින් ජාතික නිෂ්පාදනය ඉහල නැංවීම.
4. පරිසර හිතකාමී ජීවන රටාවන් තුලින් සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් බිහිකිරීම.

ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් පවුල් ඒකක පදනම් කර ගෙන සිදු කරන පවුල් සංවර්ධන සැලැස්ම තුලින් මතුවන ජීවනෝපාය අවස්ථාවලින් වඩාත් උචිත ව්‍යාපෘතිය හඳුනා ගැනීම සිදුකරන ලද අතර, ඒ අනුව වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති සමෘද්ධි කළමනාකරුගේ මඟ පෙන්වීමෙන් ව්‍යාපෘති වාර්තාව සකසා අදාළ රේඛීය ආයතන වල සහායද ඇතිව, ඉදිරි කටයුතු සඳහා සූදානම් කරනු ලැබීය.

ඒ අනුව 2024 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට අනුගත වෙමින් දිවයින පුරා සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 21.7 ක මුදලක් ව්‍යාපෘතීන් සඳහා යොදවන ලද අතර, මෙම වසරේ ඉලක්කගත ප්‍රතිලාභී සංඛ්‍යාව 217 කි. ජීවනෝපාය අංශය සඳහා වෙන්ව ඇති එම සීමිත ප්‍රතිපාදන සීමාව තුළ,ඒ ඒ දිස්ත්‍රික්ක තුළ පවතින ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව පාදක කර ගනිමින් ප්‍රතිපාදන වෙන්කර, වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ දී;

1. අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනාක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන දුප්පත් හා අන්ත දුප්පත් යන කාණ්ඩ දෙකට අයත් ප්‍රතිලාභී පවුලක සාමාජිකයකු වීම.
2. ව්‍යාපෘතිලාභියා ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට හැකි ඉහල ශක්‍යතාවයක් සහිත පුද්ගලයකු වීම.
3. කාන්තා මූලික ව්‍යවසායකයින් කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබා දීම.
4. ව්‍යාපෘතිලාභියා හෝ පවුලේ සාමාජිකයකු ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකයකු වීම.

ආදි කරුණු සලකා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදි.

පහත සඳහන් ව්‍යාපෘතීන් සඳහා අරමුදල් ලබාදී ඇති අතර, අදාළ ඉලක්කයන් සපුරා ඇත.

කෘෂි කර්මාන්තය පදනම් කරගත් භෝග නිෂ්පාදන

- ආරක්ෂිත ගෘහ තුළ භෝග වගාව
- පුරන්කුඹුරු අස්වැද්දීම
- අපනයන භෝග හා අතුරු භෝග ව්‍යාපෘතීන්
- ප්‍රදේශයට උචිත භෝග වගා ව්‍යාපෘතින්

2024.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය

(සංඛ්‍යා සටහන - XI)

ව්‍යාපෘති වර්ගය	නිම කරන ලද සංඛ්‍යාව	වියදම (රු.මි.)	ව්‍යාපෘති ගැන්වූ ප්‍රතිලාභීන් ගණන
කෘෂි ව්‍යාපෘති	58	5.00	58
ධීවර හා ජලජීවී ව්‍යාපෘති	49	3.96	49
ධීවර හා සත්ව පාලන ව්‍යාපෘති	47	3.95	47
ප්‍රාථමික හා සුළුකර්මාන්ත ව්‍යාපෘති	54	4.64	54
අගය එකතුකල නිෂ්පාදන ව්‍යාපෘති	67	3.95	67
එකතුව	**275**	**21.50**	**275**

2024 වසර සඳහා ජීවනෝපාය අංශය සඳහා වෙන්කල මූල්‍ය සීමාව තුළ ඉලක්ක පිරිසට වඩා වැඩි ප්‍රතිලාභීන් පිරිසක් සඳහා ප්‍රතිලාභ ලබා දීමට හැකිවිය.

සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන

සවිබලගැන්වීමේ කාර්යය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, 2016 වර්ෂයේ සිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාවට නංවන ලදි. මේ සඳහා තෝරා ගැනීමේදි සමෘද්ධි සහනාධාර ලැබූ ප්‍රතිලාභියකු වීම අනිවාර්යයෙන් සැලකූ අතර, දැනට අස්වැසුම ප්‍රතිලාභියකු විම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරන ලදි.

මෙම ව්‍යාපෘතින් සඳහා තෝරා ගන්නා ලද්දේ

- සමජාතීය නිෂ්පාදනයන් සිදු කරනු ලබන පවුල්
- අපනයන විභවයක් යෝ ආනයන ආදේශකයක් ලෙස සැලකිය හැකි නිෂ්පාදනයක් / කර්මාන්තයක් / සේවාවක් පවතින ගම්මාන
- වෙළඳපල ඉල්ලුමක් සහිත පාරම්පරික නිෂ්පාදන තුලින් ගොඩනැගිය හැකි ගම්මාන

2024 වසර තුළ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලයේ අනුමැතියනේ සමාජ ආරක්ෂණ අරමුදල් යොදා ගනිමින් දිස්ත්‍රික්ක 21 තුළ මෙම ආදර්ශ ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මේ වන විට ප්‍රතිලාභීන් 942 ක් සඳහා වියදම් කර ඇති මුදල රු.මි.110.8 කි.නිෂ්පාදන ආදර්ශ ගම්මානය ආරම්භ කිරීමෙන් පසුව, ව්‍යාපෘතිලාභීන්ට තම නිෂ්පාදන කටයුතු ස්වාධීනව අඛණ්ඩව කරගෙන යා හැකි ව්‍යාපෘතීන් සඳහා ප්‍රමුඛතාවයක් දී සලකන ලදි.

(සංඛ්‍යා සටහන - XII)

දිස්ත්‍රික් ගණන	ප්‍රා.ලේ. කොට්ඨාශ ගණන	වියදම (රු.මි.)	ප්‍රතිලාභීන් ගණන	ආදර්ශ ගම්මාන ගණන
13	38	89	942	40

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු බදු දේපල සඳහා බදු රැස් කිරීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු දේපල වලින් 2024 වසර තුළදි වාර්ෂික බදු ලෙස රු.මි. 3.6 ක් උපයා ගන්නා ලදී.

ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වන පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන

ආර්ථිකමය වශයෙන් පවුල් සවිබලගැන්වීමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරීමත් සමග ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය හා තාක්ෂණික සහාය මත "ආර්ථික සුරක්ෂිතතාව හා ජීවනෝපාය හදිසි ප්‍රතිසාධන ව්‍යාපෘතිය" නමින් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එම ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා දිස්ත්‍රික්ක 13 ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 64 ක් ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරි වසම් 400 ක ප්‍රතිලාභී පවුල් 12,800 ක් ඉලක්ක කර මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

එම ව්‍යාපෘතිය ලෝකයේ රටවල් 80 කට වැඩි ප්‍රමාණයක ක්‍රියාත්මක කර, සාර්ථක අත්දැකීම් ලබාගෙන ඇති උපාධි ප්‍රවේශය (Graduation Approach) ක්‍රමවේදය මත ක්‍රියාත්මක කිරීමට නියමිතය. එමඟින් පවුල් ඒකකවල ආර්ථික , මූල්‍ය , මනෝසමාජීය හා සමාජ ආරක්ෂණ යන ක්‍රමවේදය ඔස්සේ ප්‍රජා සවිබලගැන්වීම අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහන 2024 ජුනි මස සිට 2026 ජුනි දක්වා වසර දෙකක කාලයක දී ක්‍රියාත්මක වන අතර, ඒ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් 2024 තුළ ක්‍රියාත්මක කර ඇත.

1. සුදුසු ප්‍රතිලාභී පවුල් හඳුනා ගැනීම 60% මට්ටමක පවති. (පවුල් 12,800 හඳුනාගෙන අවසන්ව ඇත)
2. ජාතික මට්ටමින් සහාය සේවා ආයතන දැනුවත් කිරීම අවසන් කොට ඇත.
3. දිස්ත්‍රික් මට්ටමින් සහාය සේවා ආයතන දැනුවත් කොට අවසන් කොට ඇත.
4. ජාතික මට්ටමින් ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම අවසන් කොට ඇත.
5. ව්‍යාපෘතිය පිළිබඳව ව්‍යාපෘති කළමනාකරුවන් සහ මූලස්ථාන කළමනාකරුවන් දැනුවත් කිරීම අවසන්ව ඇත.

2.1.9 ව්‍යවසාය සංවර්ධන අංශය

අස්වැසුම හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමින් පවත්වා ගනිමින් ඔවුන්ගේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් දිස්ත්‍රික්ක 25 තුළ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

අරමුණ

අස්වැසුම ප්‍රතිලාභී හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ආදායම් මට්ටම ඉහළ නංවාලමින්, තිරසාරව එය පවත්වාගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම මූලික අරමුණ වේ. ව්‍යවසායකයින්ගේ දැනුම, කුසලතා වර්ධනය කිරීම, නිෂ්පාදන උසස් ප්‍රමිතියෙන් හා නිමාවකින් යුක්තව සිදු කිරීම, ස්ථාවර වෙළඳපොලක් ඇති කර ගැනීම, දීප ව්‍යාප්තව භාණ්ඩ විකිණීම හා ප්‍රචාරණය, තෘප්තිමත් පාරිභෝගික ප්‍රජාවක් ගොඩගැන්වීම, නිෂ්පාදනයට සාධාරණ මිලක් ලබා ගැනීම හා රැකියා අභිමුඛ විවිධ වෘත්තීය පුහුණු හා භාෂා පුහුණු වැඩසටහන් දියත් කිරීම, පරිසර හිතකාමී රැකියා අවස්ථා සුලභ කිරීම මඟින් ව්‍යවසායකයා ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබලගැන්වීම තුලින් ජාතික ආර්ථික වර්ධනයට සෘජුව දායක වීම.

2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්.

1. සමෘද්ධි කුඩා අලෙවි සැල් **(Mini Food City)** ජාලය ඇති කිරීම.
2. RPL ක්‍රමවේදය යටතේ NVQ සහතික ලබා දීම.
3. අස්වැසුම හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. සංචාරක ක්ෂේත්‍රයේ පුහුණුව ලබා දීම තුළින් රැකියාගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
5. ආධුනික වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. වස විස රහිත ආහාර නිෂ්පාදන සැකසීම පිළිබඳ කාන්තාවන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. සම්පත් සිතියම්ගත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
9. සුව බොජුන්හල් පවතින ඉඩම් පවරාගැනීම මිනුම් කටයුතු සඳහා සහය ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

සමස්ත ප්‍රගතිය පිළිබඳ සාරාංශය.

සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සඳහා 2024 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.11.70 වන අතර 2024.12.31 දින වන විට රු.මි.9.41 මුදලක් වැය කරමින් 83.9% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

මීට අමතරව භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා නොකර වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා ඒකාබද්ධ වී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ජපන් භාෂා පුහුණු වැඩසටහන

අස්වැසුම, සමෘද්ධි හා අඩු ආදායම් ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා ජපන් භාෂාව පිළිබඳව ප්‍රවීණත්වය ලබා දීමේ වැඩසටහන ශ්‍රී ලංකා විදේශ සේවා කාර්යාංශය හා සමාජ සේවා දෙපාර්තමේන්තුව ඒකාබද්ධ වී ක්‍රියාත්මක කරන ලදී. මධ්‍යස්ථාන 24 කදී ජපන් භාෂා පාඨමාලාව ක්‍රියාත්මක කරන ලදී. මාසික ආදර්ශ විභාග හා ජාත්‍යන්තර විභාග සඳහා පෙනී සිටීමේ අවස්ථාව සලසා දෙන ලදී. 2024 වර්ෂයේදී තරුණ තරුණියන් 204 ක් එම විභාගය සමත් වී ඉන් ජපානයේ රැකියා සඳහා 15 දෙනෙකු විදේශ ගත වී ඇත.

සංචාරක හා හෝටල් පුහුණුව ලබා දීමේ වැඩසටහන

අස්වැසුම හා අඩු ආදායම්ලාභී පවුල් වල තරුණ තරුණියන්ට සංචාරක හා හෝටල් කේෂ්ත්‍රයේ පුහුණුව ලබා දී නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් 60 ක් හා රත්නපුර දිස්ත්‍රික්කයෙන් 150 දෙනෙකු රැකියාගත කර ඇත.

සුරක්ෂිත සංක්‍රමණය හා මිනිස් වෙළදාමට එරෙහිව සමෘද්ධි නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන (TOT) SAFE FOUNDATION ආයතනයේ මූල්‍ය හා තාක්ෂණ අනුග්‍රහයෙන් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිංහල හා දෙමළ මාධ්‍ය වලින් ඉහත වැඩසටහන් පවත්වන ලදි.

කාර්ගිල්ස් ආයතනයේ හා PIZZA HUT අවන්හල් ජාලයේ රැකියාවන් සඳහා තරුණ තරුණියන් යොමු කිරීම.

ව්‍යවසාය සංවර්ධන අංශයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

(සංඛ්‍යා සටහන - XIII)

වැඩසටහන	වෙන් කල මුදල (රු.මි)	වියදම	ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රතිලාභ සංඛ්‍යාව
Mini Food city ජාලය ඇතිකිරීම	1.20	1.02	23	
RPL ක්‍රමවේදය යටතේ NVQ සහතිකය ලබාදීම	2.00	1.80	19	174
අස්වැසුම හා අඩුආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන	2.00	1.97	25	13,324
ආධුනික වෘත්තීය පුහුණු සම්බන්ධ වැඩසටහන	4.00	2.69	24	253
ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	2.00	1.90	25	4,415
වස විස රහිත ආහාර නිෂ්පාදන සැකසීම පිළිබඳ කාන්තාවන් පුහුණු කිරීමේ වැඩසටහන	0.10	0.025	01	06
සම්පත් සිතියම් ගත කිරීමේ වැඩසටහන	0.20	0.01	15	15
සුවබොජුන් හල් පවත්වාගෙන යන ඉඩම් පවරා ගැනීමේ මිනුම් කටයුතු සඳහා සහය ලබා දීමේ වැඩසටහන	0.20	0.022	01	
එකතුව	**11.70**	**9.437**	**133**	**18,187**

2.1.10. සමාජ සංවර්ධන හා පරිසර අංශය

සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩු ආදායම්ලාභී පවුල් හා අවාසි සහගත තත්ත්වයන්ට පත්ව ඇති පවුල්, සංස්කෘතික, කායික, මානසික, පාරිසරික, අධ්‍යාත්මික හා ආර්ථිකමය වශයෙන් සවිබලගැන් වූ සතුටු පවුලක් ගොඩනැගීම.

ආගමික, සංස්කෘතික, දේශපාලනික වශයෙන් පෙර නොවූ අයුරින් විෂම වූ සමාජයක් වර්තමාන කාලය තුළ දී පිළිඹිබු වේ. එයට ප්‍රධාන වශයෙන් මුළු මහත් ලොව තුළ පැවති වසංගත තත්ත්වයන්, යුධ හා දේශපාලනික තත්ත්වයන් හා ස්වාභාවික විපත් හේතුවෙන් මිනිසුන්ගේ මූලික අවශ්‍යතා වෙනුවෙන් විශාල මුදලක් යෙදවීමට පෞද්ගලිකව ජනතාවට සිදුවීම එයට ප්‍රධාන හේතුව බව කිව හැකිය. මෙහිදී පොදු වශයෙන් සියළු ලෝවාසීන්ට මෙම අයහපත් තත්ත්වයන් සිදුවීම මත අන්‍යෝන්‍ය උදව් උපකාර, විශ්වාසය, ආදරය යන පොදු ගුණාංග ද සමාජයෙන් සීග්‍රයෙන් අතරුදහන් වෙමින් පවතී.

මෙවන් වකවානුවක සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන හා පරිසර අංශයට මෙම කණගාටුදායක තත්වයෙන් ජනතාව මුදා ගැනීම සඳහා රාජකාරී වශයෙන් මෙන්ම මානුෂීය වශයෙන් ද විශාල කාර්යභාරයක් පැවරී ඇත. ශ්‍රී ලාංකීය ජනතාව මෙන්ම විදේශ රටවලින් පැමිණෙන විදේශිකයන් ද අප දේශයේ අනන්‍යතාවය, සංස්කෘතිය පිළිබඳව විමසිල්ලෙන් පසුවන බැවින් ඔවුනට සුවදායී හා ආරක්ෂාකාරී පරිසරයක් ගොඩනැගීමට අප රට තුළ ජනතාවගේ මානසික මට්ටම හොඳින් පවත්වා ගැනීම සඳහා විවිධ වූ කායික, මානසික, අධ්‍යාත්මික හා ආර්ථික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. තව ද ලංකාවේ පවත්නා මෙම ආගන්තුක සත්කාර හා අන්‍යෝන්‍ය වශයෙන් පවත්නා උදව් උපකාර සමග පවත්නා බැඳීම් සඳහා විශාල ගෞරවයක් ලබා දෙන අතර ඔවුනගේ ප්‍රධාන ගමනාන්තයක් ලෙස අප රට තෝරාගෙන පැමිණීමට ද හේතු වී තිබේ. මේ ඔස්සේ රටට විශාල

විදේශ විනිමයක් ලැබෙන අතර එය අප ප්‍රජාවගේ ආර්ථික සවිබල ගැන්වීමටද ශක්තියක් වනු ඇත. එමෙන්ම ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීම මෙන්ම සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩු ආදායම්ලාභී පවුල් හා අවාසි සහගත තත්ත්වයන්ට පත්ව ඇති පවුල්, සංස්කෘතික, කායික, මානසික, පාරිසරික, අධ්‍යාත්මික වශයෙන් ද සවිබලගන්වා මේ සඳහා පෙරටුව කටයුතු කිරීමට නිර්මාණාත්මක වැඩසටහන් දියත් කිරීමට ද වරින් වර කටයුතු සිදු කරමින් පවතී.

එමෙන්ම මුළු මහත් ජනතාව වෙනුවෙන් මෙම අංශයෙන් ජනතාව සහභාගී කර ගනිමින් විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහි දී මත් නිවාරණයට ප්‍රධාන තැනක් හිමිව ඇත. මැයි 31 ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනයට සමගාමීව කොඩි අලෙවි වැඩසටහන පවත්වන අතර එමඟින් විශාල අරමුදලක් ඇති කර එමඟින් මෙම විශේෂ වැඩසටහන් සඳහා එම අරමුදල භාවිතා කරමින් සාර්ථක වැඩසටහන් විශාල ප්‍රමාණයක් සිදු කරයි. 2024 වසරේ සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි පවත්වනු ලැබූ කොඩි අලෙවි වැඩසටහනේ මුළු ආදායම රු. 169,526,021.96 වේ.

❖ **මෙම කොඩි අරමුදල භාණ්ඩාගාර අරමුදල් නොවන බැවින් ඒ යටතේ සිදුකරනු ලබන පහත සඳහන් සියළු වැඩසටහන් සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු මෙහි දී සිදු කර ඇත.**

1. මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය පිළිබඳ වැඩසටහන්
2. සමෘද්ධි කැකුළු ළමා සමාජ වැඩසටහන්
3. ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව සමෘද්ධි වැඩසටහන්
4. නිපුණතා සංවර්ධණ පුහුණු වැඩසටහන්
5. ගෘහ කළමනාකරණ හ සතුටු පවුල් වැඩසටහන්
6. ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන හා මානසික සංවර්ධන වැඩසටහන්
7. ප්‍රගති සමාලෝචන වැඩමුළු
8. වෙනත්

ඉහත වැඩසටහන් සඳහා මූලික තැනක් ලබා දී ඇත. **තව ද භාණ්ඩාගාර අරමුදල් යටතේ වන වියදම් ළමා හා මත් නිවාරණ වැඩසටහන් සඳහා ද,** ජාතික සමාජ සංවර්ධන අරමුදල් ළමා සමාජ දිස්ත්‍රික් උත්සව සඳහා යොදවා ඇත. තව ද ප්‍රගති සමාලෝචන වැඩසටහන් සඳහා ද මෙම අරමුදල් යොදවා ගනිමින් නිලධාරින්ගේ මානසික අභිප්‍රේරණය ඇති කර මෙම වැඩසටහනට අදාළ ආකල්ප සංවර්ධනය කරගනිමින් සාර්ථක යෝජනා අදහස් මඟින් තවදුරටත් වැඩසටහන් සාර්ථකව පවත්වා ගැනීමටත් සමස්ථ දිවයිනම ආවරණය කරනු ලබන නිලධාරින් එකම අරමුණක පිහිටා කටයුතු කිරීමට පෙළඹවීමට හැකි වනු ඇත. තව ද ශක්තිමත් පෞරුෂ වර්ධනයක් වෙනුවෙන් මෙම වැඩසටහන් පිටිවහලක් වනු ඇත.

තව ද සමාජ සංවර්ධන හා පරිසර අංශය මඟින් පරිසර වැඩසටහනක් ද පවත්වාගෙන යනු ලබන අතර, (උදා: රුක්රෝපණ හා පාරිසරික ශ්‍රමදාන) ලෙස ද, සමුද්‍රීය ආරක්ෂණ අධිකාරිය හා සමාජ සංවර්ධන හා පරිසර අංශය ඒකාබද්ධව වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් එනම් සමුද්‍රීය පරිසර ආරක්ෂණ වැඩසටහනක් ද මේ අතර සාර්ථකව ක්‍රියාත්මක කරයි. මේ සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් යොදා ගනිමින් ඔවුනගේ ආර්ථික වර්ධනය උදෙසා රුපියල් දසදහසක දීමනාවක් ද ලබා දෙමින් ඔවුනට සවියක් වන්නාසේම සමුද්‍රීය පරිසරය පිරිසිදු කරමින් ආරක්ෂා කර ගැනීම සිදුවේ.

❖ **ආදරණීය තාත්තා වැඩසටහන**

මෙම වැඩසටහන ජාත්‍යන්තර රොටරි සමාජය හා ජාත්‍යන්තර කාන්තා සංවිධානය සමග සමෘද්ධි සමාජ සංවර්ධන හා පරිසර අංශය ඒකාබද්ධව සිදු කිරීමට මූලික කටයුතු ආරම්භ කර තිබේ.

මේ ඔස්සේ පවුලේ ගෘහමූලිකයා යන්න හැඳින්වුව ද පවුලේ වගකීම් වලින් හා සමාජ ගතවීම් වලින් ඈත්වන්නට දරන උත්සාහයන් වලක්වාලමින් පියවරුන් සංවිධානගත කොට ඔවුනගේ මානසික හා නිර්මාණාත්මක හැකියා ඉදිරියට ගෙනයාමටත් පවුල සමග පවත්නා බැඳීම් ශක්තිමත්ව ගොඩනංවා පවත්වාගෙන යාමටත් අවශ්‍ය දැනුම හා මගපෙන්වීම් ලබා දීමට අපේක්ෂිතය.

මෙහි දී මූලික ලෙස නියමු ව්‍යාපෘතිය කොළඹ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කර ඇති අතර මේ තුලින් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 හි සියළුම නිළධාරින් ඇනුවත් කර ඇත. ඒ හරහා ඉදිරියේ කොට්ඨාශ මට්ටමින් පියවරුන් දැනුවත් කිරීමට අපේක්ෂා කෙරේ.

- ❖ **මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය පිළිබඳ වැඩසටහන්**

සමස්ත ප්‍රජාවගෙන් ඉතාමත් ඉක්මනින් පොළඹවා ගත හැකි ඉතා අන්තරායකාරී දෙයක් වන මත්ද්‍රව්‍ය ඉතා විශාල වශයෙන් ප්‍රචලිත වී ඇති වර්තමාන කාලයේදී රෝහල් සිරගෙවල් මෙම මත් භාවිතා කරන්නන්ගෙන් පිරී ඇත. ළමුන් තරුණ තරුණයන් වැඩිහිටියන් නිරන්තරයෙන් මෙම මත් භාවිතය හේතුවෙන් විවිධ වූ කරදරයන්ට රෝගී තත්ත්වයන්ට පත්ව තම ජීවිතයේ අඳුරු කරගන්නා අවස්ථා සහ පවුල් ඒකක වශයෙන් විවිධ වූ අන්තරායකාරී තත්ත්වයන්ට ගොදුරු වී ළමුන්ට දෙමාපියන් දෙමාපියන්ට දරුවන් අහිමිවී විසිරි පවුල් ඇතිවී කාන්තා, ළමා අපචාර, සියදිවි නසා ගැනීම්, සමාජ රෝග වැනි විවිධ කම්කටොළු වලින් ගමේත් නගරයේත් සමස්ත රටෙහි ආර්ථිකය සමාජය, සංස්කෘතිය, අධ්‍යාත්මය, තම තමන්ගේ ආගම් පවා පරිහානියට පත්වීමට පටන්ගෙන ඇත. එබැවින් මෙම මහත් වූ ව්‍යසනය තුරන් කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ මඟපෙන්වීමත්, සමාජ සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ සඳහා සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි වැඩසටහන් නිර්මාණය කර ඉදිරිපත් කිරීමට සමාජ සංවර්ධන නිලධාරින් සමාජ සංවර්ධන අංශයේ මගපෙන්වීම යටතේ සිදු කරනු ලබයි. සමාජ සංවර්ධන සහකාරවරුන් විසින් මේ සඳහා මෙහෙයවීම සිදුකරනු ඇත. තව ද ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව මැයි 31 දිනය මත් හා දුම්වැටි නිවාරණ කොඩි වැඩසටහනක් ද පවත්වා එමඟින් ලැබෙන අරමුදලින් ප්‍රජාමූල සංවිධාන හා එක්ව විවිධ වූ සවිබලගැන්වීම් සඳහා මගපෙන්වීම් හා මත් නිවාරණය කිරීම පිළිබඳව දැනුවත් කිරීම් හරහා ප්‍රජාවගේ සුබසිද්ධීන් සඳහා කටයුතු කරනු ලබයි.

- ❖ **සමෘද්ධි කැකුළු ළමා සමාජ වැඩසටහන**

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ දරුවන් මෙන්ම අඩු ආදායම්ලාභී සියලු ජනතාවගේ දරුවන්ගේ කායික මානසික අධ්‍යාත්මික හා සංස්කෘතික ආකල්ප සංවර්ධනය කර පාරිසරික වශයෙන් අවබෝධය ලබා දෙමින් සෞඛ්‍ය සම්පන්න සාමකාමී අධිෂ්ඨානශීලී නායකත්වයෙන් හෙබි දරු පරපුරක් සමාජයට දායාද කිරීම මෙන්ම ඉවසීම ආදරය කරුණාව පිරි අභියෝග සඳහා විශ්වාසවන්තව මුහුණ දීම ප්‍රගුණ කළ දරු පරපුරක් බිහිකිරීම උදෙසා ළමා සමාජ වැඩසටහන ආරම්භ කර ඇත. මෙහිදී එම දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා ආර්ථික වශයෙන් ද සවිමත් දරු පරපුරක් උදෙසා ළමා ගිණුම් විවෘත කිරීම හා පවත්වා ගෙන යාම සඳහා දෙමාපියන් ද පොළඹවා ගනිමින් නොයෙකුත් අධ්‍යාපන ක්‍රම තුළින් යහපත් සමාජයක් බිහි කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. තරඟකාරී අවස්ථා ඇතිවෙන ජීවිතය තුළ, ජය පරාජය සඳහා මුහුණ දීමට හැකිවන පරිදි මනස දියුණු වූ නිර්මාණශීලී හැකියාවන්ගෙන් හෙබි දරු පරපුරක් මෙහි බිහිකිරීමට මෙම වැඩසටහන මහෝපකාරී වේ.

- ❖ **ගෘහ කළමනාකරණ හා සතුටු පවුල් වැඩසටහන**

මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය මඟින් පවුල් සවිබලගන්වා ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කර අධ්‍යාත්මික හා මානසික වශයෙන් යහපත් පුරවැසියෙක් බිහිකිරීම, ගෘහය තුළ වෙසෙන මවගේ කාන්තාවගේ මානසික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මඟ පෙන්වීම් මෙන්ම එදිනෙදා එම කාලය

තුළ කළ යුතු වැඩ නොපමාව කිරීම සඳහා පිරිසිදුව හා අනලස්ව තම නිවසේ කටයුතු කිරීමට ගෘහණිය දිරිගැන්වීම පුහුණු කිරීම හා දැනුවත් කිරීම මෙන්ම කාලය කළමනාකරණය කර කටයුතු කිරීමටත්, මවගේ සහෝදරියගේ නායකත්වය ලබාදීම තුළින් දරුවන්ට සැමියාට සහෝදරයන්ට සහෝදරියන්ට ආදරය කරුණාව දැක්වීම තුළින් හා බිරිඳ සැමියාටත් සැමියා බිරිඳටත් දරුවන් දෙමාපියන්ටත් දෙමාපියන් දරුවන්ටත් ආදරය කරුණාව ගෞරවය දැක්වීමට අනුබල දීම, පුහුණු කිරීම, දැනුවත් කිරීම මඟින් සතුටු පවුල බිහි කිරීම මඟින් විසිරි පවුල් දික්කසාද ළමා හා කාන්තා තරුණ අපචාර වළක්වා ගත හැකි අතර වැඩිහිටියන්ට ගෞරවය කරන ඔවුන්ගේ ආරක්ෂාව සඳහා කටයුතු කරන යහපත් සතුටු පවුලක් ඇති කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වේ.

ජාත්‍යන්තර දින වැඩසටහන්

❖ **ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන මාර්තු 08**

මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන යටතේ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා විවිධ වූ වැඩසටහන් පවත්වනු ලබයි. මෙහිදී සමාජීය, සංස්කෘතික, අධ්‍යාත්මික මෙන්ම ආර්ථික වශයෙන්ද ඔවුන් සවිබලගැන්වීමටත්, ආකල්ප සංවර්ධනය, නීතිය, අධ්‍යාත්මික ගුණගරුක බව, ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලෙන් ගලවා ගැනීම යනාදිය පිළිබඳව කාන්තාව දැනුවත් කිරීම, පවුල් උපදේශන සේවාවන් ලබාදීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක වේ.

❖ **ජාත්‍යන්තර සාක්ෂරතා දින වැඩසටහන සැප්තැම්බර් 08**

පාසල් යන වයසේ එහෙත් පාසල් නොයන දරුවන් පිළිබඳව සොයාබලා ඔවුන් පාසල් ගතකර නොවිධිමත් අධ්‍යාපන ක්‍රම තුළින් අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය වැඩසටහන දියත් කර ඇත. එමෙන්ම සාක්ෂරතාවයෙන් අඩු වැඩිහිටියන්ට පවා මෙම වැඩසටහන් තුළින් සාක්ෂරතාවය වැඩි කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දේ. එමෙන්ම එම දරුවන් සඳහා අවශ්‍ය පාසල් උපකරණ අභ්‍යාස පොත් ආදී පාසල් අවශ්‍යතා සපුරාලීම වේ. මේ සඳහා පරිත්‍යාගශීලීන්ද නොපැකිලිව තම දායකත්වය ලබා දෙන බවද කිව යුතුවේ. කලාප අධ්‍යාපන කාර්යාලයන් හි මේ සඳහා ආරම්භ කර ඇති නොවිදිමත් අධ්‍යාපන ඒකක සමග සම්බන්ධවී මෙම පාසල් ගත කිරීම් සිදු කිරීම මඟින් සෑම දරුවකුටම එම අධ්‍යාපන අවස්ථාව හිමිකර දීම වැනි වැඩසටහන් සමාජ සංවර්ධන අංශය ක්‍රියාත්මක කර ඇත.

❖ **දිළිඳුකම පිටු දැකීමේ දින වැඩසටහන ඔක්තෝබර් 17**

විශේෂයෙන් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් හට 5 වසර ශිෂ්‍යත්වයට මුහුණ දීමේ දී පෞද්ගලික උපකාරක පන්ති වලට සහභාගිවීමට නොහැකි තත්ත්වයන් මත එම දරුවන් සඳහා අය කිරීමකින් තොරව ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන් පැවැත්වීම හා ඔවුන්ගේ මානසික සංවර්ධනය ඇති කිරීම සඳහා වූ වැඩසටහන් පැවැත්වේ. මෙහිදී පාසල් ගුරුවරුන් මෙන්ම පෞද්ගලික පන්ති පවත්වනු ලබන ප්‍රවීන ගුරුවරුන් විසින් තම ස්වකැමැත්තෙන් නොමිලේ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහනට දායකත්වය ලබා දේ.

❖ **ලෝක ළමා දින වැඩසටහන ඔක්තෝබර් 01**

මේ සඳහා මල් වැනි වූ සියලු දරුවන්ගේ යහපත් උදෙසා හා ඔවුන්ගේ ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳව වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරීම මෙන්ම දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් දියත් කරනු ලබයි. පෙර පාසල් දරුවන් සඳහා පෝෂණ වැඩසටහන් චිත්‍ර තරඟ, සංස්කෘතික තරඟ හා ඒ සඳහා දැනුවත් කිරීම මෙන්ම පාසල් ළමුන් සඳහා විශේෂයෙන් වූ ළමා කුසලතා ඔප්නැංවිය හැකි විවිධ වැඩසටහන් නිර්මාණය කර ඉදිරිපත් කරනු ලබයි එහිදී තම ආරක්ෂාව හා සෞඛ්‍යය නිසි ලෙස පවත්වා ගනිමින්

ඉදිරි අනාගතය ආරක්ෂාකාරීව, සුරක්ෂිතව, දිරිමත්ව ඉදිරියට ගෙනයාම සඳහා ආකල්ප සංවර්ධනය, දැනුම වැඩි කර ගැනීම, කුසලතා ඇති කර ගැනීම තුළින් රටට වැඩදායී පුද්ගලයෙකු ලෙස ජීවත් වීමට ඇති අවස්ථාව අවකාශය පෙන්වාදීම මෙම වැඩසටහනේ අරමුණ වේ.

❖ **වැඩිහිටි දින වැඩසටහන ඔක්තෝබර් 01**

කාන්සිය, තනිකම සමග ජීවත්වන වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් ඔවුනගේ ජීවන රටාව සතුටින් ගෙවීමට ඇති අවස්ථා හඳුන්වා දෙමින් ඔවුන් සඳහා ද සෞඛ්‍ය වැඩසටහන් හා රසාස්වාදන වැඩසටහන් පවත්වා ඔවුන් සමාජයට ආදර්ශමත් පුද්ගලයින් ලෙස දිරිගන්වා සතුටින් තබා ගනිමින් ධනාත්මක, සතුට පිරුණු සමාජයක් බිහි කිරීමට ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමත්, පවුලේ වැඩිහිටියන් තම පවුලේ කටයුතු වෙනුවෙන් සහභාගි කර ගනිමින් සතුටින් ජීවත්වීමට සුදුසු පරිසරයක් ගොඩනැංවීමට උපකාරී වන ආකල්ප ගොඩනැගීමේ වැඩසටහන් දියත් කිරීමත් මෙම වැඩසටහනෙහි අරමුණ වේ.

භාණ්ඩාගාර නොවන අරමුදල් මත සමාජ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය - 2024.12.31 දිනට

(සංඛ්‍යා සටහන - XIV)

ඇමුණුම 02

අනු අංකය	දිස්ත්‍රික්කය	1				2				3			
		වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.
			ගැ	පි			ගැ	පි			ගැ	පි	
1	කොළඹ	14	522	80	0	9	857	672	3.627	0	0	0	0
2	ගම්පහ	82	2573	1258	1.126	114	4488	2113	1.51	247	11306	2912	0.44
3	කළුතර	0	0	0	0	0	0	0	0	0	0	0	0
4	මහනුවර	95	1473	792	0	68	1711	1600	5.55	60	1050	641	0.085
5	මාතලේ	11	213	442	0.029	15	223	182	0.013	4	61	95	0.0025
6	නුවරඑළිය	4	85	63	0.015	2	54	31	0.0237	0	0	0	0
7	ගාල්ල	30	891	430	0.122	49	1182	577	0.3613	0	0	0	0
8	මාතර	9	295	171	0.08	9	217	73	0.0076	6	172	46	0.0066
9	හම්බන්තොට	30	697	273	0.006	31	472	191	0.0023	4	98	42	0
2	යාපනය	0	0	0	0	0	0	0	0	0	0	0	0
11	මන්නාරම	0	0	0	0	0	0	0	0	0	0	0	0
6	වව්නියාව	0	0	0	0	1	75	69	0.0197	9	200	52	0.0415
1	මුලතිව්												
14	කිලිනොච්චිය	0	0	0	0	0	0	0	0	12	270	210	0.0745
4	මඩකලපුව	14	347	189	0.00	0	0	0	0	1	22	14	0
16	අම්පාර	351	6182	4461	0.034	98	2689	1875	0.262	76	3353	2720	0.668
17	ත්‍රිකුණාමලය	37	660	579	0	4	45	50	0	1	7	5	0
18	කුරුණෑගල												
19	පුත්තලම	22	554	171	0.04	73	1320	758	0.49	20	1010	165	0.07
20	අනුරාධපුරය												
21	පොළොන්නරුව	12	218	116	0	12	182	139	0	3	82	38	0.04
22	බදුල්ල	61	1795	570	0.004	35	803	492	0.009	58	761	415	0.119
23	මොණරාගල	0	0	0	0	0	0	0	0	0	0	0	0
24	රත්නපුරය	31	1216	735	0.197	60	2851	2189	0.147	9	476	162	
25	කෑගල්ල	3	100	62		11	424	222					
මුළු	මෙම මස	806	17821	10392	1.842	591	17593	11233	12.023	510	18868	7517	1.5471
	11.30 ට සමුච්චිත	4500	110403	67473	28.53	13134	76335	47176	9.9738	4255	117861	60497	16.547
	12.31 ට	5306	128224	77865	30.37	13725	93928	58409	21.996	4765	136729	68014	18.094

අනු අංකය	දිස්ත්‍රික්කය	4				5				6			
		වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.
			ගැ	පි			ගැ	පි			ගැ	පි	
1	කොළඹ	0	0	0	0	1	90	60	0.07	0	0	0	0
2	ගම්පහ	25	276	62	0.092	86	807	104	0.69	9	253	181	0.29
3	කළුතර	0	0	0	0	0	0	0	0	0	0	0	0
4	මහනුවර	15	215	105	0.11	37	629	243	0.025	10	503	325	0
5	මාතලේ	1	113	20	0.0084	2	40	165	0.005	1	20	13	0.0125
6	නුවරඑළිය	2	53	27	0.0107	9	91	64	0.002	4	46	49	0.02
7	ගාල්ල	0	0	0	0	12	549	112	0.051	0	0	0	0
8	මාතර	0	0	0	0	6	50	40	0		70	43	0.014
9	හම්බන්තොට	2	62	7	0.008	19	424	187	0.021	3	269	122	0.08
2	යාපනය	0	0	0	0	0	0	0	0	0	0	0	0
11	මන්නාරම	0	0	0	0	0	0	0	0	0	0	0	0
6	වව්නියාව	0	0	0	0	0	0	0	0	0	0	0	0
1	මුලතිව්												
14	කිලිනොච්චිය	0	0	0	0	0	0	0	0	0	0	0	0
4	මඩකලපුව	0				2	47	1	0	0	0	0	0
16	අම්පාර	155	2207	1869	0	37	593	322	0.14	4	45	110	0.0125
17	ත්‍රිකුණාමලය	1	159	183		1	65	41	0	3	0	27	0
18	කුරුණෑගල												
19	පුත්තලම	15	363	37	0.01	28	715	181	0.1	4	177	68	0.11
20	අනුරාධපුරය												
21	පොළොන්නරුව	2	20	12	0	1	0	10	0	0	0	0	0
22	බදුල්ල	4	3	6	0	25	450	122	0.177	1	18	7	0
23	මොණරාගල	0	0	0	0	0	0	0	0	0	0	0	0
24	රත්නපුරය					4	148	117	0.003				
25	කෑගල්ල					5	180	82					
මුළු	මෙම මස	222	3471	2328	0.2391	275	4878	1851	1.284	39	1401	945	0.648
	11.30 ට සමුච්චිත	1024	17303	12342	1.7989	1398	31369	14288	3.237	439	9035	57399	27.025
	12.31 ට	1246	20774	14670	2.038	1673	36247	16139	4.52	478	10436	58344	27.673

අනු අංකය	දිස්ත්‍රික්කය	7				8				මුළු			
		වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව		වැය වූ මුදල රු. මි.
			ගැ	පි			ගැ	පි			ගැ	පි	
1	කොළඹ	0	0	0	0	0	0	0	0	24	1469	812	3.70
2	ගම්පහ	1	13	0	0.0096	87	2536	346	1.74	601	22252	6976	5.90
3	කළුතර	0	0	0	0	2	24	36	0.04	2	24	36	0.04
4	මහනුවර	11	379	254	1.13	29	838	388	0.353	1627	6798	4348	7.55
5	මාතලේ	0	0	0	0	45	523	843	0.033	576	1193	1760	0.10
6	නුවරඑළිය	10	16	10	0.03949	0	0	0	0	31	344	243	0.11
7	ගාල්ල	0	0	0	0	11	823	277	0.7714	102	3445	1396	1.31
8	මාතර	0	0	0	0	3	61	84	0.025	33	865	457	0.13
9	හම්බන්තොට	20	345	88	0.014	58	1192	683	0.0295	167	3559	1593	0.16
2	යාපනය	0	0	0	0	0	0	0	0	0	0	0	0.00
11	මන්නාරම	0	0	0	0	0	0	0	0	0	0	0	0.00
6	වව්නියාව	0	0	0	0	0	0	0	0	10	275	121	0.06
1	මුලතිව්									0	0	0	0.00
14	කිලිනොච්චිය	0	0	0	0	0	0	0	0	12	270	210	0.07
4	මඩකලපුව	0	0	0	0	0	0	0	0	17	416	204	0.00
16	අම්පාර	14	77	72	0.01	13	346	199	0.03	748	15492	11628	1.16
17	ත්‍රිකුණාමලය	3	72	81	0	1	8	32	0	51	1016	998	0.00
18	කුරුණෑගල									0	0	0	0.00
19	පුත්තලම	1	20	15	0	40	624	116	0.08	203	4783	1511	0.91
20	අනුරාධපුරය									0	0	0	0.00
21	පොළොන්නරුව	0	0	0	0	0	0	0	0	99	704	295	0.04
22	බදුල්ල	18	348	84	0.039	12	238	109	0.003	214	4416	1805	0.35
23	මොණරාගල	0	0	0	0	0	0	0	0	0	0	0	0
24	රත්නපුරය									104	4691	3203	0.35
25	කෑගල්ල									119	704	366	
මුළු	මෙම මස	78	1270	604	1.24209	301	7213	3113	3.1049	4740	72716	37962	21.94
	11.30 ට සමුච්චිත	590	11898	9306	8.81455	2659	67445	36744	9.2693	25448	441649	305225	104.91
	12.31 ට	668	13168	9910	10.0566	2960	74658	39857	12.374	30188	514365	343187	126.86

1 මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය පිළිබද වැඩසටහන්
2 සමෘද්ධි කැකුළු ළමා සමාජ වැඩසටහන
3 ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4 නිපුණතා සංවර්ධණ පුහුණු වැඩසටහන
5 ගෘහ කළමනාකරණ හ සතුටු පවුල් වැඩසටහන.
6 ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන හා මානසික සංවර්ධන වැඩසටහන
7 ප්‍රගති සමාලෝචන වැඩමුළුව පැවැත්වීම
8. වෙනත් - ඇමුණුමක් මගින් ඉදිරිපත් කරන්න

සැ.යු*

1 ගැහැණු පිරිමි වශයෙන් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව වෙන් වෙන්ව සටහන් කළ යුතුයි.(අමාත්‍යාංශ උපදෙස් පරිදි)
2 සෑම මුදලක්ම මිලියන වලින් ඉදිරිපත් කළ යුතුයි.
3 සෑම මසකම ප්‍රගතිය එළැඹෙන මස 05 දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය යුතුයි. (email මගින්)

සකස් කළේ

නිර්දේශ කළේ

....
අනුමත කළේ

(සංඛ්‍යා සටහන - XV)

<u>සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන - 2024</u>
<u>ප්‍රතිපාදන නිදහස් කිරීම.</u>

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ කොට්ඨාශය	ළමා වැඩසටහන් ශිෂ්‍යත්ව වැඩසටහන ඇතුළු (රු)	මත් නිවාරණ වැඩසටහන (රු)
1	කොළඹ	13	38,805.00	77,610.00
2	ගම්පහ	13	38,805.00	77,610.00
3	කළුතර	14	41,790.00	83,580.00
4	මහනුවර	20	59,725.00	119,425.00
5	මාතලේ	11	32,835.00	65,670.00
6	නුවරඑළිය	5	14,925.00	29,850.00
7	ගාල්ල	22	65,670.00	131,340.00
8	මාතර	16	47,760.00	95,520.00
9	හම්බන්තොට	12	35,820.00	71,640.00
10	කුරුණෑගල	30	89,550.00	179,100.00
11	පුත්තලම	16	47,760.00	95,520.00
12	අනුරාධපුරය	22	65,670.00	131,340.00
13	පොළොන්නරුව	7	20,895.00	41,790.00
14	බදුල්ල	15	44,775.00	89,559.00
15	මොණරාගල	11	32,835.00	65,670.00
16	රත්නපුර	18	53,730.00	107,460.00
17	කෑගල්ල	11	32,835.00	65,670.00
18	යාපනය	15	44,775.00	89,559.00
19	මන්නාරම	5	14,925.00	29,850.00
20	වවුනියා	4	11,940.00	23,880.00
21	මුලතිව්	6	17,910.00	35,820.00
22	කිලිනොච්චි	4	11,940.00	23,880.00
23	මඩකලපුව	14	41,790.00	83,580.00
24	අම්පාර	20	59,700.00	119,400.00
25	ත්‍රිකුණාමලය	11	32,835.00	65,677.00
			1,000,000.00	***2,000,000.00***
මුළු මුදල				**3,000,000.00**

බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රතිපාදන නැවත හරවා එවා ඇත.

(සංඛ්‍යා සටහන - XVI)

සමාජ සංවර්ධන අංශයේ ප්‍රගති සමාලෝචන වැඩසටහන
ජාතික සමාජ සංවර්ධන අරමුදල්
2024.01.01 - 2024.12.31 දක්වා

අනු අංකය	දිස්ත්‍රික්කය	ලබා දුන් දිනය	ලබා දුන් මුදල	සත්‍ය වියදම
1	කොළඹ	2024.04.08	30,000.00	18,780.00
2	ගම්පහ	2024.04.08	30,000.00	30,000.00
3	කළුතර	2024.04.08	40,000.00	40,000.00
4	ගාල්ල	2024.04.08	60,000.00	60,000.00
5	මාතර	2024.04.08	40,000.00	40,000.00
6	හම්බන්තොට	2024.04.08	30,000.00	30,000.00
7	රත්නපුර	2024.04.08	50,000.00	50,000.00
8	කෑගල්ල	2024.04.08	30,000.00	30,000.00
9	මහනුවර	2024.04.08	50,000.00	49,900.50
10	මාතලේ	2024.04.08	30,000.00	30,000.00
11	නුවරඑළිය	2024.04.08	14,000.00	7,000.00
12	බදුල්ල	2024.04.08	40,000.00	39,720.00
13	මොණරාගල	2024.04.08	30,000.00	29,200.00
14	කුරුණෑගල	2024.04.08	80,000.00	79,965.00
15	පුත්තලම	2024.04.08	40,000.00	40,530.00
16	අනුරාධපුර	2024.04.08	60,000.00	60,000.00
17	පොළොන්නරුව	2024.04.08	20,000.00	20,000.00
18	වව්නියාව	2024.04.08	11,000.00	11,000.00
19	යාපනය	2024.04.08	40,000.00	39,064.00
20	කිලිනොච්චි	2024.04.08	11,000.00	11,000.00
21	මුලතිව්	2024.04.08	17,000.00	17,000.00
22	මන්නාරම	2024.04.08	14,000.00	14,000.00
23	අම්පාර	2024.04.08	50,000.00	50,000.00
24	මඩකළපුව	2024.04.08	40,000.00	40,000.00
25	ත්‍රිකුණාමලය	2024.04.08	30,000.00	30,000.00
	එකතුව		**887,000.00**	**867,159.50**

(සංඛ්‍යා සටහන - XVII)

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන 2024

සමස්ථ වාර්ථාව

අනු අංකය	දිස්ත්‍රික්කයේ නම	ප්‍රා.ලේ කොට්ඨාශ සංඛ්‍යාව	ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව	මුදල
				රුපියල්
1	යාපනය	15	2252	15,409,070.00
2	මන්නාරම	5	549	792,626.00
3	කිලිනොච්චිය	4	549	935,837.00
4	මඩකලපුව	14	2020	9,624,375.00
5	මුලතිව්	6	496	854,369.50
6	අම්පාර	20	1699	6,211,861.00
7	වවුනියා	4	402	5,537,478.00
8	ත්‍රිකුණාමලය	11	1045	2,170,546.00
9	පොළොන්නරුව	7	484	4,920,609.00
10	බදුල්ල	15	835	5,651,295.00
11	අනුරාධපුරය	22	1328	**4,181,968.00**
12	මොණරාගල	11	942	**2,257,908.00**
13	නුවරඑළිය	7	652	**6,273,307.00**
14	මාතලේ	11	908	5,522,458.00
15	මහනුවර	20	1561	13,902,261.00
16	කුරුණෑගල	30	3086	16,545,669.46
17	කෑගල්ල	11	1272	**4,497,331.00**
18	පුත්තලම	16	977	**6,800,863.00**
19	රත්නපුර	18	2009	**8,513,542.00**
20	හම්බන්තොට	12	843	3,567,080.00
21	මාතර	16	1049	4,575,866.00
22	ගාල්ල	22	1132	8,381,379.00
23	ගම්පහ	13	1741	**15,184,442.00**
24	කළුතර	14	1065	4,208,139.00
25	කොළඹ	13	797	**13,005,742.00**
	මුළු එකතුව	**337**	**29693**	**169,526,021.96**

නිවාස ලොතරැයි වැඩසටහන

හැඳින්වීම

සමාජ සංවර්ධන අංශය මඟින් 2024 වසරේදී ප්‍රධාන වැඩසටහන් අතර මෙම නිවාස වැඩසටහන ක්‍රමවේද කිහිපයක් යටතේ ක්‍රියාත්මක කරන ලදී.

1. රු. 750,000/- නිවාස වැඩසටහන
2. රු. 250,000/- නිවාස වැඩසටහන
3. රු. 750,000/- අභියාචනා නිවාස වැඩසටහන
4. රු. 250,000/- අභියාචනා නිවාස වැඩසටහන

සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන

2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වන වගන්තිය මඟින් සලසා ඇති ප්‍රතිපාදන මඟින් 95 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරී පනත යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල පහත සඳහන් රෙගුලාසි අනුව ක්‍රියාත්මක කොට 2024 වර්ෂයේදී විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක හිමිකම ලබාදීමේ අරමුණින් සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි භාරකාර අරමුදල පවත්වාගෙන යනු ලැබේ.

මෙම අරමුදල ගොඩනංවා ඇත්තේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වලට ලබාදෙනු ලබන සහනාධාර මුදලින් මාසිකව රු. 100/-ක මුදලක් අරමුදලට බැර කිරීමෙනි. සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල රෙගුලාසි මාලාවකට අනුකූලව 2002.03.07 දිනැතිව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අනුමත කරන ලද භාරකාර මණ්ඩලයක් මඟින් පාලනය වේ.

එම නිලධාරී මණ්ඩලය පහත පරිදි වේ.

- විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
- විෂයභාර අමාත්‍යාංශයේ තවත් එක් නියෝජිතයෙක්
- විෂයභාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
- දෙපාර්තමේන්තුවේ විෂයයභාර අධ්‍යක්ෂවරයා
- සමෘද්ධි කළමනාකරුවන්ගේ සංගමයේ නියෝජිතයෙක්
- සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ නියෝජිතයෙක්

සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල

දර්ශනය -:
"සියළු සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක්"

මෙහෙවර -:
සමෘද්ධි ප්‍රතිලාභී පවුල් හා අඩු ආදායම්ලාභී පවුල් අතර නිවාස හිමිකම් නොමැති ප්‍රතිලාභීන්ගේ ආර්ථික, සාමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ශක්තිමත් කිරීම තුලින් අධ්‍යාත්මික ගුණ වගාවන් සංවර්ධනය කිරීම.

ඉලක්ක -:

01. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නිවාස සිහිනය සැබෑ කරලීම
02. අඩු ආදායම්ලාභීන්ගේ ජීවිත සඳහා දිරියක් ලබාදීම
03. ආර්ථික වශයෙන් මෙම පවුල් සවිබලගැන්වීම

පරමාර්ථ

01. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සුබසාධනය වැඩි කිරීම සඳහා ඔවුන්ගේ තාවකාලික නිවාස ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබාදීම
02. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ස්ථිර නිවාස ප්‍රශ්නය විසඳීම තුළින් ඔවුන් ආර්ථික සමාජීය අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාත්මික ගුණ වගාවන් දියුණු කිරීම
03. අසරණභාවයට පත් නිවසක් අහිමි ප්‍රතිලාභීන් සඳහා විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම

සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන

නිවාස ත්‍යාග ලබාදීමෙන් පසු අරමුදලේ ඉතිරිවන යම් ශේෂයක් වේ නම් ඒවා මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට වැඩි දුරටත් යොදා ගැනීමට සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි භාරකාර අරමුදල් මණ්ඩලයට බලය ඇත්තේය.

ඒ අනුව පහත වැඩසටහන් 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇත.

1. රු. 250,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන- නිවාස 654 මුදල රු. මි. 163.5
2. රු. 750,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන- නිවාස 644 මුදල රු. මි. 487.5
3. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය මගින් ඉදිරිපත් වන හා අභියාචනා සඳහා නිවාස ලබාදෙන වැඩසටහන - නිවාස 57 මුදල රු. මි. 23.35

2024 වර්ෂයේදී නිවාස 1,355ක් ඉදිකළ අතර ඒ සඳහා කරන මුදල රු. මි. 674.35කි.

2.1.11 ප්‍රජාමූල සංවිධාන අංශය

හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධන කාර්යභාරයන් දියත් කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ මූලිකම පදනම ප්‍රජාමූල සංවිධානයයි. සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් යනු සමෘද්ධි පනතින් යෝජිත මෙහෙයුම් ක්‍රියාවලියේදී ප්‍රජාව සම්බන්ධ වන ග්‍රාමීය මට්ටමේ සංවිධානයකි. මෙම ඒකකය පදනම් කරගෙන සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන, සමෘද්ධි දිස්ත්‍රික් කමිටු සහ සමෘද්ධි ජාතික සම්මේලනය වශයෙන් සමස්ත සංවිධාන ව්‍යුහය ගොඩනැඟී ඇත.

සමෘද්ධි පනතට අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටුකල යුතු සියලු සංවර්ධන කාර්යයන් හා ප්‍රජාව සම්බන්ධ වන පහළම සංවිධානාත්මක ඒකකය වන ප්‍රජාමූල සංවිධානය මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගීත්වයෙන් ඉටු කරනු ඇත. ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් එයට සමගාමීව ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටුද පිහිටුවා පවත්වා ගෙන යාම සිදු කෙරේ. මෙම වසර සඳහා ප්‍රජාමූල සංවිධාන 29,814 ක් ලියාපදිංචි කර ඇත.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන වල කර්තව්‍ය ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කිරීම,පරීක්ෂා කිරීම සහ ඇගයීමේ කාර්යය සඳහා ප්‍රජාමූල සංවිධාන වල සභාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන 335 ක් පිහිටුවා ඇත.

දිස්ත්‍රික්කයක් ඇතුළත ක්‍රියාත්මක වන සියලු සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සභාපති හා ලේකම් නියෝජනය කරමින් සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවනු ලැබේ. මෙම දිස්ත්‍රික් කමිටු සෑම තුන් මසකට වරක් කැඳවීම සහ අදාළ තීරණයන් ගැනීම ක්‍රියාත්මක කිරීම සිදුකල යුතුය.

සියලු සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන වල අනුයෝජිතයන්ගෙන් සමන්විත වන පරිදි සමෘද්ධි ජාතික සම්මේලනය පිහිටුවනු ලැබේ. විෂය භාර අමාත්‍යවරයා සමෘද්ධි ජාතික සම්මේලනයේ මූලසුන දැරිය යුතුය.

ජාතික මට්ටමින් සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා සහ මත සමාලෝචනය කිරීම සහ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම සමෘද්ධි ජාතික සම්මේලනයේ පරමාර්ථ වේ.

මෙම සියලු සංවිධාන පිහිටුවා යාවත්කාලීන කිරීම, පවත්වාගෙනයාම, මෙහෙයවීම හා කළමනාකරණය කිරීම මෙන්ම එම සංවිධාන වල සියලු කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් සිදු කරනු ඇත

ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචි කිරීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචිය අලුත් කිරීම.
- ❖ සමෘද්ධි ජාතික සම්මේලනය පැවැත්වීම.
- ❖ ජාතික සමාජ සංවර්ධන අරමුදල පවත්වාගෙන යෑම හා නියාමන කටයුතු.
- ❖ ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ❖ ස්වේච්ඡාවෙන් ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීමේ නියමුවන් වන ප්‍රජා නායකයින් ඇගයීම.
- ❖ ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන වල ගිණුම් කටයුතු ක්‍රමාණුකූල කිරීම.
- ❖ ආර්ථික සංවිධාන පිහිටුවීම.
- ❖ සංවිධාන අරමුදල් වර්ධනය කිරීමට අවශ්‍ය විවිධ වූ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.
- ❖ කාලීන පැන නගින අර්බුදයන්ට විසඳුමක් ලෙස මැදිහත්විය හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ පවුල් සවිබල ගැන්වීම සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ පෙර පාසැල් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හඳුනා ගෙන ඒ සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ පාසල් යන දරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාත්මක වීම.
- ❖ පවුල් සවිබලකරණය සඳහා ව්‍යවසායකයින් හඳුනාගෙන ඔවුන් ඇගයීමට ලක් කිරීම.
- ❖ ජාතික සැමරුම් දිනයන්ට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ ක්ෂුද්‍රමූල්‍ය ගැටළුවට විසඳුමක් ලෙස සමෘද්ධි අරුණළු සහන ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ❖ ''තාරුණ්‍යයට සොඳුරු ඇමතුමක්'' සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජාතික හා අන්තර් ජාතික මට්ටමින් ක්‍රීඩා දක්ෂතාවයන් දක්වන දරුවන්ට ක්‍රීඩා සංවර්ධන ආධාර ලබාදීම.

➢	පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව	29,814
➢	පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සංඛ්‍යාව	335
➢	ත්‍රෛයි මාසිකව රැස්වන දිස්ත්‍රික් කමිටු සංඛ්‍යාව	25
➢	ප්‍රජාමූල සංවිධාන වල මුළු සාමාජික සංඛ්‍යාව (මිලියන)	2.15

ප්‍රජා නායකයින් හා නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 04 වන වගන්තියේ (උ) හා (ඌ) හි සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා 05 වන වගන්තියේ (ඕ) හි සඳහන් බලතල ප්‍රකාරව 06 වන වගන්තියේ (ඇ) හා (ඒ) හි සඳහන් කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අනුකූලව කටයුතු කිරීම සඳහා ප්‍රජා නායකයින් දැනුවත් කිරීම මඟින් සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීම.

2024 වර්ෂයේ ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් ක්‍රියාත්මක වැඩසටහන් හා අරුණළු සහන ණය වැඩසටහන පිළිබඳ ප්‍රජාමූල නායකයින් හා සමෘද්ධි නිලධාරින් දැනුවත් කිරීම මඟින් අපේක්ෂිත ඉලක්ක සාධනීය ලෙස ලඟා කර ගැනීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් පුහුණු කරුවන් පුහුණු කිරිමේ වැඩමුළු 02ක් සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන හරහා 2024 වර්ෂයේ අගෝස්තු මස සිට ඔක්තෝබර් මස දක්වා දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලදී.

දිස්ත්‍රික් මට්ටමින් පුහුණු කරුවන් පුහුණු කර ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්, ප්‍රජා නායකයින් දැනුවත් කර එම කණ්ඩායම මඟින් දිවයිනම ආවරණය වන පරිදි ග්‍රාමීය මට්ටමේ සියළු ප්‍රජානායකයින් හා නිලධාරීන් පුහුණු කිරීම හැකියාව ලැබිණි.

එහි දී පහත සඳහන් මාතෘකා සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

- සමෘද්ධි පනත, රෙගුලාසි හා ප්‍රාදේශීය සංවිධාන සතු බලතල පිළිබඳ දැනුවත් කිරීම.
- නායකත්වය, ප්‍රජා නායකයෙකු සතු වගකීම් හා තීරණ ගැනීම.
- සරල ව්‍යාපෘති වාර්ථාවක් සකස් කිරීම හා ඉදිරිපත් වන වාර්තාව පදනම් කරගෙන තීරණ ගැනීම.
- ප්‍රජාමූල, ප්‍රාදේශීය සංවිධාන වල ප්‍රජා නායකයෙකු සතු වගකීම් හා කාර්ය භාරය.
- ජාතික නිෂ්පාදනයට ආර්ථික ප්‍රතිලාභ ලඟා කර දීම උදෙසා ක්‍රියාත්මක විශේෂ ආදායම් උත්පාදන වැඩසටහන.
- ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්, දරුවන් හා තරුණ ප්‍රජාවගේ ක්‍රීඩා කුසලතාවය වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගත් ජාතික ක්‍රීඩා වැඩසටහන.
- ක්ෂුද්‍ර මූල්‍ය ගැටළුවට පිලියම් ලෙස හඳුන්වා දුන් අරුණළු ණය වැඩසටහනේ දැනට භාවිතා වන ආකෘති පත්‍රවල අඩුපාඩු සාකච්ජා කර නව ආකෘති පත්‍ර හඳුන්වාදී ගිණුම්කරණය පිළිබඳ දෙදින වැඩමුළුවක් පැවැත්වීම.
- ප්‍රජා නායකයින් විගණකයන් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කිරීම.

මේ යටතේ දිවයිනම ආවරණය වන පරිදි නිලධාරීන් 86 කගේ සහභාගිත්වයෙන් වැඩමුළු 2 ක් හා නිලධාරීන් හා ප්‍රජානායකයින් 2490කගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් මට්ටමේ වැඩමුළු 60ක් පැවැත්වීමට හැකි වූ අතර ඒ සඳහා ජාතික සමාජ සංවර්ධන අරමුදලෙන් රු.මි. 2.83 වැය දරන ලදී.

දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධානයන්හි වැඩසටහන් අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම, සහ ඇගයීම, දිස්ත්‍රික්කය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීම, වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

ස්ථානය	-	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
සහභාගිත්වය	-	ප්‍රාදේශීය සංවිධාන වල සභාපතිවරු, ලේකම්වරු, ප්‍රජාමූල බැංකු සමිති ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්, දිස්ත්‍රික්කය භාරව සිටින දෙපාර්තමේන්තු නිලධාරියා, අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතුවල යෙදී සිටින තැනැත්තන් තුන්දෙනෙකු.

සෑම වර්ෂයකම තුන් මසකට වරක් රැස්වීම් පවත්වන අතර වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්වේ.

දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සහ අදහස් සලකා බැලීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා දිස්ත්‍රික් කමිටු මඟින් සිදු කෙරේ.

මෙම වර්ෂයේ මුල් කාර්තු 2 තුළ රැස්වීම් 50 ක් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත රු.මි.ලි 1.5 ක් හා 3 හා 4 කාර්තුවල රැස්වීම් 46ක් සඳහා ජාතික සමාජ සංවර්ධන අරමුදලින් රු.මිලි 1.38 වැය කරන ලදී.

සමෘද්ධි කොඩි වැඩසටහන

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 10 (ඒ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය, සමාජය කෙරෙහි සාමූහික වගකීම, යහපත් ගුණාංග හා ගුණ ධර්ම ප්‍රවර්ධනය කිරීම ප්‍රජාමූල සංවිධානවල එක් පරමාර්ථයක් වන අතර පනතේ 16(ඉ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානව පෞරුෂය, සාමූහික ක්‍රියාකාරකම් දැහැමි හා ආධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කිරීම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල එක් පරමාර්ථයක් වේ.

මෙම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. තම වසමට අයත් ප්‍රජාමූල සංවිධාන වල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාව මෙන්ම සාමාජිකයන් සමඟ එක්ව සමෘද්ධි ප්‍රතිලාභීන් මඟින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීම දුම් වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටීමේ පණිවුඩය ජනතාව වෙත ලබා දෙමින් අරමුදල් රැස් කිරීම සිදු කරන ලදී. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හා අඩු අදායම්ලාභීන්ගේ සමාජ සුබසාධන කටයුතු සඳහා මෙම අරමුදල් යොදවනු ලැබේ.

මෙම වැඩසටහන සියළුම ප්‍රජාව සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල ක්‍රියාත්මක අතර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීම හා කොඩි වැඩසටහන තුලින් එක්රැස් කරන ලද අරමුදලින් ප්‍රතිලාභීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල දරුවන්ගේ සුබසාධනය සඳහා යෙදවීම. මත් නිවාරණ වැඩසටහන්, නිවාස ඉදිකිරීම්, නිවාස අලුත්වැඩියා කිරීම්, පාසල් දරුවන් සඳහා ශිෂ්‍යාත්ව ලබාදීම, පාසල් දරුවන් සඳහා පොත් හා උපකරණ ලබාදීම, සනීපාරක්ෂක වැඩසටහන, සෞඛ්‍යය හා පෝෂණ වැඩසටහන්, ආබාධිත සුබසාධනය, කාන්තා හා වැඩිහිටි දින වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ක්ෂුද්‍රමූල්‍ය ගැටළුවට විසඳුමක් ලෙස සමෘද්ධි අරුණළු සහන ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ කුඩා පරිමාණ ව්‍යවසායික ප්‍රාග්ධන අවශ්‍යතා මෙන්ම පැන නගින හදිසි මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය වන්නා වූ කෙටි කාලීන මූල්‍ය ඕනෑ එපාකම් තම ගම් ප්‍රදේශයේදීම පිරිමසාලීමටත් ,අඩු ආදායම්ලාභීන් ණයගැති භාවයෙන් මුදවා ගැනීමත් මෙම ණය වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

ප්‍රතිලාභීන්ට හිමිවන පහසුකම්

- තම ගම් ප්‍රදේශයේදීම ණය ලබා ගැනීමේ හැකියාව.
- ඉතා කෙටි කාලයක් තුළ ණය ලබා ගැනීමට හැකිවීම.
- සහනදායි පොලී අනුපාතයක් යටතේ ණය ලබාදීම.
- සරල පහසු ක්‍රමවේදයක් යටතේ ආපසු ගෙවීමේ හැකියාව.

ණය ලබාදී ඇති ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව	14,628
ණය ලබාදී ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව	270,518
ණය ලබාදී ඇති ණය වටිනාකම රු. මිලි	3,504

දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධී දින වැඩ සටහනට පූර්ව ප්‍රචාරණයක් ලබාදීම සඳහා ක්‍රීඩා වැඩසටහනක් පැවැත්වීම.

මැයි 31 දින යෙදෙන දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධී කොඩි දින වැඩසටහනට පූරව ප්‍රචාරණයක් ලබාදීම අරමුණු කර ගනිමින් ප්‍රජාමූල සංවිධානවල සාමාජිකයින් හා ඔවුන්ගේ දරුවන්ගේ පූර්ණ සහභාගිත්වයෙන් මැරතන් ධාවන තරගාවලියක් දිවයිනම ආවරණය වන පරිදි කලාප, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.

මේ යටතේ දිස්ත්‍රික් මට්ටමේ පැවති තරඟ සඳහා එක් තරඟයකට තරඟකරුවන් 45 – 60 පමණ සහභාගීවූ අතර දිස්ත්‍රික්ක 22 සඳහා රු.මිලි 1.95 වැය කරන ලදී. කුරුණෑගල, පොලොන්නරුව හා මාතර යන දිස්ත්‍රික්ක වලින් නොයෙක් හේතූන් මත මෙම වැඩසටහන සඳහා ඉදිරිපත්වූයේ නැත.

ප්‍රජාව සවිබලගැන්වීම ඉලක්ක කර ගත් වැඩසටහන්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මඟින් දිස්ත්‍රික්කවලින් කරන ලද ඉල්ලීම් අනුව ප්‍රජාව සවිබලගැන්වීම ඉලක්ක කරගත් වැඩසටහන් කිහිපයක් තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් අතර ආදායම් උත්පාදන විශේෂ ව්‍යාපෘති , ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් හා 5 වසර ශිෂ්‍යත්ව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. මේ සඳහා ජාතික සමාජ සංවර්ධන අරමුදල මඟින් රු.මිලි 0.82 වැය කර ව්‍යාපෘති 12 ක්‍රියාත්මක කර ඇත.

ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය

(සංඛ්‍යා සටහන - XVIII)

අනු අංක	වැඩසටහන	වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි.	වියදම (රු.මි.)	සංඛ්‍යාව
01	අරුණළු ගිණුම් කරණය හා සමෘද්ධි ප්‍රජා නායකයින් හා නිලධාරීන් පුහුණු කිරීම.	2.83	2.83	ප්‍රජා නායකයින් හා නිලධාරීන් - 2576
02	දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්විම *	3.00	2.87	කමිටු රැස්වීම් 96
03	මැරතන් ධාවන තරඟාවලියක් පැවැත්වීම	2.75	1.95	දිස්ත්‍රික් තරඟ 22
04	විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	1.00	0.82	ව්‍යාපෘති 12
05	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම	1.00	0.62	රැස්වීම් වාර 05
එකතුව		**10.58**	**9.09**	

* භාණ්ඩාගාර ප්‍රතිපාදන මත මි.ලි 1.5 වැය කර දිස්ත්‍රික් කමිටු රැස්වීම් 50 පවත්වන ලදී.

2.1.12. තොරතුරු තාක්ෂණ අංශය

හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන කාර්යයන් තොරතුරු තාක්ෂණයත් සමඟ සම්බන්ධ කොට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම මෙම අංශයේ ප්‍රධාන අරමුණයි.

ක්‍රියාකාරකම්

- දිවයින පුරා පැතිරී ඇති සමෘද්ධි බැංකු 1097 හා සමිති 335 පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග සමාගම් දෙකක් දැනට තෝරාගෙන පළාත් 06 ක් සඳහා එක් මෘදුකාංගයකුත් පළාත් 03 ක් සඳහා අනෙක් මෘදුකාංගය වශයෙන් සියලු බැංකු පරිගණක ගත කිරීමට කටයුතු කිරීම.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නිල වෙබ් අඩවිය, දෙපාර්තමේන්තු මඟින් නිකුත් කරනු ලබන චක්‍ර ලේඛන, උපදෙස් ලිපි හා දැනුම් දීම් සියල්ල යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම. www.samurdhi.gov.lk
- නිලධාරින්ගේ දත්ත කළමනාකරණය සඳහා මානව සම්පත් කළමනාකරණ මොඩියුලය (HRM) පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තුවේ දුරකථන ඇමතුම් සඳහා වන වියදම් අවම කිරීම සඳහා ඇතිකර ඇති Calling circle දුරකථන ජාලය වඩාත් ශක්තිමත් කිරීම.
- දිවයින පුරා විසිරී ඇති සමෘද්ධි මූලස්ථාන කාර්යාල 335 හා දිස්ත්‍රික් කාර්යාල 25 සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම බිල්පත් ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- නිලධාරින්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම.
- ප්‍රධාන කාර්යාලයේ අංශ සඳහා පරිගණක සහ උපාංග සම්බන්ධයෙන් ඉල්ලීම් ලිපි සලකා බලා සැපයීමට කටයුතු කිරීම.
- බැංකු ලිපි ද්‍රව්‍ය ගබඩාවේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා නව මෘදුකාංගයක් හඳුන්වා දීම.
- මානව සම්පත් කළමනාකරණ (HRM) මොඩියුලය පවත්වාගෙන යාම සඳහා මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේ ADSL පැකේජය සඳහා ප්‍රතිපාදන යැවීම.

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.

මේ මඟින්, වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා නිකුත් කරන චක්‍ර ලේඛ නිවේදන, ලිපි ආදිය නිලධාරීන්ට කඩිනමින් ලබා දීම සිදු කෙරේ.

සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති පරිගණකගත කිරීම

- වසර 20 ක පමණ කාලයක් මැනුවල් ආකාරයට ක්‍රියාත්මක වූ දිවයිනේ සියළුම සමෘද්ධි බැංකු පරිගණක මෘදුකාංග මඟින් ක්‍රියාත්මක වන ආකාරයට පරිවර්තනය කිරීම.

පරිගණකගත කරන ලද බැංකු	1097
මැනුවල් අත්හරින ලද බැංකු	280
ජංගම යෙදවුම භාවිතා කරන බැංකු	769
ජංගම යෙදවුම භාවිතා කරන පරිශීලකයන් / වසම්	5,307

පරිගණක පද්ධතිය තුළින් දිවයිනේ සියළුම සමෘද්ධි බැංකු වල වාර්තා ක්ෂණිකව ලබා ගැනීමට ක්‍ෂුද්‍ර මූල්‍ය අංශයට අවස්ථාව සලසා දීම.

- සමෘද්ධි සහනාධාරය සහ රජය විසින් ලබා දෙන සියළුම සහනාධාර පරිගණක පද්ධතියන් මඟින් සියළුම බැංකු වල එකම දිනකදී එක වර ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට බැර කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- දිවයින පුරා සමෘද්ධි බැංකු වල ජංගම යෙදවුම (Mobile App) ක්ෂේත්‍ර නිලධාරීන් හරහා ක්‍රියාත්මක කිරීම මඟින් ග්‍රාමීය ජනතාවට නිවසේ සිටම බැංකු ගනුදෙනු සිදු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

මෙමඟින් ලබා ගත් ආර්ථික ප්‍රතිඵල

- සියළුම සමෘද්ධි බැංකු වල කාර්යක්ෂමතාව ඉහළ මට්ටමකට පත් වීම.
- වාර්තාකරණය කාර්යක්ෂම වීම නිසා ක්‍ෂුද්‍ර මූල්‍ය අංශයේ කටයුතු කාර්යක්ෂම වීම හා පහසු වීම.
- සමෘද්ධි බැංකු වල ගනුදෙනුකරුවන්ට ප්‍රමාදයකින් තොරව බැංකු ගනුදෙනු සිදු කර ගැනීමට හැකි වීම සහ වසම හෝ නිවසේ සිටම බැංකු ගනුදෙනු සිදු කර ගැනීමට හැකි වීම නිසා පාරිභෝගියන්ට විශාල පිරිවැයක් සහ කාලය ඉතිරි කර ගැනීමට හැකි වීම.
- රජය මඟින් ලබා දෙන සහනාධාර එකවර දිවයින පුරා සිටින ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට බැර කිරීමට හැකි වීම මඟින් රජයට සහ ප්‍රතිලාභීන්ට විශාල පහසුවක් හිමිවීම මෙන්ම විශාල පිරිවැයක් සහ කාලයක් ඉතිරි වීම.

HRM **මොඩියුලය ක්‍රියාත්මක කිරීම**.

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 25,000කට ආසන්න සේවකයන් පෞද්ගලික හා රාජකාරි තොරතුරු ඇතුළත් කිරීම.
- පද්ධතිය තුලින් එම සේවකයන් සඳහා රාජකාරි හැඳුනුම්පතක් නිකුත් කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම.
- දෙපාර්තමේන්තුගත නිලධාරීන් පෞද්ගලික ලිපිගොනුවේ ලේඛන scan කර පද්ධතියට upload කිරීම.
- එම upload කරන ලේඛන තුලින් දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා විශ්‍රාම ලිපි ගොනුවක් පද්ධතිය තුළින් සකස් කිරීම සහ ඒ ඒ වර්ෂයේ අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන නිලධාරින්ගේ තොරතුරු ඇතුළත් වාර්තාවක් පද්ධතියේ ඇතුළත් කිරීම.
- මෙය ප්‍රධාන කාර්යාලයේ, සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අංශ වලින් හා මූලස්ථාන කාර්යාල වලින් ක්‍රියාත්මක කරනු ලැබේ.

වැඩසටහන **ක්‍රියාත්මක කිරීම තුලින්,**

- ප්‍රමාදයකින් තොරව සේවක ගැටළු විසඳීමට හැකි වීම
- කාර්යාල කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ යාම.
- නිලධාරින් විශ්‍රාම යාමේදී විශ්‍රාම ගොනුවට අවශ්‍ය ලේඛන සහිත නිවැරදි ගොනුවක් සකස් කිරීම.
- නිවැරදි සහ යාවත්කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම බලාපොරොත්තු වේ.

2.1.13. මාධ්‍ය අංශය

හැඳින්වීම

2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර, ඊට අදාළව දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ජනතාව අතරට ගෙනයාම මාධ්‍ය අංශයේ මූලික අරමුණ වේ.

1. සමෘද්ධි උදානය රූපවාහිනී වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
2. සමෘද්ධි e පුවත්පත සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කිරීම.
3. සමෘද්ධි අන්තර්ජාල රේඩියෝව ක්‍රියාත්මක කිරීම.
4. ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදක වැඩමුළු පැවැත්වීම.
5. ඡායාරූප මුද්‍රණය සහ මාධ්‍ය සංචාර සිදු කිරීම.

2.1.14. අභ්‍යන්තර විගණන අංශය

හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මුදල් රෙගුලාසි 133,134 අනුව පිහිටුවා ඇති අතර, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් හා පූර්ව මගපෙන්වීම මත ක්‍රියාත්මක වනු ලැබේ.

අරමුණ හා කාර්යභාරය

අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන වශයෙන් දෙපාර්තමේන්තුවේ විගණන කාර්යයට අමතරව දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097ක් හා බැංකු සමිති 335ක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 335ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක් හා ප්‍රජාමූල සංවිධාන විගණනයට ලක් කරනු ලැබේ. දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතන විසින් ඉටු කරනු ලබන වැඩසටහන් වල කාර්යක්ෂමතාවය ඉහල නැංවීමේ අරමුණෙන් අදාළ පරිදි මූල්‍ය විගණනය, කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවධානම් සහිත ක්ෂේත්‍ර පදනම් කරගත් විගණනය සිදු කරනු ලබයි.

මේ අනුව 2024 වාර්ෂික විගණන සැලැස්ම අනුව වර්ෂය තුළ පහත අරමුණු ඉටු කර ගැනීමට සමත්ව ඇත.

I. විගණන සැලැස්මේ 70% ක ප්‍රගතියක් ළගා කර ගැනීමට හැකිවීම.
II. වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම.
III. වර්ෂය තුළ මූල්‍ය වංචා කිහිපයක් අනාවරණය කර ගැනීම, ඒ සඳහා විශේෂ විගණන පරීක්ෂණ පැවැත්වීම හා විනයානුකූලව කටයුතු කිරීම සඳහා යොමු කිරීම.

2.1.15 සැලසුම් හා මෙහෙයුම් අංශය

හැඳින්වීම

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතුරින් ජනතාවගේ දිළිඳුබව තුරන් කිරීමේ අරමුණ වෙනුවෙන් කටයුතු කරන ප්‍රධානතම ආයතනය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවයි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීම, වාර්ෂික සැලසුම් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම හා එම සැලසුම් අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් කිරීම, ආයතනික තීන්දු තීරණ ගැනීම සඳහා ඵලදායී දත්ත ඉදිරිපත් කිරීම හා තොරතුරු වාර්ෂික වියදම් සීමාව තුළ ඊට සරිලන ප්‍රතිඵල ළඟා කරගෙන ඇත් ද යන වග නිරීක්ෂණය කිරීම, ආයතනික ඉදිරි විභවතා පිළිබඳ පර්යේෂණ සිදු කර දිළිඳු බව තුරන් කිරීමේ මෙරට ජාතික මෙහෙවරට උරදෙන ප්‍රමුඛතම ආයතනය බවට පත් කිරීමේ මෙහෙවර අප අංශය මඟින් සිදු කරයි.

සැලසුම් හා මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

i. ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

ප්‍රධාන කාර්යාලය මඟින් මෙම රැස්වීම් සංවිධානය කරනු ලබන අතර, අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සෑම මසකට වරක්ම පැවැත්වේ. දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාතමක වන ව්‍යාපෘතිවල ප්‍රගතිය මෙන්ම, අනෙකුත් සියළුම පරිපාලන කරුනු පිළිබඳව සාකච්ඡා කරනු ලබන අතර, මේ සඳහා දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් සහභාගී වේ. මේ යටතේ, 2024 වර්ෂය සඳහා ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 24 ක් පවත්වා ඇති අතර, වියදම් කළ මුදල රු.මි. 0.56. කි.

ii. දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

සෑම මාසයකම දිස්ත්‍රික් කාර්යාලවල දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් මූලස්ථාන කළමණාකරුවන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම ප්‍රගතිය සාකච්ඡා කිරීම මෙහි දී සිදු වේ. 2024 වර්ෂය තුළ ප්‍රගති සමාලෝචන රැස්වීම් 100 ක් පවත්වා ඇත.

iii. වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම.

පෙර වර්ෂයට අදාළව ඒ ඒ අංශ මඟින් ක්‍රියාත්මක කරන ලද දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනය පදනම් කරගෙන වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරනු ලැබේ. එය පොතක් වශයෙන් සකස් කර සෑම වසරකම අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කෙරේ. ඒ අනුව අවසන් වරට 2023 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිටපත් 15 ක් භාෂා ත්‍රිත්වයෙන් සකස් කර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

2.1.16 වත්කම් කළමනාකරණ අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වූ ආයතන සතු වත්කම් 2013 අංක 01 දරන සමෘද්ධි පනත ප්‍රකාරව නිරවුල් කර එම වත්කම් ඵලදායී ආකාරයෙන් යෙදවීමත්, දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා අවශ්‍ය මූලික සාධකය වන ඉඩම්, ගොඩනැගිලි හඳුනා ගැනීම, පැවරීම, මිලදී ගැනීම, බදු ගැනීම, අත්පත් කර ගැනීම, ඉඩම් ගැටළු නිරවුල් කිරීම සහ මෙම විෂයට අදාළ සියළු ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් පවරා ගන්නා සියළු වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමත්, නිරවුල් වන වත්කම් තක්සේරුකරවා ගැනීමත් මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

දෙපාර්තමේන්තුව යටතේ පවතින ඉඩම් වර්ග

රජය සතු ඉඩම්	733	නිරවුල් සංඛ්‍යාව
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	86	349
මහවැලි සංවර්ධන අධිකාරිය	39	
පළාත් පාලන ආයතන	79	
පුද්ගලික	55	
වෙනත්	113	

මෙයට අමතරව සුව බොජුන්හල් 31ට අදාළ ඉඩම්වලින් 03 පවරා ගැනීමද සිදු කර ඇත. අනෙකුත් සියළු පවරා ගැනීම්වලට අදාළ කටයුතු විවිධ මට්ටම්වල ක්‍රියාත්මක වෙමින් පවතී. වත්කම් 140ක ප්‍රමාණයක් තක්සේරු කරවාගෙන ඇත. මෙයට අමතරව අන්තර්ග්‍රහණය වූ අධිකාරීන් සතුව පැවති මහා පරිමාණ තේ කම්හල් 03ක්, මෙගා වොට් 20.5ක විදුලි බලාගාරයක්, ටයර් නැවත පිරවීමට අවශ්‍ය උපාංග නිෂ්පාදන කම්හලක් පවත්වාගෙන යනු ලබන අතර එකී ඉඩම්වලින් බදු අයකර ගැනීම හා එම වත්කම් පැවරීමට අදාළ සියළු කටයුතු මෙම වසර තුළ ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත.

2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඉලක්ක

1. අඩු ආදායම්ලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ 2025-2029 කාල පරිච්ඡේදය තුළ පවුල් ලක්ෂ 20 ක් සවිබලගැන්වීමට සැලසුම් කර ඇත. ඒ යටතේ අස්වැසුම ප්‍රතිලාභී පවු ලක්‍ෂ 15 ක් සහ අස්වැසුම නොලබන සමෘද්ධි සහනධාර ලැබූ පවුල් ලක්ෂ 05 ක් සවිබලගන්වීමට අපේක්ෂිතය.
   2025 වර්ෂය තුළ දී පවුල් ලක්ෂ 04 ක් සවිබලගැන්වීමට කටයුතු කෙරෙන අතර, ඒ යටතේ අස්වැසුම සමාජ සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සුබසාධක ප්‍රතිලාභ ලබන පවුල් ලක්ෂ 03 ක් සහ අස්වැසුම නොලබන, සමෘද්ධි සහනනාධාර ලැබූ පවුල් ලක්ෂ 01 ක් සවිබලගැන්වීමට සැලසුම් කෙරේ.

2. අස්වැසුම සමාජ සුබසාධක ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ සැලස්ම ක්‍රියාත්මක කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
3. මෙම නියමු ව්‍යාපෘති විදේශ මූල්‍යාධාර වැඩසටහන් 02 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යටතේ පවුල් 12,800 ද , ලෝක බැංකු මූල්‍යාධාර යටතේ පවුල් 10,975 ක් සවිබලගැන්වීමට අපේක්ෂිතය.

4. ක්ෂුද්‍රමූල්‍ය ණය වැඩසටහන් යටතේ, දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් 400,000 කට සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය හරහා ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම.

5. "සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ උසස් පෙළ හදාරන සමෘද්ධිලාභී පවුල්වල දරුවන් 56,000 ක් සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබා දීම.

6. දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා විශේෂ නිවාස වැඩසටහන යටතේ පවුල් 3,000 ක් සඳහා රු. 250,000/= සිට රු. 1,000,000/= දක්වා නිවාස ආධාර ලබා දීම.

7. සමෘද්ධි බැංකු පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය අවසන් කර, සියළු බැංකු ගනුදෙනු නවීන තාක්ෂණය අනුව පරිගණක පද්ධතිය හරහා සිදු කිරීමට කටයුතු කිරීම.

8. අඩු ආදායම්ලාභී ව්‍යවසායක කාන්තාවන් සඳහා "ලිය සවිය" ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

9. 2024 වර්ෂයේ ආරම්භ කරන ලද රාජ්‍ය සේවකයන් සඳහා සමෘද්ධි බැංකු හරහා ලබා දෙන ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

10. සවිබලගැන්වෙන පවුල් පිළිබඳ තොරතුරු CRM පද්ධතියට ඇතුළත් කිරීම හා ඒ හරහා පවුල්වල ප්‍රගතිය විමර්ශනය කිරීමට කටයුතු කිරීම.

11. නිෂ්පාදන ගම්මාන 200 වැඩසටහන ඉදිරියටත් ක්‍රියාත්මක කිරීම.

12. ළමයින් සඳහා සංස්කෘතික හා සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් වැඩසටහන් 25 ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් 335ක් ක්‍රියාත්මක කිරීම.

13. දුම්වැටි හා මත්ද්‍රව්‍ය නිවාරණ ව්‍යාපෘතිය යටතේ, දිස්ත්‍රික්ක මට්ටමින් වැඩසටහන් 25 ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් 335ක් ක්‍රියාත්මක කිරීම.

14. දෙපාර්තමේන්තුවේ සියළුම සේවකයින්ගේ තොරතුරු HRM පරිගණක තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමේ කටයුතු යාවත්කාලීන කිරීම හා එම පද්ධතිය සේවක කළමනාකරණ කටයුතු සඳහා භාවිතා කිරීම.

15. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ නොවිසඳුනු වෘත්තීය ගැටළු විසඳා ගැනීමට වැටුප් කොමිෂම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ ආයතන සමඟ සාකච්ඡා කර, එම ගැටළු විසඳීමට පියවර ගැනීම.

16. සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයට සමගාමීව සෑම සමෘද්ධි බැංකුවක්ම මූලික කරගෙන ඉතුරුම් වැඩසටහන් හා අලුත් අවුරුදු උත්සව පැවැත්වීම.

17. අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් හිමියන්ට තම අනිවාර්ය ඉතුරුම් තැන්පතු මුදල ඇපයට තබා ආදායම් උත්පාදන/ දරුවන්ගේ උසස් අධ්‍යාපන/ පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් පැන නඟින මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ණය වැඩසටහනක් හඳුන්වා දීම.

18. අස්වැසුම හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් 50,000 කට වෘත්තීය පුහුණුව ලබා දීම හා එයින් 20,000 ක් හෝටල් ක්ෂේත්‍රයේ රැකියාගත කිරීම.

19. මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) විභාගයන්ට පෙනී සිටින හා අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් පසු පාසල් හැර ගිය තරුණ තරුණියන් සඳහා "වෘත්තීය යතුර" නම් වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාත්මක කිරීම.

20. අස්වැසුම හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් 500 ක් සඳහා ජපන් භාෂා පුහුණුව ලබා දී විදේශගත රැකියා අවස්ථා උදාකර දීම.

සී.ඩී.කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

පරිච්ඡේදය - 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත ආදායම් ප්‍රතිපාදන 2024 රු.		සටහන	සත්‍ය 2024 රු.	සත්‍ය 2023 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
77,447,946,000	භාණ්ඩාගාර අග්‍රිම		77,447,946,000	132,511,453,999	ඒසීඒ-3
3,202,986,631	තැන්පතු		3,202,986,631	4,548,345,751	ඒසීඒ-4
232,805,057	අත්තිකාරම් ගිණුම්		232,805,057	420,704,999	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
80,883,737,688	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**80,883,737,688**	**137,480,504,749**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**80,883,737,688**	137,480,504,749	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		**28,767,979,000**	**1,460,199,454**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**52,115,758,688**	**136,020,305,295**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-		
20,998,224,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	20,506,681,166	16,944,449,748	ඒසීඒ-2(ii)
36,842,174,335	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	468,995,788	448,724,239	ඒසීඒ-2(ii)
300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	29,082,679,274	100,186,608,556	ඒසීඒ-2(ii)
-	පොලී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	282,000	-	ඒසීඒ-2(ii)
57,840,694,335	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**50,058,638,229**	**117,579,782,544**	
	මූලධන වියදම්				
12,300,000	මූලධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම්	10	11,043,046	3,093,811	ඒසීඒ-2(ii)
6,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	4,676,735	-	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	ඒසීඒ-2(ii)
3,500,000	ධාරිතා වර්ධනය	14	3,280,792	2,750,321	ඒසීඒ-2(ii)
59,521,865	වෙනත් මූලධන වියදම්	15	43,399,680	16,236,809	ඒසීඒ-2(ii)
81,321,865	**මුළු මූලධන වියදම් (උ)**		**62,400,253**	**22,080,940**	
3,268,525,020	තැන්පතු ගෙවීම්		3,268,525,020	4,856,273,808	ඒසීඒ-4
245,397,814	අත්තිකාරම් ගෙවීම්		245,397,814	412,602,298	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
3,513,922,834	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**3,513,922,834**	**5,268,876,106**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		53,634,961,317	122,870,739,590	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(1,519,202,628)**	**13,149,565,705**	
	අග්‍රිම ලැබුම් ප්‍රකාශය අනුව ශේෂය		(1,519,202,628)	13,149,565,705	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		973,845	(182,635,937)	ඒසීඒ-3
				-	

1

3.2. 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2024 රු.	2023 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,221,004,395	2,013,533,830
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(අ)	135,519,896	122,927,138
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**2,356,524,291**	**2,136,460,967**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(2,253,392,789)	(2,331,523,937)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,221,004,395	2,013,533,830
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(ආ)**		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	2,388,912,685	2,454,451,074
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**2,356,524,291**	**2,136,460,967**

පිටු අංක 01 සිට 29 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 45දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්වලට අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුම්වල සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳීම් කර ඇති බැවින් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවට මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ අස්තිත්වය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමෙන් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන ගණකාධිකාරී
නම : මලර්මිඳි ගංගාදරන්	නම :සී.ඩී.කළුආරච්චි	නම :වයි.කම්බුල්ලාන්
තනතුර :ලේකම්	තනතුර :අධ්‍යක්ෂ ජනරාල්	
දිනය :2025.02.21	දිනය :2025.02.24	දිනය :2025.02.24

මලර්මිඳි ගංගාදරන්
ලේකම්
[illegible]

[illegible]

වයි. [illegible]
ප්‍රධාන ගණකාධිකාරී
[illegible]

3.3. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ඒසීඒ-3

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	වසර	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
බදු ලැබීම්	-	-
ගාස්තු, දඩ, දඩමුදල් හා බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් කිරීම වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,637,837,325	1,221,041,490
අග්‍රිම ලැබීම්	77,447,946,000	132,694,083,936
අත්තිකාරම් අයකර ගැනීම්	234,860,286	428,030,099
තැන්පතු ලැබීම්	3,020,350,695	4,548,345,751
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	82,340,989,306	138,891,501,276
අඩු කළා : මුදල් වැය කිරීම		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	20,910,479,824	17,332,127,444
සහනාධාර හා මාරුකිරීම්	29,082,961,274	100,186,608,556
වෙනත් වැය කිරීම වෙනුවෙන් දරන ලද වියදම්	2,021,412	14,621,475,946
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	28,767,979,000	1,460,199,454
අත්තිකාරම් ගෙවීම්	245,648,657	412,847,127
තැන්පතු ගෙවීම්	3,268,525,030	4,856,273,808
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	82,277,615,207	138,869,532,335
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	63,374,099	21,968,941
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොලී		
ලාභ	-	-
භෞතික වත්කම් ප්‍රතිසංස්කරණ හා නොපෙනෙන වත්කම් විකිණීම	-	-
ණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
	-	-
අඩු කළා : මුදල් වැය කිරීම		
භෞතික වත්කම් ප්‍රතිනිර්මාණය හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම	62,400,253	21,968,941
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	62,400,253	21,968,941
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(62,400,253)	(21,968,941)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	973,845	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ලැබීම්		
විදේශීය ණය ලැබීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
	-	-
අඩු කළා : මුදල් වැය කිරීම		
දේශීය ණය ආපසු ගෙවීම්		
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ චලනය (ඔ) = (උ)+(ඒ)		
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-
	-	-

3

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන

ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

සංඛ්‍යා සටහන - (XIX)

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාළ නොවේ				

වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

සංඛ්‍යා සටහන - (XX)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.මි.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.මි.)	අවසාන ප්‍රතිපාදනය (රු.මි.)		
පුනරාවර්තන	55,785	57,841	50,059	86.54
ප්‍රාග්ධන	72	82	62	76.54

මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

සංඛ්‍යා සටහන - (XXI)

අ. අං	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.මි.)	උපයෝගී කර ගන්නාලද ප්‍රතිපාදන,ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.මි.)	අවසාන ප්‍රතිපාදන (රු.මි.)		
01	මැතිවරණ කොමිෂන් සභාව		0.398	0.398	0.398	100
02	කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම අමාත්‍යාංශය		100,000	100,000	0.05	0
03	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව		0.426	0.426	0.426	100
04	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ශේෂ නිරවුල් කිරීම	1,068	1,068	1,068	100
05	බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව	මාතර පුහුණු මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් ගෙවීම කාර්යාල කාර්ය සහායක දීමනා ගෙවීම.	0.03	0.03	0.03	100

මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

සංඛ්‍යා සටහන - (XXII)

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට භාණ්ඩ මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	368,609,900	368,609,900	-	100
9152	යන්ත්‍රෝපකරණ	512,678,696	512,678,696	-	100
9153	ඉඩම්	977,076,750	977,076,750	-	100
9154	අස්පෘශ්‍ය වත්කම්	-			-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.5. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } LSW/A/SDD/2024/ML — ඔබේ අංකය / உமது இல. / Your No. } — දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

05 JUN 2025

ගණන්දීමේ නිලධාරී
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

යථෝක්ත විගණන වාර්තාව මේ සමග එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙතද, භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයා වෙතද දැනුම් දිය යුතුය.

03. පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේ නම් ඒ බවද මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

එච්.එම්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : 1. ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධනය අමාත්‍යතුමා - කා.දැ.ස
2. ගරු ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යතුමා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: LSW/A/SDD/2024/ML.
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025 මැයි 3 දින

05 JUN 2025

ගණන්දීමේ නිලධාරී

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2024 වර්ෂය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂය හා 2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය අතර රු. 5,815,071 ක වෙනසක් නිරීක්ෂණය විය.	දේපළ පිරියත උපකරණ නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි.	2024 වර්ෂයේ ආරම්භක ශේෂය සැසඳීම නිවැරදිව සිදු නොවූ බැවින් ඇති වූ මෙම වෙනස නිවැරදි කරන බව.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පාඩු ලේඛනය හා මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාරව වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයත් මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 ආකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම.	ලේඛන හා පොත්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව.

(ඇ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	නිරීක්ෂණය	නිර්දේශය	දෙපාර්තමේන්තුව අදහස් දැක්වීම
(i)	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	මෙම වාර්තාකරණයට නියමිත ආකෘතියක් නොමැතිවීම හේතුවෙන් පසුගිය වසර කිහිපයකදීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි විය. 2025 වර්ෂයේදී නියමිත ආකෘතිය අනුව වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.

(ii)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	අභ්‍යන්තර විගණන කාර්යයන්හි පවතින අඩුපාඩු හඳුනාගෙන එම අඩුපාඩු හැකිතාක් නිවැරදි කර ගනිමින් 2024 වර්ෂයේ දී කටයුතු කරන ලදි. 2025 වර්ෂයේ දී විගණන සැලැස්ම අනුව කටයුතු කරමින් අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව.

(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරියේ අදහස් දැක්වීම
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය viii වන පරිච්ඡේදයේ 2.1 වගන්තිය	-	අතිකාල දීමනා ලබාගැනීමට ප්‍රමාණවත් පරිදි අතිකාල වැඩ නියම වශයෙන් හා සාධාරණ වශයෙන් කර තිබේදැයි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් හෝ ඔහුගේ බලයලත් වෙනත් වගකිව යුතු නිලධාරියෙකු විසින් පෞද්ගලිකව සොයා බලා සෑහීමකට පත්විය යුතු වුවද දෙපාර්තමේන්තුවේ එක් එක් අංශවල වගකිවයුතු අධීක්ෂණ නිලධාරීන් විසින් එම කාර්යය ඉටුකර නොමැතිව අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිලධාරීන්ගේ අතිකාල අධීක්ෂණ නිලධාරීගේ නිර්දේශ කිරීමෙන් අනතුරුව පමණක් අනුමැතිය සඳහා යොමු කරන ලෙසත් සියළු අංශ ප්‍රධානීන්ට උපදෙස් ලබාදී ඇති බව.

II කාණ්ඩය XXIV වැනි පරිච්ඡේදයේ 3.17.1	-	ප්‍රධාන ණයකරුගේ පාලනය යටතේ කටයුතු කරන කිසිම නිලධාරියෙකු එකී ණයකරුගේ ඇපකරුවෙකු ලෙස පිළිගත යුතු නොවන නමුත් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරේ ස්ථිරව සේවය කරනු ලබන හා 2022 නොවැම්බර් 08 වන දින සිට දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක තනතුරේ වැඩ ආවරණයට පත්කර තිබූ නිලධාරියා විසින් තම පාලනය යටතේ කටයුතු කරන කළමණාකරුවන් දෙදෙනෙකු හා විෂයභාරෙකු ණය ලබාගැනීමේදී ඇපකරුවන් ලෙස ඉදිරිපත් කර තිබුණි.	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	රු.100,000/- බැගින් බැංකු 03 කින් ණය ලබා ගැනීම සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කර අවසන් කර ප්‍රධාන කාර්යාලය වෙත වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි පරීක්ෂණ කටයුතු කරමින් පවතින බව
(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි				
මුදල් රෙගුලාසි 880	-	බැංකුවේ ක්ෂේත්‍රයේ මුදල් එකතු කිරීමේ කාර්යයේ නියුතු නිලධාරීන්, මුදල් කවුන්ටර්වල සහ චෙක්පත් අත්සන් කිරීමේ වගකීම දරන නිලධාරීන් විසින් මුදල් ඇප ආඥා පනතට අනුව ඇප තැබීමක් සිදු කළ යුතු වුවත් නියැදි විගණනයට භාජනය වූ කංගල්ල, මැදමුලන, වීරවිල සහ ගෝණකදෙණිය යන සමෘද්ධි ප්‍රජා මූල බැංකුවල බැංකු කළමනාකරු, ගිණුම් ලිපිකරු, මුදල් අයකැමි, ක්ෂේත්‍ර ණය එකතු කිරීමේ	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඇප ආඥා පනතේ රෙගුලාසි වලට අනුව ඇප තැබිය යුතු සියළු නිලධාරීන්ගේ ඇප තැන්පතු සිදුකිරීමට සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ වරුන් දැනුවත් කර ඇති බව.

4

			යෙදී සිටින නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.		
	මුදල් රෙගුලාසි 1647 (ඉ)	-	රජයේ දෙපාර්තමේන්තුවල වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2024 වර්ෂයට අදාල වාහන සමීක්ෂණ වාර්තා 2025 වර්ෂයේ ජුනි මස 30 දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.
(iii)	අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 ප්‍රකාරව	-	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු වාහන 108 ක් සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වාහන 18 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර ඇති අතර ඉතිරි ධාවනයට සුදුසු වාහන සම්බන්ධව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරන බව.
(iv)	අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	-	අමාත්‍යාංශ ලේකම් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කළ යුතු වුවද, නියැදි විගණන පරීක්ෂාවට අනුව සෙවනපිටිය හා පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකරන අතර මේ පිළිබඳ නිසි	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකිරීමෙන් පසු අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී එම වාර්තා පදනම් කරගෙන ගෙවීම් කටයුතු සිදු කරන බව.

			අධීක්ෂණයක් බලධාරීන් විසින් සිදුකර නොතිබුණි. උක්ත චක්‍රලේඛය ප්‍රකාරව අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර දත්ත පමණක් පදනම් කරගත යුතු වුවත්, දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ගෙවීම සිදුවුවද ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකිරීම අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයක් බව නිරීක්ෂණය විය.		
(v)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 ඡේදය	-	දෙපාර්තමේන්තුවේ වැඩසටහන් 2 ක් පැවතියත් ප්‍රසම්පාදන සැලැස්ම එක් වැඩසටහනක් සඳහා පමණක් පිළියෙල කර තිබුණි. තවද, කාර්තුමය වශයෙන් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කාල සටහන සකස් කර නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණයේ පෙන්වා දී තිබූ සියළු අඩුපාඩු නිවැරදි කර ඇතුළත් කළ යුතු සියළු කරුණු ඇතුළත් කර 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල බව.

(ඉ) අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	දිවිනැගුම පනතේ 44 (ආ) වගන්තිය ප්‍රකාරව ඉවත් කරන ලද පනත් යටතේ පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන අධිකාරිය,දක්ෂිණ සංවර්ධන අධිකාරිය උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරී වලට අයත්වන්නාවූ සියළු නිශ්චල හා චංචල දේපල රජයට පවරාදිය යුතු බව සඳහන් කර ඇත.ඒ අනුව ඉහත ආයතන වල ස්ථාවර වත්කම්	සියළු අරමුදල් නීත්‍යානුකූල කොට ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුයි.	2025.05.14 දින මුදල් අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේ දී සමෘද්ධි පනත අනුව මෙම දෙපාර්තමේන්තුවේ අරමුදල් ව්‍යවස්ථාපිත ද යන්න නීතිපති විමසා වාර්තාවක් ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට ලබාදුන් උපදෙස් මත නීතිපති උපදෙස් ලබාගැනීම සඳහා 2025.05.16 දින අදාල ලේඛන

	සම්බද්ධ දෙපාර්තමේන්තුවට පවරාගෙන තිබූ අතර ඉහත සඳහන් අරමුදල් වල ශේෂයන්ද දෙපාර්තමේන්තුවට පවරාගෙන ස්ථාවර තැන්පත් වශයෙන් මේ දක්වා දෙපාර්තමේන්තුවේ බැංකු මූල්‍ය අංශය යටතේ තැන්පත් වශයෙන් රඳවාගෙන තිබුණි. මෙම අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලද ඇතුලත් කිරීමට නොහැකි අතර මෙම කිසිදු අරමුදලක් සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.		නීතිපති වෙත යොමු කර ඇති බව.
(ii)	ක්‍රියාත්මක නොවන අරමුදල් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 (4) වගන්තිය ප්‍රකාරව හා 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/1 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 15 (2) (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු අවසන් කෙරෙන අරමුදල් වලින් ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසුව ඉතිරි වන මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට හා භාහිර අයතනයවල සිදුකරන ලද ආයෝජන කල් පිරීණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට හෝ ක්‍රියාත්මක වන අරමුදල් ව්‍යවස්ථාපිත ලෙසට විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් කිරීමට සම්බද්ධ සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 10 ක් ගතවී තිබුණද නොහැකිව තිබුණි. ඒ අනුව මෙමඟින් රාජ්‍ය මුදල් අවභාවිතාවී ද යන්න පරීක්ෂා කල නොහැකි අතර මෙම මුදල් රාජ්‍ය මූල්‍ය පාලනයෙන් ද බැහැරවී ඇත.	ක්‍රියාත්මක නොවන අරමුදල් සම්බන්ධව චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු අතර ක්‍රියාත්මක වන අරමුදල් රාජ්‍ය මූල්‍ය පාලනයට යටත් කළ යුතුයි.	2025.05.14 දින මුදල් අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේ දී සම්බද්ධ පනත අනුව මෙම දෙපාර්තමේන්තුවේ අරමුදල් ව්‍යවස්ථාපිත ද යන්න නීතිපති විමසා වාර්තාවක් ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට ලබාදුන් උපදෙස් මත නීතිපති උපදෙස් ලබාගැනීම සඳහා 2025.05.16 දින අදාල ලේඛන නීතිපති වෙත යොමු කර ඇති බව.

(iii)	2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 6 (ආ) ප්‍රකාරව ප්‍රතිරක්ෂකයකු ලෙස ක්‍රියා කිරීමට බලතල ඇතත්, රාජ්‍ය ආයතනවලට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී සිටින රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින් හෝ ඔවුන්ගේ නියෝජිතයින්/ තැරැව්කරුවන් වෙතින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ තරඟකාරී මිල ගණන් කැඳවීම මඟින් සාමාන්‍ය රක්ෂණාවරණ ලබාගත යුතු වුවත් කළමනාකරණ මණ්ඩලය විසින් විවිධ අවස්ථාවල රක්ෂණ ක්‍රම අනුමත කර තිබුණි. රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ වලට අනුගත නොවී විනිවිදභාවයකින් තොරව හා රක්ෂණ මූලධර්ම වලට පටහැනිව එම රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කර වන්දි ගෙවීම්ද සිදුකර තිබුණි	රක්ෂණ කටයුතු චක්‍රලේඛ ප්‍රකාරව සිදු කළ යුතුයි.	1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරී පනතට අනුව සමෘද්ධි අධිකාරිය යටතේ ආරම්භ කරන ලද සමෘද්ධි බැංකු ක්‍රියාත්මක වීමේදී ඇති වූ ණය අවධානම් තත්වයන් වලට පිළියමක් වශයෙන් එවකට පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ අභ්‍යන්තර රක්ෂණ ක්‍රමවේදයක් ලෙස රක්ෂණ ක්‍රම ආරම්භ කර ඇති බවත් මහා සංගමය ප්‍රති රක්ෂකයෙකු ක්‍රියා කිරීම සඳහා ගැසට් පත්‍රය මඟින් අවසර ලබාදුන් නමුත් එසේ කිරීමට නම් ප්‍රති රක්ෂණයේදී රක්ෂණය කරන ලද වත්කම් නැවත රක්ෂණය කිරීමක් සිදුවේ. එසේම එසේ සිදු කිරීමට මහා සංගමයට මූල්‍ය වත්කමක් නොමැති අතර ඉදිරියේ දී මෙම මුදල් මහා සංගමයට පැවරීමෙන් පසු ඒ අනුව කටයුතු කරනු ලබන බව.
(iv)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 15 (3) ඡේදය පරිදි ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේ වුවද, ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පැවති අරමුදලේ පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. තවද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 (4) වගන්තිය අනුව පනත ක්‍රියාත්මක දින සිට යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කළ යුතු අතර, මේ පනත ක්‍රියාත්මක	පනත සහ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	2025.05.14 දින මුදල් අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේදී සමෘද්ධි පනත අනුව මෙම දෙපාර්තමේන්තුවේ අරමුදල් ව්‍යවස්ථාපිත ද යන්න නීතිපති විමසා වාර්තාවක් ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට ලබාදුන් උපදෙස් මත නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා 2025.05.16 දින අදාල ලේඛන නීතිපති වෙත යොමු කර ඇති බව.

	කිරීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත එම අරමුදල් විසුරුවා හරිනු ලැබිය යුතුය. එහෙත් දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යන රක්ෂණ අරමුදල පිළිබඳව චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.		
(v)	2024 දෙසැම්බර් 31 දිනට සමෘද්ධිලාභීන්ගේ සහනාධාර මුදලින් අනිවාර්ය ඉතුරුම් ලෙස රඳවාගෙන බැංකු මූල්‍ය අංශය සතුව රු.මිලියන 30,356.57 ක් වූ අනිවාර්ය ඉතුරුම් මුදල් පවතින අතර මෙම වටිනාකමින් රු.මිලියන 29. 51 ක් හඳුනා නොගත් අනිවාර්ය ඉතුරුම් මුදලක් පැවතුණි. මෙම සියළු මුදල් ආයෝජන වශයෙන් තැන්පත් කර තිබුණු අතර එම ප්‍රමාණය රු.මිලියන 44,382.63 ක් වේ. 2024 දෙසැම්බර් 31 දිනට ආයෝජන පොලිය රු.මිලියන 4,461.47 ක් වේ. බැංකු මූල්‍ය අංශය විසින් 2024 වර්ෂයේ අනිවාර්ය ඉතුරුම් මුදල් ආයෝජන කර ඇතත් බැංකු වෙත ලබා දී ඇත්තේ සියයට 1 ක් වැනි අඩු පොලී අනුපාතයකි. නමුත් බැංකු විසින් අනිවාර්ය ඉතුරුම් සඳහා සමෘද්ධිලාභීන් වෙත ගෙවිය යුතු පොලිය 2024/133/01 දරන කළමනාකරණ තීරණය ප්‍රකාරව සියයට 3.6 කි. ඒ අනුව බැංකු වෙත හිමිවන ලාභ කොටස සියයට 1 පමණ වේ. අනිවාර්ය ඉතිරිකිරීම මුදල් සෘජුවම බැංකුව වෙත ප්‍රේෂණය නොකර බැංකු මූල්‍ය අංශය තුළ රඳවාගෙන ආයෝජනය කිරීම තුළින් ප්‍රජාමූල බැංකුව විසින්ම ආයෝජනය කර ලබාගත හැකි පොලී ආදායමට වඩා අඩු පොලියක් තිබීම හා එම මුදල් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන	අනිවාර්ය ඉතුරුම් මුදල් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු වෙනුවෙන් ඵලදායි ලෙස යොදාගත යුතුයි.	ප්‍රතිලාභීන්ට වැඩි පොළී මුදලක් ගෙවීමට මේ වනවිට හැකියාව ලැබී ඇත. ඒ සඳහා කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව.

	කටයුතු වෙනුවෙන් ණයට දීමේ හැකියාව අවම වීම වැනි අවාසි සහගත තත්වයන් ද උදා වී තිබුණි.		
(vi)	සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව යටතේ පවතින මහා සංගමය 2017 මාර්තු 07 වන දිනැති අංක 2009/8 දරන ගැසට් පත්‍රයේ 5 වන පරිච්ඡේදයේ (ආ) ප්‍රකාරව මහ සංගමය පිහිටුවා නොතිබුණු අතර ඊට වෙන්වූ අරමුදලක් පවත්වා තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ඒම අරමුදල සතු ආයෝජනය රු මිලියන 9 කි.	2017 මාර්තු 07 දින අංක 2009/8 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව නිවැරදි සංයුතියෙන් මහ සංගමය පිහිටුවිය යුතුය.	2017 මාර්තු 07 දින අංක 2009/8 දරණ ගැසට් පත්‍රයට අනුව 2017 අගෝස්තු මාසයේදී පළවන මහ සභාව පවත්වා මහ සංගමය පිහිටුවා ඇති බව.
(vii)	2020 අගෝස්තු 28 දිනැති අංක 2020/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ මු.රෙ 877 (1) (ඇ) හා (ආ) ඡේද ප්‍රකාරව කිසියම් අරමුදලක වාර්ෂිකව අයවැය ලේඛනය සකස් කොට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු අතරම එසේ අයවැය අනුමත කිරීමකින් තොරව අරමුදල් යටතේ කිසිදු වියදමක් දැරිය නොහැකි වුවත් දෙපාර්තමේන්තු යටතේ වන බැංකු මූල්‍ය අංශය සතු අරමුදල් වලින් ඉහත කිසිදු අනුමැතියකින් තොරව වැය ඇස්තමේන්තු සකස් කොට වාර්ෂිකව වියදම් දැරීම සිදු කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂය සඳහා රු. මිලියන 3745.9 ක වැය ඇස්තමේන්තුවක් පමණක් සකස් කර තිබුණ අතර එම වියදම් දැරීම සඳහා ආදායම් උත්පාදනය කර ගන්නා ආකාරය එනම් වර්ෂයේ ආදායම හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව මෙසේ අනුමැතියකින් තොරව දරනු ලබන සියළු වියදම් නිත්‍යානුකූල නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය සඳහා යොමුකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර ඒ සම්බන්ධයෙන් ඉදිරියේ කටයුතු කරන බව.

(viii)	වාර්ෂිකව අනුමත කරගත් අයවැය ලේඛනය පදනම් කරගෙන ප්‍රසම්පාදන සැලැස්ම සකස්කොට ප්‍රසම්පාදනය සිදුකළ යුතු වුවත් ප්‍රජාමූල බැංකු අංශය ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 2024 වර්ෂය සඳහා රු. මිලියන 477 ක් වූ ප්‍රසම්පාදනයන් සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. සමෘද්ධි බැංකු සඳහා රු. මිලියන 460 ක් වූ ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීම, විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීම සහ සූර්ය පැනල ලබාදීම යන ප්‍රසම්පාදනයන් සඳහා අයවැය ඇස්තමේන්තු සකස් නොකර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණි.	වර්ෂයේ සියලුම මිලදී ගැනීම් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත්ව තිබිය යුතුය.	දැනට විදුලි ජනක යන්ත්‍ර 38 ක් මිලදී ගෙන ඇති බව.
(ix)	ප්‍රජා මූල බැංකු අංශයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව 2024 පෙබරවාරි 01 සිට 2024 අප්‍රේල් 30 දක්වා කාලය තුළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර සමෘද්ධි බැංකු සඳහා ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍ර මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 අනුව ප්‍රසම්පාදන ක්‍රියාවන් සඳහා කාල සටහනක් පිළියෙල කර නොතිබුණු අතර ලංසු වලංගු කාල සීමාව 2024 අප්‍රේල් 30 සිට 2024 ජූලි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් මෙම කාර්ය සඳහා නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ප්‍රසම්පාදන කටයුත්ත වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පල කිරීම් සඳහා වැය කළ රු. 112,572 ක මුදල අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කල යුතුය.	ඉදිරිපත් කරන ලද පිරිවිතර වල පැවති දෝෂයන් හේතුවෙන් නැවත මිල යෝජනා කැඳවන ලෙස උපදෙස් ලබා දී තිබූ බව.
(x)	දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රජාමූල බැංකු, දිස්ත්‍රික් කාර්යාල හා බැංකු මූල්‍ය අංශයේ කාර්ය	රජයේ නිලධාරීන් සඳහා අරමුදල් භාවිතා කර ආයතන සංග්‍රහයට හා පවත්නා නීති රීතිවලට පරිබාහිරව	මේ වන විට මෙම සේවක ණය ලබාදීම් අත්හිටුවා ඇති අතර ණය වාරික අයකර ගැනීම් පමණක් සිදු

	මණ්ඩලයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට පටහැනිව සේවක පරිභෝගික ණය, සේවක නිවාස ණය, විශේෂ සේවක ණය හා විශේෂ ආපදා ආදී වශයෙන් සේවක ණය යෝජනා ක්‍රම මඟින් ණය ලබා දී 2024 දෙසැම්බර් 31 දිනට රු බිලියන 12.9 ක මුදලක් (හිඟහිටි ශේෂය) අයවීමට තිබුණි. මෙම සේවක ණය වලින් රු මිලියන 45.72 ක මුදලක් 2025 පෙබරවාරි 28 දින වන විට ගෙවීම් පැහැරහැරීම් හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු නොකර බොල්ණය ලෙස වෙන් කිරීම් කර තිබුණි.	සේවක ණය ලබාදිය නොහැකි බැවින් දැනට අය නොවන ශේෂ සඳහා රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි.	කෙරේ.2025 පෙබරවාරි දින වන විට බොල්ණය ප්‍රමාණය රු. මිලියන 45.724 ක් වේ. මෙම ණය අයකර ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ණයකරුවන්ගේ සහ ඇපකරුවන්ගේ සේවය හැරයාම, විනය නියෝග මත සේවය අත්හිටුවීම වැනි කරුණු බොල් ණය ඇතිවීමට ප්‍රධාන හේතු වී ඇති බව.
(xi)	දෙපාර්තමේන්තුවේ මුදල් අංශය යටතේ පවතින සේවක ණය චක්‍රීය අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂ රු.49,962,589 ක් වන අතර 2020 වර්ෂයේ සිට මෙම චක්‍රීය ණය යෝජනා ක්‍රමය අත්හිටුවා ඇත. සේවකයින්ගෙන් රැස්කර ගන්නා මුදලින් රු. මිලියන 186 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. සම්බද්ධ අධිකාරිය පැවති කාලයේ සිට පැවත එන මෙම අරමුදලේ 2014 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශ සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන සකස් කොට විගණනයට ඉදිරිපත් කල යුතුයි.	2025 වර්ෂයේ ඔක්තෝම්බර් මස 30 දිනට සියළුම ගිණුම් වාර්තා සකස් කර අවසන් කිරීමට සැලසුම් කර ඇත. ඉන් අනතුරුව ගිණුමේ සියළුම ණය ශේෂ අත්තිකාරම් බී ගිණුමට පවරා ගෙන සේවක ණය චක්‍රීය අරමුදල් ගිණුම වසා දැමීමට පියවර ගන්නා බව.
(xii)	සම්බද්ධ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 දෙසැම්බර් 03 දිනැති අංක 2021/16 (නව) දරන සම්බද්ධ ප්‍රජාමූල බැංකු චක්‍රලේඛයේ 7.5.3 ඡේදය ප්‍රකාරව රජයේ/ පළාත් පාලන/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ස්ථිර සේවකයින්ගේ ඇප ලබා ගැනීමේදී ඇපකරුවන්ගේ මූලික වැටුපෙන් 40% ක සීමාව තුළ ණයකරුගේ මාසික ණය වාරිකය	බැංකු චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	ණයකරුවන්ගෙන් හා ඇපකරුවන්ගේ මූලික වැටුපෙන් 40% ක සීමාව තුල ණයකරුගේ මාසික ණය වාරිකය ඇතුළු සියළු අවකරණයන් කිරීමට හැකිවන පරිදි ණය නිදහස් කිරීම් චක්‍රලේඛ මඟින් උපදෙස් ලබාදී ඇති බව.

	ඇතුළු සියළු අවකරණයන් කිරීමට හැකිවිය යුතුය. එසේ වුවද එම නීති, රීති හා රෙගුලාසි අභිබවා එකතුව රු. 1,100,000 ක ණය මුදලක් ලබාගෙන තිබූ ණයකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කර තිබූ ඇපකරුවන්ගේ වැටුපෙන් සියයට 40 සීමාව ඉක්මවා, ණයවාරික සහ අවකරණ එකතුව පැවතුණි. විගණිත දිනය වූ 2025 ජනවාරි 27 වන දින වන විට එම ණයකරුවන්ගෙන් එකතුව රු. 741,485 ක මුදලක් අයකර ගත නොහැකිව හිඟව පැවතුණ අතර මාසික ණය වාරික සම්පූර්ණයෙන්ම ඇපකරුවන්ගේ වැටුපෙන් අයකර ගැනීමේ හැකියාව නොපැවතුණි. ඒ අනුව අදාල නීතිරීති වලට අනුකූල නොවන ලෙස ණය අනුමත කිරීමට කටයුතු කළ බැ.කු කළමණාකාරීත්වය මේ සඳහා වගකිව යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.		
(xiii)	සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා විවිධ අරමුණු සඳහා පිහිටුවා ඇති දෙපාර්තමේන්තුවේ පවතින අරමුදල් ගිණුම්වලින් රු.බිලියන 53.6 ක් රජයේ විවිධ අවශ්‍යතා සඳහා ලබා දී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයෙන් තවදුරටත් අයවිය යුතු මුදල රු. බිලියන 2.7 කි.	අයවිය යුතු ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුයි.	2013 වර්ෂයේ එවකට සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා ලබාගෙන ඇති මුදලේ තවදුරටත් පියවිය යුතු, දෙපාර්තමේන්තුවේ පොදුකැන්පත් ගිණුමේ පවතින රු.මි.2,374 ක මුදල භාණ්ඩාගාරයේ ප්‍රතිපූරණය කර ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට අවසන්වරට 2025 අප්‍රේල් 03 වන දින කැබිනට් සංදේශයක් පිළියෙල කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.
(xiv)	මහ සංගමේ අරමුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා අනුමත බැංකුවක තැන්පත් කලහැකි වුවත් ඊට පටහැනිව බැංකු මූල්‍ය අංශය විසින්	ආයෝජන නිවැරදි අනුමැතියකින් පසුව සිදු කළ යුතුයි.	සමෘද්ධි ප්‍රජා බැංකු හා සමිති කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියෙන් පත් කරන ලද ආයෝජන කමිටුව මඟින්

2004 වර්ෂයේදී පෞද්ගලික බැංකුවක රු. 10 හි කොටස් 5,557,188 ක් රු. 14.50 බැගින් මිලදී ගැනීමට රු. 80,579,226 ක් වැය කර තිබුණි. මෙම කොටස් සඳහා රු. 55,571,188 ක ප්‍රසාද කොටස් හිමිව තිබුණි.		තැරැව්කාර සමාගමක සේවය ලබා ගනිමින් කොටසක අගය රු. 40.00 ඉක්මවූ පසු මහ භාණ්ඩාගාරයේ ද උපදෙස් අනුව විකිණීමට සැලසුම් කර ඇති බව.

(ඊ) වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව දෙපාර්තමේන්තු විමර්ශන අංශයට මුල්‍ය වටිනාකම රු. මිලියන 243.52 ක් වූ මුල්‍ය වංචා 252 ක් වාර්තා වී තිබුණ අතර ඉන් වංචා 138 කට අදාලව නිලධාරීන් 138 කගේ විනය ක්‍රියා මාර්ග අවසන් කර අදාල මුදල් වංචා තුළින් නැවත අයකරගත් ප්‍රමාණය රු. මිලියන 52.91 කි. තවදුරටත් රු. මිලියන 190.61 ක් වූ මුල්‍ය වංචා 114 ක විනය කටයුතු සිදුකරමින් පවතින අතර 2014 ජනවාරි 03 දින සිට 2018 අගෝස්තු 31 දක්වා බැංකු හා බැංකු සමිතිවල සිදු වූ මුල්‍ය අක්‍රමිකතා වලින් රු. මිලියන 75.40 ක අක්‍රමිකතා 9 ක කටයුතු අවසන් කර නොතිබුණි. නිලධාරීන් විසින් දිගින් දිගටම මෙසේ මුල්‍ය වංචා සිදු කිරීමට බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු සකස් කිරීම හා විනය නියෝගය තුළින් දඬුවම් ලිහිල් වීමද වංචා වැඩිවීමට හේතුවී තිබුණි.	මුල්‍ය වංචා සිදු නොවන ලෙස බැංකු පද්ධතිය තුළ පවතින අඩුපාඩු සකස් කොට පද්ධතිය ශක්තිමත් කළ යුතුයි.	සිදුවූ මුල්‍ය අක්‍රමිකතා අනාවරණය කර ගැනීමෙන් අනතුරුව ඉදිරියේදී එවැනි තත්වයන් ඇතිවීම අවම කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කරමින් මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. එම උපදෙස් අනුව කටයුතු කරන බවට බැංකු හා බැංකු සමිති පසුවිපරම් කිරීමට දිස්ත්‍රික් මට්ටමින් බැංකු අධීක්ෂණ නිලධාරීන්ට වගකීම පවරා ඇත.ක්ෂුද්‍රමූල්‍ය බැංකු අංශයේ අධීක්ෂණ ඒකකයේ නිලධාරීන්ගේ මෙහෙයවීම යටතේ ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණයට ද මෙම කාර්යය යටත් කර ඇති බව.
(ආ)	ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 ඡේදයට අදාලව 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019 තුළින් මූලික විමර්ශනය මාස 2 ක් ඇතුළත අවසන් කළ යුතු වුවද වංචා, දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධතාවයෙන් මූලික විමර්ශන සිදුකර විනය නියෝග	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	සමෘද්ධි ප්‍රජා මූල බැංකු ආශ්‍රිතව අනාවරණය වන මුල්‍ය වංචා සම්බන්ධයෙන් පවත්වනු ලබන මූලික විමර්ශනවල ඇති සංකීර්ණභාවය හේතු කර ගෙන ඒ සඳහා දීර්ඝ කාලයක් ගත වන බව.

	ලබාදීම ප්‍රමාදවීම වසර 2 සිට වසර 10 දක්වා කාල පරාසයක පැවතුණි.		
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2020/06 චක්‍රලේඛය 3 වන ඡේදය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා හිමිකම් නොවූ ණය යෝජනා ක්‍රමයක් මගින් ණය ලබාගැනීමට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරේ ස්ථිරව සේවය කරනු ලබන හා 2022 නොවැම්බර් 08 වන දින සිට දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක තනතුරේ වැඩ ආවරණයට පත්කරනු ලැබ සිටි නිලධාරිවරයා විසින් එම චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස සමෘද්ධි ප්‍රජාමූල බැංකු 3 කින් රු.100,000 බැගින් එකතුව රු.300,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. එම අවිධිමත් ගෙවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	රු.100,000/- බැගින් බැංකු 03 කින් ණය ලබා ගැනීම සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කර අවසන් කර ප්‍රධාන කාර්යාලය වෙත වාර්තාව ඉදිරිපත් කර ඇත.ඒ අනුව අදාල පරීක්ෂණ කටයුතු කරමින් පවතින බව.
(ඈ)	ඇලහැර සමෘද්ධි ප්‍රජාමූල බැංකුවෙහි සිදුකරන ලද මූල්‍ය අක්‍රමිකතාව සම්බන්ධව නිවැරදි විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක නොකර වැරදිකරු විනය දඬුවම්වලට යටත්ව සේවයෙහි සිටිද්දී ලද නිලධාරීන් තිදෙනෙකු සෙවනගිරිය සමෘද්ධි ප්‍රජාමූල බැංකුවට ස්ථානමාරු කර තිබීම හා එක් අයකු වෙත ඉහළ තනතුරක් පිරිනමා තිබීම දූර්වල අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ගයක් බව සහ මෙය ඉදිරියේදී සිදු වන මූල්‍ය අක්‍රමිකතා පාලනයට හැටවක් වන බවද නිරීක්ෂණය විය.	මූල්‍ය අක්‍රමිකතා සිදුකර නිළධාරීන්ට විනය දඬුවම් ලබා දිය යුතුයි.	2011 වසරේ අක්‍රමිකතාවයට සම්බන්ධ විනය නියෝග වලට යටත්ව සේවයේ සිටිවූ නිලධාරීන්ගෙන් දෙදෙනෙකු වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුයුක්ත කිරීමෙන් පසු සෙවනගිරිය බැංකු කලාපයේ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර ඇත. දිස්ත්‍රික් ලේකම් සමග පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව 2011 වසරේ සිදුවීමෙන් පසු සේවා කාලය පරීක්ෂා කර සුදුසුකම් මත ඉහළ තනතුරක් පිරිනමා ඇති බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	වියදම් සඳහා නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වැය විෂයන් 02 ක රු. 2,995,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.	ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කළ යුතුයි.	සැලසුම් කරන ලද මිලදී ගැනීමේ කාර්යයන්ට අවශ්‍ය අනුමැතීන් ලබාගත් කාලය ගිණුම් පියවීමට තදාසන්න වූ බැවින් වියදම් දැරීමට නොහැකි වූ බව.
(ආ)	කොරියානු ආධාර මත අඩු අදායම්ලාභී පවුල් වෙත බෙදා දීම සඳහා රෙදිපිළි හා භාණ්ඩ වරායෙන් නිදහස් කර ගැනීමට 331-2-2-2509/17 වැය විෂය යටතේ ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 66 යටතේ රු. 9,525,865 ක් මාරු කර තිබුණද එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.	අවශ්‍යතාවය අනුව පමණක්ම මු.රෙ. 66 ප්‍රකාරව මාරු කර ගැනීම් සිදු කළ යුතුයි.	භාණ්ඩ තොගය නිදහස් කර ගැනීම සඳහා අවශ්‍යව තිබූ ඇතැම් අනුමැතීන් 2024 දෙසැම්බර් 31 දිනට නොලැබුණු බව.
(ඇ)	අපේක්ෂිත වැය නොදැරීම, ප්‍රතිපාදන උපයෝජනය කර නොගැනීම හේතුවෙන් වැය විෂයන් 06 ක රු. 7,700,000 ක මුළු ප්‍රතිපාදනයෙන් රු. 5,544,431 ක් ඉතිරි වී තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 50 සිට සියයට 91 දක්වා පරාසයක පැවතුණි.	ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කළ යුතුයි.	ප්‍රතිපාදන ඌන උපයෝජනය වළක්වා ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර විධිවිධාන මේ වන විට සලසා ඇති බව.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2024 දෙසැම්බර් 31 දිනට, වර්ෂයට අදාළ බැරකම් හා බැදීම් ලෙස SA -92 අනුව රු. 11,531,005 ක් ලෙස සටහන් වුවත් 2023 වර්ෂයට අදාළ බැරකම් ලෙස පැවති 2024 වර්ෂයේදී ගෙවීම් කරන ලද රු. 11,491,078 ක් බැරකම් ලෙස සටහන් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ බැරකම් එම වටිනාකමින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.	බැරකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි.	2024 වර්ෂයට අදාළ බැරකම් වාර්තාව සිගාස් පරිගණක මෘදුකාංගය මගින් සකස් කිරීමේදී 2023 වර්ෂයට අදාළ බැරකම් ද සමග සකස් වී ඇත. මෙවැනි අතපසුවීම් සිදුවීම වළක්වා ගැනීමට කටයුතු කරන බව.

2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම
2024 දෙසැම්බර් 31 දිනට සේවකයින් 62 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 2,177,121 ක් වසර 1 සිට වසර 20 කට අධික කාලයක් හිඟ හිට පැවතුණි. මෙම ණය ශේෂය තුළ වසර 5 ත් 10 ත් අතර හිඟ හිටි ශේෂය රු. 630,731 ක් ද වසර 10-20 ත් අතර ශේෂය රු. 140,120 ක් ද වසර 20 ට වැඩි හිඟ හිටි ශේෂය රු.162,402 ක් ද වශයෙන් පැවතුණි. මේ සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 මාර්ගෝපදේශ අංක 01 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	තවදුරටත් නිරවුල් කළ යුතු ශේෂ හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව.

2.4 තැන්පත් ශේෂයන්

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණය පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම
පොදු තැන්පත් ගිණුමේ කාල විශ්ලේෂණ වාර්තා අනුව 2024 වර්ෂයට අදාලව ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල තැන්පත් වර්ග 04 ක් පවත්වාගෙන යන අතර එයට අදාල නිරවුල් නොකළ තැන්පත් ශේෂය රු. 2,387,236,132 කි. ඉන් අවුරුදු 1-2 අතර ශේෂය රු. 2,033,468 ක්ද අවු 2-5 අතර ශේෂය රු. 3,912,260 ක්ද අවුරුදු 5 ට වැඩි ශේෂය රු. 2,375,752,987 ක් ද විය.	රු මිලියන **2374** ක මුදල දෙපාර්තමේන්තුව යටතේ පවතින බැංකු මූල්‍ය අංශයට ගෙවිය යුතු බැවින් හා එම අංශය සතු කිසිදු අරමුදලක් නීත්‍යානුකූල නොවන බැවින් දෙපාර්තමේන්තුව හා බැංකු මූල්‍ය අංශය අතර ගිණුම් සටහන් මගින් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි.	සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා ලබාගෙන ඇති මුදලේ තවදුරටත් පියවිය යුතු, දෙපාර්තමේන්තුවේ පොදුතැන්පත් ගිණුමේ පවතින රු.මි.2,374 ක මුදල භාණ්ඩාගාරයේ ප්‍රතිපූරණය කර ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට අවසන්වරට 2025 අප්‍රේල් 03 වන දින කැබිනට් සංදේශයක් පිළියෙල කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	බැංකු ගිණුම්හි 2024 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර මාස 6 ඉක්ම වූ ගෙවීමට ඉදිරිපත් නොවූ එකතුව රු. 100,970 ක් වූ චෙක්පත් 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	ලිඛිත නිවේදයක් නිකුත් කර ඒ අනුව ගෙවීම් සඳහා චෙක්පත් ඉදිරිපත් නොකළ හොත් මු.රෙ.396 ප්‍රකාරව කටයුතු කර අදායමට බැර කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව
(ආ)	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය යටතේ ජංගම ගිණුම් 11 ක් හා ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ගිණුම් වල 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 48,111,167 ක් පැවතුණි. මුදල් රෙගුලාසි 381 ප්‍රකාරව මෙම ජංගම ගිණුම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි.	මෙම ගිණුම් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොමැති අතර අධිකාරියක් තුළ ක්‍රියාත්මක වන මෙවැනි ගිණුම් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. මේ වන විට ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා තවදුරටත් පවත්වාගෙන යායුතු අත්‍යවශ්‍ය ගිණුම් 06 ක් හඳුනාගෙන ඇත. අනෙකුත් ගිණුම් 05 අවසන් කිරීමට (වසා දැමීමට) යෝජනා කර ඇත. තවදුරටත් පවත්වාගෙන යායුතු ගිණුම් සඳහා අවශ්‍ය අනුමැතීන් ඉදිරියේදී ලබාගැනීමට කටයුතු කරන බව.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	අක්කර 2 ක ප්‍රමාණයකින් යුත් සමනල වැව පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ හොඳින් වැඩුනු ඵලදාව	වත්කම් උපරිමව භාවිතා කර ආදායම් ලබා ගත යුතුයි.	පුහුණු කාර්යයන් කෙරෙහිම පමණක් අවධානය යොමු කර පැවති බැවින් පුහුණු මධ්‍යස්ථාන

	ලබන ගම්මිරිස් වැල් 200 ක් පමණ අතර එම වගාව දීර්ඝ කාලයක සිට නඩත්තු කර නොතිබුණු බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. 2016 වර්ෂයේදී ගම්මිරිස් වගාවෙන් ලැබී තිබූ ඵලදාව රු. 4550 ක් ද ඉන් වසර 8 කට පසුව 2024 වර්ෂයේදී රු. 20,000 ක් ද පමණක් ආදායම් වශයෙන් දෙපාර්තමේන්තු ගිණුමට බැර කර තිබුණි.		භූමියෙන් ලබන ආදායම හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රමුඛ අවධානයක් යොමු නොවන බව.
(ආ)	සම්බාල වැව පුහුණු මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් පොහොර අංගනය ඉදිකිරීම සඳහා රු. 619,945 ක් වැයකර තිබුණ අතර 2021 දෙසැම්බර් සිට 2022 අප්‍රේල් දක්වා නිෂ්පාදන ධාරිතාවය කිලෝ ග්‍රෑම් 5700 ක් විය. ඉන් 2021 දෙසැම්බර් මස කිලෝ ග්‍රෑම් 500 ක් මෙම මධ්‍යස්ථාන ඉඩමේ වගා කරන ලද තේ වගාවට ලැබුණු ප්‍රතිපාදන වලින් මිලදී ගෙන එම වගාවට යොදවා රු. 7500 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. ඒ අනුව මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් පොහොර අංගනය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්කාර්යව පැවතුණි.	වත්කම් උපරිමව භාවිතා කර ආදායම් ලබා ගත යුතුයි.	මෙම පොහොර අංගනය සක්‍රීය කර තේ වගාව සඳහා උපයෝජනය කරගත හැකි ආකාරය පිළිබඳව වාර්තාවක් ලබාදෙන ලෙස පුහුණු සහ ජීවනෝපාය අංශභාර මාණ්ඩලික නිලධාරීන්ට පවරනු ලදී. අදාල වාර්තා ලද පසුව මෙම කොම්පෝස්ට් පොහොර අංගනය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව.
(ඇ)	සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 02 ක් කේන්ද්‍ර කරගත් "අංග සම්පූර්ණ ගෘහ ජෛවාසිත ආර්ථිකයක්" වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 11 ක ප්‍රතිලාභීන් 20 දෙනෙකුගේ ව්‍යාපෘති අසාර්ථක වී තිබුණත්, ඔවුන් වෙත රජයේ දායකත්වය ලෙස රු.723,453 ක් වැයකර ලබාදී තිබුණු උපකරණවල වටිනාකම් ගිවිසුම් ප්‍රකාරව ආපසු අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන්	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩසටහන් වල ප්‍රගතිය සමාලෝචනය කළ යුතුයි.	පිළිතුර ලබා දී නොමැත.

රජයේ වියදම් නිෂ්කාර්ය වියදම් වී තිබුණු අතර රජයේ දායකත්වය වශයෙන් රු.809,510 ක වැයක් දරා ප්‍රතිලාභ සැලසූ ප්‍රතිලාභීන් 23 දෙනෙකු විශ්‍රාමික දින දක්වාම අස්වැසුම් සහනාධාර ලබා ගන්නා පවුල් වීම තුලින් එම පවුල් "සවිබල ගැන්වීම" සිදුවී නොතිබුණු බැවින් ඒ සඳහා වැයකළ මුදල් ද නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.		
(ඈ) සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 02 ක් කේන්ද්‍ර කරගත් "අංග සම්පූර්ණ ගෘහ ජෝවාසික ආර්ථිකයක්" වැඩසටහනෙහි අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 07 කට රජයේ දායකත්වය ලෙස එකතුව රු.188,412 ක් වැයකර ලබා දී තිබූ උපකරණ හා වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ දායකත්වය එකතුව රු.1,003,388 ක් වැයකර ප්‍රතිලාභීන් 32 ක් වෙත බෙදා දී තිබුණු උපකරණ නිෂ්කාර්යව පැවතීමට හෝ විනාශවීමට ඉඩහැර තිබුණු බැවින් රජයේ මුදල් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	වැඩසටහන් වල ප්‍රගතිය පිළිබඳ ලබා දී නොමැත. සමාලෝචනය කළ යුතුයි.	

3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරියගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂ 331-2-2-3-2509-0-11 යටතේ භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මිලියන 50 කින් සවිබල ගැන්වීම සඳහා රු. මිලියන 43.40 ක් භාවිතා කර තිබූ අතර එම වියදමින් රු. මිලියන 20.59 ක් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වෙනත් කටයුතු වෙනුවෙන් වැය කර තිබුණි. සවිබල ගැන්වීමේ වැඩසටහන් වෙනුවෙන්	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුයි.	2024 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වෙනුවෙන් වැය වී ඇති මුදල රු.මි. 43.41 ක් වන අතර, ඉන් නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම වෙනුවෙන් වියදම් කර ඇති මුදල රු.මි.4.48 කි.

වැය කර තිබූ රු. මිලියන 22.52 කි. එනම් මුළු වියදමින් සියයට 51 ක් පමණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කිරීම උදෙසා ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම වුවද දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදමක් වන වැටුප් හා වේතන ගෙවීම වෙනුවෙන් රු. මිලියන 20.51 සමාලෝචිත වර්ෂයේදී වියදම් කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ සේවක පිරිවැය දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට දරන පිරිවැයට සාපේක්ෂව ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 14 ඇමුණුම 1 හි සඳහන් පරිදි පරිච්ඡේදයන් අන්තර්ගත කර පිළියෙල කර නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	රාජ්‍ය මුදල් මාර්ගෝපදේශ අංක 14හි ඇමුණුම 1 හි සඳහන් පරිදිම පිළියෙල කරනු ලබන කාර්යසාධන වාර්තාව පෙබරවාරි 28 දිනට ඉදිරිපත් කිරීමේ ප්‍රායෝගික අපහසුතා පවතින බව.

3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුව සතු ඩිෆෙන්ඩර් ජීප් රථය, මිට්සුබිෂි පජෙරෝ ජීප් රථය සහ වෑන් රථය කාර්මික නිලධාරී නිර්දේශයක් හා විධිමත් අනුමැතියකින් තොරව පෞද්ගලික ගරාජ් 2 ක් වෙත යොමුකර තිබුණද ගරාජ් වෙත යොමු කල දිනයන් ප්‍රවාහන අංශය සතුව නොතිබුණි. මෙම වාහන සම්බන්ධයෙන් අවසන් වරට ලිපිගොනු පවත්වා තිබුණේ පිළිවෙලින් 2017,2019 සහ 2018 වර්ෂවලදී ය. ඒ අනුව මෙම වාහන ගරාජ්වල ගාල් කර වසර 5 සිට 7 දක්වා ගත වී තිබුණද වාහන සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගෙන නිශ්කාර්යව පැවතුණි.	වත්කම් විධිමත්ව භාවිතා කළ යුතු අතර නිශ්කාර්යව නොතබා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි.	වාහන 02 අපහරණය කිරීමට හඳුනා ගෙන ඇති අතර, ඒ අනුව අපහරණය කිරීම සඳහා තක්සේරු කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
(ආ)	සම්නල වැව පුහුණු මධ්‍යස්ථානයේ නයි මිරිස් වගාව සඳහා පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ වර්ග අඩි 800 ක හරිතාගාරයක් ඉදිකර ඒ සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් 2023 වර්ෂය තුළ රු. 293,080 ක් වැයකර තිබුණ ද වර්තමානය වන විට නිශ්කාර්යව පැවතුණි.	වත්කම් ඵලදායී ලෙස භාවිතා කළ යුතුයි.	මෙම හරිතාගාරය යම් කාර්යයන් සඳහා උපයෝජනය කරගත හැකි අකාරය පිළිබඳව වාර්තාවක් ලබාදෙන ලෙස පුහුණු සහ ජීවනෝපාය අංශභාර මාණ්ඩලික නිලධාරීන්ට පවරන ලදී. අදාල වාර්තා ලද පසුව මෙම හරිතාගාරය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව.
(ඇ)	දෙපාර්තමේන්තු මූල්‍ය චක්‍රලේඛ 2024/04 ප්‍රකාරව පුහුණු මධ්‍යස්ථානය භාර නිලධාරී විසින් විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙන පුහුණු මධ්‍යස්ථානවල එම ඉඩම උපරිම ආදායම් උත්පාදනය කිරීමට හැකිවන පරිදි වගා කටයුතු සිදු කිරීමට හා දැනට තේ සහ පුළුව අපනයන බෝග වගා කර ඇති මධ්‍යස්ථානවල නඩත්තු කිරීමත්	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාත්මක ආදායම් උත්පාදන ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම මෙම තත්වයට බලපා ඇති බව හඳුනා ගැනීමෙන් අනතුරුව එම කාර්යයන් අධීක්ෂණය ප්‍රධාන කාර්යාලයේ ජීවනෝපාය අංශය යටතට පත් කළ බව.

	ආදායම් එකතු කිරීමත් පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු බව දන්වා තිබුණද ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය කරගැනීම සඳහා කටයුතු කිරීමට සහ ආදායම් එකතු කිරීමට කටයුතු කර නොමැති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. නිල්ලම් පුහුණු මධ්‍යස්ථානයේ අක්කර 21 ක් පමණ ඇති ඉඩමෙන් වගාකර තිබූ බිම් ප්‍රමාණයට අක්කර 2 ක් වූ අතර 2023 හා 2024 වර්ෂවලදී වගා ආදායම් ලෙස ලබාගෙන තිබූ මුදල පිළිවෙලින් රු. 635,870 ක් හා රු. 764,748 ක් පමණි.		
(ඇ)	පුහුණු මධ්‍යස්ථානයේ ගබඩා කර තිබුණු 2014 වර්ෂයේදී බැංකු කාර්යමණ්ඩලය පුහුණු කිරීම සඳහා මිලදී ගනු ලැබූ නෙට්වර්ක් යුනිට් **(Network unit)** 5 ක්, ඩිෆෙන්ඩර් **(Defender)** 01 ක්, මොනිටර් **(Monitor)** 04 ක්, වෙබ් කැමරා **(Web camera)** 01 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.	වත්කම් නිශ්ක්‍රියව නොතබා ඵලදායී ලෙස යොදා ගත යුතුයි.	රත්නපුර දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය එම අවශ්‍යතා සඳහා මෙම උපකරණ තමන් වෙත ලබාදෙන ලෙස ඉල්ලා ඇති බැවින් ඊට අදාල කටයුතු සිදු කරන ලෙස ප්‍රධානකාර නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇති බව.
(ඈ)	පොළොන්නරුව දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට අයත් කැබ් රථයක් 2019 ඔක්තෝබර් 02 වන දින සිට පණගැන්විය නොහැකි ලෙස අක්‍රිය තත්ත්වයෙන් , දිරාපත් වෙමින්, ස්වභාවික ආපදා වලට ලක් වෙමින් පවතින අතර, මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි.	වාහනය ධාවනයෙන් ඉවත් කර ඇති බව හා අපහරණයට යොමු කිරීමට නියමිත බව.

3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	වැඩසටහන අංක හා නාමය 01 මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර තිබූ ඇමුණුම් (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ රු. 25,000 ට වැඩි සිද්ධි 03 ක වටිනාකම රු. 1,150,000 ක් ලෙස දක්වා ඇති තොරතුරු හා දෙපාර්තමේන්තු හානි හා පාඩු පිළිබඳ ලේඛනයේ තොරතුරු සමඟ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	ආයතනයේ ලෑන්ඩ් කෲෂ රථයක රියදුරෙකු විසින් නිසි බලධාරියෙකුගේ අවසරයකින් තොරව 2024 දෙසැම්බර් 30 දින රැගෙන ගොස් අතුරුගිරිය ප්‍රදේශයේ අධිවේගී මාර්ගයේදී අනතුරකට ලක් වී තිබුණි. රියදුරුගේ හිතත්කම හේතුවෙන් සිදු වූ අනතුරක් බැවින් අදාළ රක්ෂණ සමාගම රු. 693,000 ක හානිය ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි බව දන්වා තිබුණි. දෙපාර්තමේන්තුව තුළ වාහන පාලනය සම්බන්ධ නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වී ඇති බව නිරීක්ෂණය වූ අතර අදාළ පාඩුව විගණිත දිනය දක්වා ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අලාභය අයකර වාහනය අලුත්වැඩියා කටයුතු ඉක්මනින් සිදුකර අවසන් කළයුතුය.	2024 දෙසැම්බර් 30 දින සිදු වූ අනතුරින් සිදු ව ඇති අලාභය අදාල රියදුරුගෙන් අය කිරීමට මු.රෙ. 104 පරීක්ෂණය අනුව තීරණය කර ඇත. ඒ අනුව අලාභය අයකර ගැනීම සම්බන්ධව රියදුරු වෙත ලිඛිතව දන්වා ඇති බව.
(ii)	ආයතනයේ ලෑන්ඩ් කෲෂ රථයක 2024 නොවැම්බර් 18 දින සිදු වූ අනතුරට අදාළව මුදල් රෙගුලාසි 104 (4) යටතේ අලාභයන් පිළිබඳ පරීක්ෂණයක් සිදු කර	අනුමත මුදල කඩිනමින් අයකර ගත යුතුයි.	2024 නොවැම්බර් 18 දින සිදු වී ඇති අනතුරට අදාලව අළුත්වැඩියාව සඳහා රක්ෂණ ආයතනය අනුමත කරන ලද මුදල රු. 55,000 කි .නමුත් එම

	ප්‍රතිසම්පාදන අගය හෝ අලුත්වැඩියා කිරීමේ වියදම රු. 55,000 ලෙස තක්සේරු කර තිබූ අතර රක්ෂණ ආයතනයෙන් අනුමත කර තිබූ එම මුදල අයකර නොගෙන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි.		මුදල එම ආයතනය මඟින් මෙතෙක් ලබාදී නොමැත. එය කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.
(ආ)	වැඩසටහන් අංක හා නාම 2 සංවර්ධන වැඩසටහන් යටතේ රු. 25,000 වැඩි සිද්ධි 05 ක එකතුව රු. 1,220,964 ක් වටිනාකම පැවති අතර එහිදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	අම්පාර දිස්ත්‍රික්ක කාර්යාලයට අදාළ කැබ් රථයක් සම්බන්ධයෙන් 2024 සැප්තැම්බර් 26 දින සිදු වූ අනතුර වෙනුවෙන් අදාළ රක්ෂණ සමාගමෙන් චෙක්පතක් මඟින් රු. 209,300 මුදලක් ලැබී තිබූ අතර එම මුදල හානි හා පාඩු ප්‍රකාශයේ ඇතුළත් කර තිබෙන බව නිරීක්ෂණය විය. එසේම මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව අලාභයක් පිළිබඳ පරීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	හානි හා පාඩු නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුයි.	2024 ජනවාරි 26 දින සිදුව ඇති අනතුරට අදාල මු.රෙ.104 (4) ප්‍රකාරව සිදු කරන ලද පරීක්ෂණ වාර්තාව ප්‍රධාන කාර්යාලය වෙත ලබා දෙන ලෙස දන්වා ඇති බව.
(ii)	ආයතනයේ කැබ් රථයක් 2024 ජූලි 27 දින දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂතුමාගේ නිවස ඉදිරිපිට නවතා තිබියදී අනතුරක් සිදු වී තිබූ අතර ඒ සඳහා අදාළ රක්ෂණ සමාගමෙන් රු. 72,889 ක් අංක 040504 දරණ චෙක්පතක් ලැබී තිබූ අතර එම ලැබුණු මුදල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර තිබුණි.	හානි හා පාඩු නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුයි.	නිරීක්ෂණය හා එකඟ බව.

(iii)	එසේම 2024 දෙසැම්බර් 20 දින අධ්‍යක්ෂ (පාලන) විසින් ඉහත සඳහන් වාහනයේ ඉදිරිපස විදුරුව අලුත්වැඩියාවට අදාළ ගෙවීම් ලැබෙන තෙක් අලුත්වැඩියාව සිදුකළ ආයතනයේ වාහනය රඳවා ගෙන තිබෙන බැවින් රක්ෂණ ආයතනයෙන් ලද මුදලට අමතරව අළුත්වැඩියාව සිදු කරන ලද එම ගරාජයට ගෙවිය යුතු මුදල රු. 111,163 ක් විය.	හානි හා පාඩු නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුයි.	වාහනයේ ඉදිරි වින්ඩ්ස්ක්‍රීනය අළුත්වැඩියාව සඳහා රක්ෂණ ආයතනයෙන් මුළු අළුත්වැඩියා වියදම් ලබා නොදීම මත ආයතනය වෙතින් වාහනය රැගෙන ඒම සඳහා ඉතිරි මුදලට අදාළව රු 111,163 ක ගෙවීම් වවුචරය නිර්දේශය කළ නමුත් ඒ සඳහා ගෙවීම් කර නොමැති බව.
(ඇ)	කැබ් රථයක් 2024 මැයි 16 දින ජීවගෝලය සංවර්ධන අංශයේ අධ්‍යක්ෂවරයා රාජකාරි නිමාවී නිවසට යන අවස්ථාවේ රථයේ තිරිංග ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අනතුරක් සිදු වී තිබුණි. හානි පාඩු ලේඛනයේ නැවත සැපයීමට යන වියදම් නැතහොත් අලුත්වැඩියා කිරීමට යන මුදල රු. 402,000 ලෙස සටහන් කර තිබුණද මුදල් රෙගුලාසි 104(4) යටතේ අවසාන වාර්තාවේ අලුත්වැඩියා කිරීම් වියදම ලෙස රු. 309,190 ලෙස තක්සේරු කර තිබුණි. ඒ අනුව හානි පාඩු ලේඛණය හා මුදල් රෙගුලාසි 104 (4) වාර්තාවට අනුව අළුත්වැඩියා වියදම් රු. 92,810 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් රක්ෂණයෙන් අය කර ගැනීමට නොහැකිව අලාභය රු. 77,610 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ රු. 402,000 ලෙස ගිණුම් ගත කර තිබුණි.	පරීක්ෂණ පවත්වන නිලධාරීන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර වාර්තාව නිවැරදිව පිළියෙළ කළ යුතු අතර හානි හා පාඩු නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුයි.	මු.රෙ.**104(4)** යටතේ අලාභය පිළිබඳව අවසාන වාර්තාවේ අලුත්වැඩියා කිරීමේ වියදම ලෙස සඳහන් කර ඇති මුදල **220,890** ක් ලෙස නොව රු **313,700** ක් ලෙස නිවැරදි විය යුතු බව කාරුණිකව සඳහන් කරමි. තවද,එම අලාභයට අමතරව **88,330** ක් ද පවතී. අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ රු. **313,700** ක් වූ වියදම් ඇස්තමේන්තුව සඳහා රු.**220,890** ක මුදලක් රක්ෂණ ආයතන මගින් ආවරණය කර තිබූ බව හා අලුත්වැඩියා කිරීම සඳහා යොමු කර තිබූ ආයතනය වෙත ඉහත මුදලට අමතරව රු. **77,610** ක මුදලක් ගෙවීමට ඇත. ඒ අනුව හානි හා පාඩු ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරන බව.

3.6 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරියගේ අදහස් දැක්වීම
(අ)	ධාවන තත්ත්වයේ නොපවතින වාහන 15 ක් සඳහා නිශ්කාර්ය ලෙස 2022/2023 වර්ෂය සහ 2023/2024 වර්ෂය වෙනුවෙන් රු.326,283 ක මුදලක් රක්ෂණ වාරික මුදල් ගෙවා තිබුණි.	අනාර්ථික වියදම් දැරීම සිදු නොකළ යුතු අතර වියදම් සඳහා බිලය දීම, අනුමත කිරීම,සහතික කිරීම, සිදු කරන නිළධාරීන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2025 වර්ෂයේදී වාහන රක්ෂණය කිරීමේදී ධාවන තත්ත්වයේ පවතින වාහන පමණක් රක්ෂණය කිරීමට කටයුතු කරන බව.
(ආ)	2023 වර්ෂයේ දෙසැම්බර් මස සිට රජය විසින් සමෘද්ධි සහනාධාර වැඩසටහන අත්හිටුවා සමාජ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් අස්වැසුම වැඩසටහන හඳුන්වා දී තිබුණි. ඒ අනුව වසර 3 ක් තුළ අස්වැසුම ප්‍රතිලාභී පවුල් මිලියන 1.2 ක් ආර්ථික සමාජීය හා මානසික වශයෙන් සවිබල ගැන්වීමට දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් අස්වැසුම වැඩසටහනට සමගාමීව අස්වැසුම් දත්ත පද්ධතියෙන් සවිබලගැන්වීමට අදාළ අතිරේක තොරතුරු එක්කොට CRM මොඩියුලය යාවත්කාලීන කර නොතිබුණ නමුත් 2024 ජනවාරි සිට මැයි දක්වා රු. 1,430,004 ක් දෙපාර්තමේන්තු වැය විෂයයෙන් CRM මොඩියුලය පවත්වාගෙන යාම සඳහා ගෙවා තිබූ මුදල නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.	නිශ්චිත කාර්යයකින් තොරව වියදම් නොදැරිය යුතුයි.	සවිබල ගැන්වීමේ වැඩ සටහන නිශ්චිත නොවූ බැවින් 2024 වර්ෂයේ **CRM** මොඩියුලය තුල තිබූ ප්‍රතිලාභී දත්ත යාවත් කාලීන නොකරන ලද අතර මේ සඳහා රු. 1,430,004 ක මුදලක් **SLT** ක්ලවුඩය සඳහා **CRM** පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා ලබා ගෙන තිබූ ධාරිතාවයන් සඳහා ගෙවීම් කරන ලද බව .

3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2013 අංක 1 දරන දිවිනැගුම ආඥාපනතේ 36 වගන්තිය යටතේ දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, තෑගි පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් තෑගි වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා තීරණය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකර ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම සංවර්ධන අරමුදලට බැරකල යුතු වුවත් අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි. දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවීමට භාණ්ඩාගාරයේ විරෝධතාවයක් නොමැති බව 2021 මැයි 03 දන්වා තිබුණි.	පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදල පිහිටුවීමට කටයුතු කළ යුතුයි.	අරමුදල් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති විමසා ඇති බැවින් නීතිපති විසින් ලබාදෙන උපදෙස් සළකා බලා මෙම සම්බන්ධයෙන් ද ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.
(ආ)	ලියාපදිංචි අංක PA-3391 දරන කැබ් රථය 2020 මාර්තු 05 දින කාර්මික දෝෂයක් හේතුවෙන් පෞද්ගලික ගරාජයක් වෙත යොමු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 4කටත් වැඩි කාලයක් ගත වී තිබුණත් වාහනය අළුත්වැඩියා කටයුතු නිම කර නොතිබුණි.	මෙතරම් දීර්ඝ කාලයක් ගත නොකර කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතුයි.	රථයේ අමතර කොටස්වල පවතින දුබලතාවය මත අළුත්වැඩියා නිම කිරීමට කාලයක් ගතවී ඇති බව.
(ඇ)	ලියාපදිංචි අංක 65-9180 දරන ප්‍රාඩෝ රථය 2021 පෙබරවාරි 28 දින කාර්මික දෝෂයකට ලක් වී තිබුණු අතර 2021 මාර්තු 02 පෞද්ගලික ගරාජයක් වෙත යොමු කර තිබුණි. 2022 මැයි 25 දින රු. 2,301,100 ක ඇස්තමේන්තුවක් ගරාජය විසින් ඉදිරිපත් කර තිබුණි.	අලුත්වැඩියා සඳහා යොමු කළ පසු කඩිනමින් සිදු කිරීමට හෝ නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි.	වාහනයේ එන්ජිම අලුත්වැඩියාව සඳහා යොමු කළ ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුවට අනුව අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින් අපහරණය කිරීමට තීරණය කර ඇති බව.

	නමුත් දෙපාර්තමේන්තුවේ අදාළ වගකිව යුතු නිලධාරීන් ඇස්තමේන්තුවට ප්‍රතිචාර නොදක්වා සිටීම හේතුවෙන් ගරාජයෙන් මේ දක්වා දරන ලද රු. 63,500 ක් සහ 2022 මාර්තු 15 දින සිට නැවත රැගෙන යන දිනය දක්වා ආරක්ෂිතව ගාල් කර තැබීම වෙනුවෙන් දිනකට රු. 500 මුදලක් අයකරන බව ගරාජයෙන් දන්වා තිබුණි. මේ අනුව කළමනාකරණයේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් දෙපාර්තමේන්තුවට විශාල පාඩුවක් දැරීමට හා රජයේ සම්පත් විනාශවීමට ඉඩහැරීමක් සිදු වී තිබුණි.		
(ඇ)	2022 වර්ෂයේ ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකු සහනාධාර ගෙවීම සම්බන්ධයෙන් CRM පද්ධතියෙන් තොරතුරු ලබාගැනීමේදී ගැටළු මතුවීම, නිවාස ලොතරැයි දිනුම් ඇදීමේදී තොරතුරු යාවත්කාලීන නොවීම හා සමෘද්ධිලාභීන්ගේ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොවීම ආදී ගැටළු පැවතියදී නැවත වතාවක් CRM මොඩියුලය සක්‍රීය කිරීමට කටයුතු කර තිබූ අතර එසේ කිරීමට ඇති අවශ්‍යතාවය කුමක්ද යන්න ගැටළු සහගත වන අතරම CRM පද්ධතිය තුළින් ලබාගත් සමෘද්ධිලාභීන්ගේ තොරතුරු අස්වැසුම් දත්ත පද්ධතිය සමඟ සම්බන්ධ කිරීමට හැකියාවක් පවතීද යන්න සොයා බැලීමකින් තොරව වසරක කාලයක් සඳහා CRM පද්ධතිය නඩත්තු කිරීම සඳහා තාක්ෂණික කමිටු ඇගයීම් නිර්දේශය ලබාදීම, ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කිරීම හා ගිවිසුම් අත්සන් කිරීම තුළින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1.2 වගන්තිය ප්‍රකාර ප්‍රසම්පාදන	ප්‍රසම්පාදනයන් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා පමණක් සිදු කළ යුතුයි.	පවුල් ලක්ෂ 12 ක් සවිබල ගැන්වීමේ කාර්ය පැවරීමත් සමඟ එම කාර්ය පරිගණක වැඩසටහන් ආධාරයෙන් තොරව සිදුකල නොහැකි බැවින් ඒ සඳහා අදාල යාවත්කාලීන කිරීම් සිදු කිරීම සඳහා නඩත්තු හා සේවා ගිවිසුමක් වසරක් සඳහා අත්සන් කර ඇති බව.

	ක්‍රියාවලිය තුළින් බලාපොරොත්තු වූ අරමුණ ඉටු වී නොතිබුණි.		
(ඉ)	රටවිරුවන් සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ණය ආපසු නොගෙවීම නිසා හෝ වෙනත් ක්‍රියාකාරකමක් නිසා සමෘද්ධි අධිකාරියට සිදුවන පාඩුවක් හෝ වියදමක් වේනොත් එය බෙදී යන ආකාරයෙන් ක්‍රියා කිරීමට එකඟව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2013 වර්ෂයේදී රු. මිලියන 100 ක මුදලක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙත ලබාදී තිබුණි. ඒ අනුව සමෘද්ධි බැංකු විසින් රටවිරුවන් 11,929 ක් සඳහා රු. 3,547,133,064 ක මුදලක් ණය වශයෙන් නිකුත් කර තිබුණි. රට විරුවෝ නිවාස ණය ව්‍යාපෘතිය සඳහා සමෘද්ධි අධිකාරිය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර 2012 මාර්තු 07 දින වසර 5 ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර එය 2018 මාර්තු 06 දිනෙන් අවසන් වී තිබුණි. නව අවබෝධතා ගිවිසුම ඉක්මනින් අත්සන් කර ණය ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී තිබූ නමුත් විගණිත දිනය වන තෙක් දෙපාර්තමේන්තුව විසින් නව අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි. ඒ අනුව තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු. 102,597,783 ක් වී තිබුණි.	අය විය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.	විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ සාකච්ඡා කළ අතර සුරැකුම් සහිත ණය සම්බන්ධයෙන් සහ ඉදිරි කටයුතු අවසන් නොවූ ණය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී දැරීමට සිදුවන යම් පාඩුවක් ඇත්නම් එම මුදල දෙපාර්තමේන්තුව අතර සම සමව බෙදාගැනීමටත් සුරැකුම් රහිත ණය නැවත අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතු බවත් නිවාස ණය ප්‍රවර්ධන වැඩසටහන් සඳහා වැය වූ මුදල් දෙපාර්තමේන්තුව අතර සමසේ බෙදා ගැනීමටත් තීරණය වූ අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව.
(ඊ)	මානව සම්පත් කළමනාකරණ මොඩියුලය තුළින් දෙපාර්තමේන්තු සේවකයන් සඳහා රාජකාරී හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම සිදුකර තිබුණේ 22,944 ක් වූ මුළු සේවක සංඛ්‍යාවෙන් 10,377 ක් සඳහා	රාජකාරී හැඳුනුම්පත් මොඩියුලය තුළින් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතුයි.	සියළුම දිස්ත්‍රික්කවලට එම කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව.

	පමණි. ප්‍රධාන කාර්යාලයේ හා කොළඹ, කුරුණෑගල හා මොණරාගල යන දිස්ත්‍රික්ක 3 හි ඉහත කාර්ය සඳහා තොරතුරු රැස්කිරීම අවම මට්ටමක පැවතුණි.		
(ඇ)	දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුවේ ලේඛන ස්කෑන් කර පද්ධතියට උඩුගත (upload) කිරීම සිදු කර තිබුණේ මුළු ලිපිගොනු සංඛ්‍යාව වූ 22,944 න් 4265 ක් පමණි. කුරුණෑගල හා මොණරාගල දිස්ත්‍රික්ක වල කිසිදු ලිපිගොනුවක් උඩුගත (upload) කර නොතිබුණි.	සියළුම නිලධාරීන්ගේ තොරතුරු පද්ධතියට ඇතුළත් කර මොඩියුලය යාවත්කාලීන කළ යුතුයි.	සියළුම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය කාර්යාල 2025.05.31 දිනට පෙර ලිපිගොනු උඩුගත කිරීම අවසන් කලයුතු බවට ද සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති බව.
(ඈ)	දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා විශ්‍රාම ලිපිගොනුවක් පද්ධතිය තුළින් සකස්කිරීම සහ ඒ ඒ වර්ෂයේ අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් වාර්තාවක් මුල්පිටුවට ඇතුළත් කිරීම හා එය ප්‍රධාන කාර්යාලයේ සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අංශවලින් හා මූලස්ථාන කාර්යාල වලින් ක්‍රියාත්මක කරනු ලබන බව දක්වා තිබුණද ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව විශ්‍රාම ලිපිගොනු කිසිවක් සම්පූර්ණ කර නොතිබුණි.	විශ්‍රාම යාමට ආසන්න නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට මූලිකත්වය ලබා දිය යුතුයි.	ස්කෑන්(SCAN) යන්ත්‍රවල පවතින හිඟය හා පෞද්ගලික ලිපිගොනුවල පවතින අඩුපාඩු හේතුවෙන් නිලධාරීන්ගේ සම්පූර්ණ පෞද්ගලික ලිපිගොනුවක් පද්ධතියේ සකස් නොවේ. නමුත් ගොනුවල පවතින අඩුපාඩු සකස් කර සම්පූර්ණ පෞද්ගලික ලිපිගොනුවක් පද්ධතියට ඇතුලත්කර අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් වාර්තාවක් මුල් පිටුවට ඇතුළත් කිරීමට පියවර ගත යුතු බව.
(ඉ)	2025 පෙබරවාරි 27 දිනට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමිතිවල අවසන් ගිණුම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විගණන මත පිළිබඳ ප්‍රගති වාර්තාව අනුව 2015 සිට 2022 දක්වා වසර 8 ක මූල්‍ය ප්‍රකාශන 9441 කින් 4347 ක මතය වාවනය කර ඇති අතර සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කර ඇත්තේ මූල්‍ය ප්‍රකාශන 784 ක පමණි. ඒ අනුව සමෘද්ධි බැංකු කළමනාකරුවන් විසින් එම බැංකු මනා අධීක්ෂණය	අභ්‍යන්තර විගණනය මෙන්ම විමර්ශන අංශයද බැංකු පද්ධතියේ කාර්යක්ෂමතාව වෙනුවෙන් උපරිම දායකත්වය ලබා දිය යුතු අතරම බැංකු හා සමිති විසින් ලබාදෙන නිර්දේශ අනුව ක්‍රියා කල යුතුයි.	අධීක්ෂණ හා විමර්ශන ඒකක වල නිලධාරීන් විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීම තුළින් සිදුවන අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව.

	විමර්ශන නිලධාරීන් විසින් නිවැරදිව විමර්ශනය කිරීමද, විගණන නිලධාරීන් විසින් සම්බන්ධිත බැංකුවල අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමද, මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට හා බැංකු පද්ධතියේ කාර්යක්ෂමතාවය, ඵලදායිත්වය ඉහළ නැංවීමට උපරිම දායකත්වයක් දක්වා නොතිබුණි.		
(ඪ)	2015 සිට 2022 දක්වා වර්ෂවල ප්‍රජාමූල බැංකු මූල්‍ය ප්‍රකාශන විගණනය කර සත්‍ය හා සාධාරණ මත නිකුත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 784 ක් අතරින් මූල්‍ය ප්‍රකාශන 34 ක බොල් ණය අනුපාත ඉහළ යාම හේතුවෙන් ලාභ විසර්ජනය සඳහා අවසර ලබා දී නොතිබුණු අතර 2025 පෙබරවාරි 27 දිනට ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත ලැබී තිබුණු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 9441 කින් ලාභ විසර්ජනය සඳහා අවසර ලබා දී තිබුණේ මූල්‍ය ප්‍රකාශන 2145 ක් සඳහා පමණි. මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට කොටස්කරුවන්ට ගෙවිය යුතු රු.බිලියන 9.71 ක ලාභාංශ ගෙවීමට නොහැකි වී තිබුණි.	කොටස්කරුවන්ගේ වාර්ෂික ලාභාංශ නියමිත කාලවකවානුවලදී ලබාගත හැකි වන පරිදි අඩුකර ගැනීමටත් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමටත් කටයුතු කළ යුතුයි.	කොටස්කරුවන්ට වාර්ෂිකව ලාභාංශ ගෙවීම ප්‍රමාද වී ඇති අතර, එම හේතුව නිසා කොටස්කරුවන්ට අවාසියක් සිදු නොවන පරිදි අනුමත ලාභාංශ තිබේ නම් ප්‍රකාශිත අතුරු ලාභාංශයෙන් ගෙවීමට හෝ එසේ නොමැති අවස්ථාවල 5% ක පොලියක් ගෙවීමට කටයුතු කර ඇති බව.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2020/13 හා 2020 සැප්තැම්බර් 27 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය මඟින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින්ම බාහිර විගණකයකු ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. ඒ අනුව 2016, 2017, 2018 හා 2019	දිවිනැගුම් සහන ප්‍රජාව සම්බන්ධිත බැංකු හා සමිති දෙපාර්තමේන්තු විගණනයට යටත් කර ඇති බැවින් විගණනය කිරීම වෙනුවෙන් බැංකු හා සමිති වලින් ඒ සඳහා මුදල් අයකළ නොහැකි බැවින් මෙම ලබාදුන්	සම්බන්ධිත සංවර්ධන දෙපාර්තමේන්තුවේ බැංකු කළමනාකරණ මණ්ඩලය විසින් අංක 2020/75/05 දරණ බැංකු කළමනාකරණ මණ්ඩල තීරණයට අනුකූලව ලබා දී ඇති බව.

32

	වර්ෂවලට අදාළව බාහිර විගණනය සිදු කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන්ට එක් විගණන වාර්තාවක් සඳහා රු. 3,000 ක් බැගින් බැංකු හා බැංකු සමිති 1007 කට අදාළව වාර්තා විගණනය සඳහා රු. 12,885,672 ක් බැංකු මූල්‍ය අංශය විසින් ගෙවා තිබුණි. මේ සඳහා 2020 ඔක්තෝබර් 15 දිනැති අංක 2020/75/05 දරන අභිනික කළමනාකරණ මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණ ද එය විගණන මූලික මූලධර්ම වලට පටහැනි බව හා ආයතන සංග්‍රහයට පටහැනි බව නිරීක්ෂණය විය. මේ පිළිබඳව පෙර වර්ෂයේ ද විගණනය විසින් පෙන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මුදල් අදාල නිලධාරීන්ගෙන් ආපසු අයකරගැනීමට කටයුතු කල යුතුයි.	
(ආ)	2022 වර්ෂයට අදාළව ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 1296 ක මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන මතයක් 2025 මාර්තු 30 දිනා වන විටත් නිකුත් කිරීම සිදු කර නොතිබුණි. තවද, 2023 වර්ෂයේ සම්බද්ධ බැංකු හා බැංකු සමිති වාර්ෂික මූල්‍ය ප්‍රකාශ විගණනය අභ්‍යන්තර විගණන අංශයට පැවරීමට ජාතික සභාව අනුමත කර ඇතත් දෙපාර්තමේන්තුවේ කළමනාරණ මණ්ඩලය විසින් ජාතික සභාවේ තීරණය අත්හිටුවා ඇති බැවින් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන අංශය මඟින් පනත ප්‍රකාරව පැවරී ඇති විගණනය නියමිත කාලය තුළ සිදු කිරීමට ක්‍රියා කල යුතුයි.	2022 වර්ෂයට අදාලව විගණන වාර්තා 159 ක් මේ වන විට නිකුත් කර ඇති බව හා ඉතිරි වාර්තා ද කඩිනමින් නිකුත් කළ හැකි තත්වයක පවතින බවත්, 2023,2024 වර්ෂවල හා ඉන් ඉදිරියට සම්බද්ධ ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති වල මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව ගෙන ඇති තීරණය අනුව විගණන ආයතන වෙත පැවරීමට බැංකු කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති බව.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	නිලධාරීන් 363 දෙනෙකු විසින් සිය පත්වීම් ලබා ගැනීමට පෞද්ගලික ලිපිගොනුවට ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන සහතික ව්‍යාජ සහතික බවට සනාථ වී තිබූ අතර ඉන් 77 දෙනෙකු සේවයෙන් පහකර තිබුණු අතර 20 දෙනෙකු පහත ප්‍රකාරව වන්දි ලබාගැනීමේ එකඟතාවයෙන් සේවයෙන් ඉවත් වී තිබුණි.නියැදි විගණනයට භාජනය වූ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් අතුරින් 13 දෙනෙකු හා විශ්‍රාම ගිය නිලධාරීන් 02 දෙනෙකු ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කර තම පත්වීම් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. ව්‍යාජ ප්‍රතිඵල සටහන් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන බාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් පළමු වන උපලේඛනය අනුව රජයේ නිලධාරීන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධයෙන් වන වරදක් සිදුකර ඇති බව හඳුනාගෙන තිබුණු නමුත් ඊට එරෙහිව සමාලෝචිත වර්ෂය තුළදී ද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටි රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුයි.	ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරන බව.
(ආ)	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2370/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ II පරිච්ඡේදයේ 14 වගන්තිය ප්‍රකාරව බලය	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව කටයුතු කළ යුතුයි.	මේ වන විට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් පිළියෙල කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව.

අභිනියෝජිත බලධරයා විසින්ම පමණක් එම අභිනියෝජිත බලතල ක්‍රියාත්මක කළ යුතු වුවත්, දිස්ත්‍රික්ක තුළ ස්ථානමාරු කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතියට යටත් නොකොට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මාරු මණ්ඩල වෙත බලය පවරා තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ... ආයතන සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ 255 වගන්තිය ප්‍රකාරව වාර්ෂික ස්ථානමාරු කමිටුවේ යෝජනාද, වාර්ෂික ස්ථාන මාරු යෝජනාද, වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන වාර්ෂික ස්ථානමාරු නියෝග නිකුත් කිරීමට බලය අභිනියෝජිත බලධරයා ක්‍රියා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. කාර්ය මණ්ඩලය සඳහා පෝෂක ලේඛනයක් ද පිළියෙල කර නොතිබුණි.		
(ඇ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශවලට අනුයුක්තව සේවයේ නියුතු නිලධාරීන්ගේ හා දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය කාර්යාල යටතේ අනුයුක්තව සිටින නිලධාරීන්ගේ සේවා කාලය අවුරුදු 20 ට වැඩි එකම අංශයක එකම කාර්යයක නියැළී සිටින නිලධාරීන් 145 ක් පමණක් අවුරුදු 06 හා සිට අවුරුදු 10 දක්වා නිලධාරීන් 382 ක් පමණක් නිරීක්ෂණය විය. මෙසේ දීර්ඝකාලීනව නිලධාරීන් ස්ථානමාරු නොකිරීමෙන් නිලධාරීයාගේ වෘත්තීය සංවර්ධනය, දක්ෂතා ප්‍රවර්ධනය, අත්දැකීම් ලබාගැනීම, ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීම ඇතුළු අරමුණු දෙපාර්තමේන්තුවට ඉටුකර ගැනීමට නොහැකි වී ඇති අතර ස්ථාන මාරු	18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මාරු කිරීම් සිදු කළ යුතුයි.	එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථාන මාරු කරන ලෙස සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් හා දෙපාර්තමේන්තුවේ සියළුම අංශ ප්‍රධානීන් චක්‍රලේඛ මඟින් දැනුවත් කර ඇති බව.

35

	කිරීමකින් තොරව දීර්ඝ කාලයක් එක් සේවා ස්ථානයක/ වසමක සේවය කිරීමෙන් මූල්‍ය වංචා ඇතුළු විවිධ අක්‍රමිකතාවන්ට යොමුවීමට ඉඩප්‍රස්ථා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.		
(ඇ)	ගම්පහ, ගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක 03 කට අදාළව වැඩබැලීම් සඳහා නිලධාරීන් 940 ක් පත්කර තිබුණු අතර එම නිලධාරීන් වෙනුවෙන් වැඩබැලීමේ හා වැඩ ආවරණය කිරීමේ දීමනාද ගෙවා තිබුණි. දිස්ත්‍රික්ක වල වැඩ බැලීමේ පත්වීම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ආවරණ අනුමැතිය යටත්ව දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් විසින් සිදුකර තිබුණි. දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ පත්වීම් බලධාරියා අධ්‍යක්ෂ ජනරාල් වන බැවින් හා වැටුප් හා දීමනා ගෙවීම ප්‍රධාන කාර්යාලය මඟින් සිදු කරන බැවින් ප්‍රධාන කාර්යාලය සතුව වැඩ බැලීම් පත්වීම් ලබාදීම් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගත යුතු වුවත් මේ සම්බන්ධව කිසිදු තොරතුරක් පවත්වා ගෙන ගොස් නොතිබුණ අතර අදාළ ස්ථිර පත්වීම් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි.	ආයතන සංග්‍රහය ප්‍රකාරව නිවැරදිව පත්වීම් ලබා දිය යුතුයි.	වැඩ බැලීම් සඳහා පත් කරන ලද නිලධාරීන් සම්බන්ධව තොරතුරු දිස්ත්‍රික් මට්ටමින් සකස් කර ඇති බව.

එච්.එම්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය - 04 - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක

අනු අංකය	වැඩසටහන	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
			100% -90%	75% -89%	50% -74%
01	අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන	සවිබලගැන්වීමේ වැඩසටහන පිළිබඳව දිස්ත්‍රික්ක හා ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 25 ක් පැවැත්වීම.			65%
02	සමාජ ආරක්ෂණ වැඩසටහන	උසස් පෙළ හදාරන සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන් 90,000 කට සිප්දොර ශිෂ්‍යත්ව ලබා දීම.	93%		
03	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	*කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති - 49 *ධීවර හා ජල ජීවී ව්‍යාපෘති - 40 *සත්ව පාලන ව්‍යාපෘති - 40 *කුඩා හා පුළුල් කර්මාන්ත ව්‍යාපෘති - 47 *අගය එකතු කළ ව්‍යාපෘති - 40 ක්‍රියාත්මක කිරීම.	90%		
04	ව්‍යවසාය සංවර්ධන වැඩසටහන	RPL ක්‍රමවේදය යටතේ 200 ක් සඳහා NVQ සහතික ලබාදීම.			71%
		අස්වැසුම හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් 13,324 සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.			
		ව්‍යවසායකයින් 4,613ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.			
		තරුණ තරුණියන් 500 සඳහා වෘත්තීය පුහුණු ලබාදීම.			
		තරුණ තරුණියන් 1,240 සඳහා භාෂා පුහුණුව ලබාදීම.			
05	නිවාස සංවර්ධන වැඩසටහන නිවාස 1410 ක් සඳහා මූල්‍යාධාර ලබා දීම. (වැය කරන ලද මුදල රු.මි. 623.10)	අඩු ආදායම්ලාභී පවුල් 1,410 කගේ නිවාස වැඩි දියුණු කිරීම සඳහා මූල්‍යාධාර ලබා දීම.	95%		
06	තොරතුරු තාක්ෂණ වැඩසටහන (සමෘද්ධි බැංකු ගණුදෙනු පරිගණක පද්ධති කාර්ය සිදු කිරීම.)	සමෘද්ධි බැංකු 1097 ක් හා සමිති 335 පරිගණකගත කිරීම.		75%	
		සමෘද්ධි බැංකුවල ජංගම යෙදවුම ක්ෂේත්‍ර නිලධාරීන් හරහා ක්‍රියාත්මක කිරීම.		60%	

අනු අංකය	වැඩසටහන	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
			100% -90%	**75% -89%**	**50% -74%**
07	මානව සම්පත් සංවර්ධන වැඩසටහන	අභ්‍යන්තර සේවකයින්ගේ ධාරිතාවය සංවර්ධනය සඳහා සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.			60%
08	ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන	අඩු ආදායම්ලාභී පවුල් 350,000 සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දීම.		88%	
09	සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන	දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 24 ක් පැවැත්වීම.			70%
		දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.	100%		

පරිච්ඡේදය – 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය (%)		
				0% - 49%	50% - 74%	75% - 100%
01	දුගී බව අවසන් කිරීම	2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම.	2025-2029 කාලය තුළ අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 20 ක් සවිබලගැන්වීම සඳහා තිරසර වැඩසටහනක් සකස් කිරීම.			90%
			සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් උත්පාදන මාර්ග වැඩි දියුණු කර ගැනීම සඳහා පවුල් 307,702 කට ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම.		70%	
		පහළ ආදායම් මට්ටමේ අයද ඇතුළත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම.	සමෘද්ධි සහනාධාරලාභී පවුල් 731 කගේ සමාජ ආරක්ෂණය ඉහල නැංවීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම. ප්‍රතිලාභීන් 1078 අලෙවි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. වැය කළ මුදල රු.111,717,776.82	25%		
			සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහනාධාරලාභී පවුල්වල උසස් පෙළ හදාරන ළමුන් 40,341 ක් සඳහා මාසිකව ශිෂ්‍යත්ව මුදලක් ලබා දීම තුළින් එම ළමුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම.			80%
02	ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය	කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම’	කුඩා අළෙවිසැල් 23 ක් සංවර්ධනය කර සමෘද්ධි ව්‍යවසායකයින්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම.		60%	
			සමෘද්ධි ව්‍යවසායකයින් 4613 සඳහා ව්‍යවසායකත්ව ධාරිතා සංවර්ධන පුහුණුව ලබා දීම.		70%	
			තරුණ තරුණියන් 397 සඳහා වෘත්තිය පුහුණුව ලබා දීම. තරුණ තරුණියන් 13,324 සඳහා වෘත්තීය (20%) මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.			80%
03	නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම.	සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල නිවාස 1400 ක් වැඩි දියුණු කර එම පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීම.		52%	

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

i. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල උසස් පෙළ හදාරන දරු දැරියන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන සිප්දොර ශිෂ්‍යාත්ව වැඩසටහන යටතේ, මසකට රු.1,500/- බැගින් මාස 24 ක කාලයක් සඳහා රු.36,000/- මූල්‍ය ආධාරයක් ලබා දෙන ලද අතර, ඒ අනුව 2024 වර්ෂය තුළ සමෘද්ධි සිසු දරු දැරියන් 40,341 ක් සඳහා සිප්දොර ශිෂ්‍යාත්ව ලබා දී ඇති අතර, ප්‍රදානය කළ මුළු ශිෂ්‍යාත්ව වටිනාකම රු.මි. 668.51 වේ.

ii. නව ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ, පවුල් 1078 සඳහා තේ පැළ, තවාන්,කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන, කොහු කර්මාන්තය, කුකුල් පාලන ව්‍යාපෘති, නිම් ඇඳුම් නිෂ්පාදන, වැල් දොඩම්, බුලත්, රටකජු වගාව ආදී ව්‍යාපෘති සඳහා ආධාර ලබා දීම. වැය කරන ලද මුදල රු.මි. 112 ක් වේ.

iii. නිවාස ලොතරැයි වැඩසටහන යටතේ, නිවාස ලොතරැයි දිනුම් ඇදීම මඟින් රු.250,000/- නිවාස ආධාර ප්‍රතිලාභීන් 654 දෙනෙකු සඳහා ද රු.750,000/- නිවාස ආධාර, ප්‍රතිලාභීන් 644 දෙනෙකු සඳහා ද, ලබා දෙන ලදී. ප්‍රදානය කරන ලද මූල්‍ය ආධාරයන්හි මුළු වටිනාකම රු.මි. 674.35 ක් වේ.

iv. අලෙවි පහසුකම් වැඩි දියුණු කිරීම් යටතේ කුඩා අළෙවිසැල් 23 ක් වැඩි දියුණු කිරීම තුලින් සමෘද්ධි ව්‍යවසායක පවුල්වල ජීවන මට්ටම ඉහල නැංවීමට ක්‍රියා කිරීම. වැයකරන ලද මුදල රු.මි. 1.02 ක් වේ.

v. දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097 ක් මඟින් සහන පොළි ප්‍රතිශතයන් යටතේ,සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසාය සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, ස්වයං රැකියා හා පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන්, ප්‍රතිලාභීන් 307,702 දෙනෙකු සඳහා රු.මි. 49,410.52 ක් ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දීම. ප්‍රජාමූල සංවිධාන හරහා ක්‍රියාත්මක කල අරුණලු ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 270,518 කු සඳහා රු.මි. 3,504 ක ණය ලබා දී ඇත.

vi. සමෘද්ධි ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 25 ක් පවත්වා ව්‍යවසායකයින් 4,415 කට ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම.

vii. තරුණ තරුණියන් 13,324 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.වැය කරන ලද මුදල රු.මි.1.97 කි.

viii. ප්‍රතිලාභී ගනුදෙනු කාර්යක්ෂම කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097 ක් සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335 ක් පරිගණකගත කිරීමට කටයුතු කිරීම.

ix. සමාජ සංවර්ධනය යටතේ ජාත්‍යන්තර දුම්වැටි විරෝධි සැමරුම් වැඩසටහන් 25වන ප්‍රජා වැඩසටහන් 87 ක්‍රියාත්මක කිරීම.

<u>අභියෝග</u>

1. දිස්ත්‍රික් මට්ටම් නිලධාරීන් හා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් පුරප්පාඩු පැවතීම නිසා ප්‍රාදේශීය මට්ටමේ දී සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දුෂ්කරතා මතු වීම.

2. සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක නොවීම නිසා නිවාස ලොතරැයි හා සමාජ ආරක්ෂණ අරමුදලට දායකත්ව මුදල් නොලැබීමෙන් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස වැඩසටහන් හා සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දුෂ්කර වීම.

පරිච්ඡේදය - 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සංඛ්‍යා සටහන - (XXIII)

අනුමත සේවක සංඛ්‍යාව (2024.12.31 ට අනුමත කාර්ය මණ්ඩලය අනුව)		පවතින සේවක සංඛ්‍යාව 2024.12.31 දිනට	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	131	63	68
තෘතීයික	369	1,431	1,062
ද්විතීයික	24,800	21,009	3,791
ප්‍රාථමික	431	441	-10
එකතුව	**25,731**	**22,944**	**4,921**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුවේ සමෘද්ධි බැංකු පද්ධතිය හා වෙනත් අරමුදල් මෙහෙයවීම සඳහා අවශ්‍ය ප්‍රශස්ථ කාර්යමණ්ඩල සංයුතිය සකස් කර 2021 ඔක්තෝබර් මාසයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ සඳහා අනුමැතිය ලැබී ඇත්තේ 2023 .11.01 දින වේ. ඒ අනුව පුරප්පාඩු තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. කාර්ය මණ්ඩලය පුරප්පාඩු වීම මත අභියෝග රැසකට මුහුණදීමට සිදුව ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

හැඳින්වීම

රාජ්‍ය ආයතන තුළ පවතින සම්පත් අතර මානව සම්පත ඉතා වටිනාම සම්පත වේ. අනෙකුත් සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින් අනෙකුත් සම්පත්වලින් උපරිම ඵලදායිතාවක් ලැබෙන ලෙස මෙහෙය වීමේ වගකීම පැවරී ඇත්තේ මානව සම්පත වෙතටයි. රාජ්‍ය නිලධාරීන් වන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, තම සේවාදායකයින්ට වඩාත් සමීප කිරීමටත්, සංවර්ධන වැඩසටහන් සාර්ථකව ඉටු කිරීම සඳහා දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කරීමටත්, විෂයානුබද්ධ පුහුණුව ලබාදීම පෙරදැරි කරගෙන සියලුම කාර්ය මණ්ඩලය නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මානව සම්පත් සංවර්ධන අංශය කාර්ය භාරය වේ.

දිළිඳුකම පිටුදැකීමේ මූලික අරමුණ පදනම් කරගෙන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීමට උරදෙන දෙපාර්තමේන්තුවේ මානව සම්පත වන කාර්ය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීමට 2024 වර්ෂය තුළ විවිධ විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙම පුහුණුව තුලින් සේවකයන් අභිප්‍රේරණය කිරීමත්, දෙපාර්තමේන්තුවේ ආයතනික හා සාමාජීය අරමුණු ලගා කර ගැනීමත් බලාපොරොත්තු වේ.

මානව සම්පත් සංවර්ධන අංශයේ දැක්ම හා මෙහෙවර

දැක්ම

"වසර 2030 දී දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා සවිමත් මානව ප්‍රාග්ධනයක් බිහි කිරීම"

මෙහෙවර

"දිළිඳු ජනතාව සවිබල ගන්වා ඔවුන් ජාතික ආර්ථිකයට දායක කර ගැනීම සඳහා නිලධාරීන්ට අවශ්‍යය දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්පවලින් ශක්තිමත් මානව සම්පතක් දෙපාර්තමේන්තුව තුළ බිහි කිරීම"

අරමුණු:-

- දෙපාර්තමේන්තුව තුළ පරිපූර්ණ සම්පත්දායක පිරිසක් බිහිකිරීම
- සියලුම කාර්යය මණ්ඩලය සුවිශේෂී දක්ෂතා ඇති මානව සම්පතක් බවට පත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ මෙහෙවර ලඟාකර ගත හැකි වන පරිදි දක්ෂතා සහිත කාර්යය මණ්ඩලයක් බිහි කිරීම.
- නිවැරදි කළමනාකරණය තුළින් ධනාත්මක ආකල්ප වලින් පරිපූර්ණ මානව සම්පතක් බිහි කිරීම.
- සාර්ථක මැදිහත්කරුවන් ලෙස කටයුතු කරන නිලධාරීන් නිර්මාණය කිරීම
- ඵලදායී හා කාර්යක්ෂම ගති ලක්ෂණවලින් යුත් කාර්යය මණ්ඩලයක් බවට පත් කිරීම.
- 2024 වර්ෂයේ සමස්ත දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරාලීමට සහයවීම.

2024 වර්ෂයේ - ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

➢ **විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

❖ **දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය සඳහා විෂය උප විශේෂිත පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.**

i. මාතලේ දිස්ත්‍රික්කයේ විගණන විමසුම් වලට පිළිතුරු ලියන ආකාරය පිළිබඳව නිලධාරීන්ට පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
ii. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කළමනාකරුවන් සඳහා අල්ලස් හා දූෂණය පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
iii. බදුල්ල, මාතර, මොනරාගල, ගාල්ල, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන පුහුණුව ලබා දීම.
iv. නුවරඑළිය දිස්ත්‍රික්කයේ නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ලිපිගොනු සකස් කිරීම පිළිබඳ පුහුණුව ලබා දීම.
v. රත්නපුර දිස්ත්‍රික්කයේ නිලධාරීන් සඳහා මූලික විමර්ශන පුහුණු වැඩසටහනක් පවත්වන ලදී
vi. ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
vii. රියදුරන් සඳහා දෙමළ භාෂා ප්‍රවීණතා පාඨමාලාවක් පැවැත්වීම.
viii. මූලික විමර්ශන රාජකාරි ඉටු කරන කළමනාකරුවන් සඳහා පුහුණු පැවැත්වීම.
ix. පරිපාලන අංශයේ නිලධාරීන් සඳහා වැටුප් සකස් කිරීම පිළිබඳ දින 3 ක පුහුණුවක් ලබා දීම.

- ❖ **කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම**
  - කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
  - විධායක නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම
  - කාර්යාල කාර්ය සහයක නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම
  - MN 6 කළමනාකරුවන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම
  - මාර්ගගතව දෙමළ භාෂා ප්‍රවීණතා පාඨමාලාව පැවැත්වීම
  - උසස් අධ්‍යයනය හදාරන නිලධාරීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ පාඨමාලා ගාස්තු ගෙවීම.

අස්වැසුම ප්‍රතිලාභී පවුල් 300,000 ක් සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා අවශ්‍ය මූලික පුහුණු කිරීම් සිදු කිරීම

රජයේ ප්‍රමුඛතම වැඩසටහනක් වන අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සමෘද්ධි නිලධාරීන් පුහුණු කිරීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මිලියන 3.3 මුදලක් වෙන් වූ අතර ප්‍රධාන පුහුණුකරුවන් තෝරා ගැනීම, පුහුණු කිරීම් හා දැනුවත් කිරීම සඳහා යොදවන ලදී. ඒ අනුව සඳහා ප්‍රධාන පුහුණුකරුවන් 43 දෙනෙකු සඳහා මූලික පුහුණුවක් ලබා දෙන ලදී. එමෙන්ම ව්‍යාපෘති කළමනාකරුවන්, දිස්ත්‍රික් නිලධාරීන් පුහුණු කිරීම සහ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම සිදු කරන ලදී.

1. ආසියානු සංවර්ධන බැංකු (ADB) හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ අස්වැසුම වැඩ සටහනට අයත් ප්‍රතිලාභීන් සවිබලගැන්වීමට අදාළ මානව සම්පත් සංවර්ධන කටයුතු

ආසියානු සංවර්ධන බැංකු හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ අස්වැසුම වැඩ සටහනට අයත් ප්‍රතිලාභීන් අතරින් සවිබලගැන්වීම සඳහා තෝරාගන්නා ප්‍රතිලාභීන්ට ජීවනෝපාය මාර්ග සකස් කරදීම සඳහා ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට අමතරව මානසික, සමාජීය සහ නීතිමය ආදී වශයෙන් විවිධ අංශ යටතේ ඔවුන් සවිබල ගැන්වීමටත්, මෙලෙස, තෝරා ගත් අස්වැසුම ප්‍රතිලාභීන් මානසික සවිබල ගැන්වීම සඳහා ඔවුන් තුළ ඇති විභව ශක්තීන් හඳුනාගෙන උපදේශණ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත. මේ සඳහා සකස් කරන ලද පුහුණු මාදිලියන් අනුව අදියර දෙකක් යටතේ අදාළ නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. පලමු අදියර යටතේ ADB මෙහෙයුම් අත්පොත නිකුත් කිරීම ADB මෙහෙයුම් අත්පොත පිළිබඳ දිස්ත්‍රික් අධ්‍යක්ෂවරු සහ කලමනාකරුවන් දැනුවත් කිරීම සිදු කල අතර අමාත්‍යාංශය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් සේවය කරන සමෘද්ධි නිලධාරීන් සහ උපදේශණ කාර්යංශය සහ කාන්තා කාර්යංශය යන ආයතනවල උපදේශණ නිලධාරීන් පුහුණු කර පුහුණු සංචිතයක් සකස් කිරීමත්, දෙවන අදියර යටතේ එලෙස පුහුණු කරන ලද පුහුණු උපදේශකයින් මඟින් ප්‍රතිලාභීන් පුහුණු කිරීමත් සිදුකරන ලදී.

ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකු හදිසි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වන දිස්ත්‍රික්කවල උපදේශණ නිලධාරීන් 44 දෙනෙකු පුහුණු කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම, ප්‍රධාන පුහුනු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වූ අතර දිළිඳකම පිටුදැකීමේ නව ප්‍රවේශයන්, ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය, සම්පත් සිතියම්ගත කිරීම, ඉලක්ක සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ සමීක්ෂණය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම පිළිබඳවත් පුහුණු කරන ලදී. එමෙන්ම දිස්ත්‍රික්ක 13 ක ක්ෂේත්‍ර නිලධාරීන් වන කළමනාකරුවන්ගේ සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කල අතර පුහුණු කල සංඛ්‍යාව 464 කි.

2. ලෝක බැංකු (WB) හදිසි සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ අස්වැසුම වැඩසටහනට අයත් ප්‍රතිලාභීන් සවිබලගැන්වීමට අදාළ මානව සම්පත් සංවර්ධන කටයුතු

ලෝක බැංකු (WB) හදිසි සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ අස්වැසුම වැඩසටහනට අයත් ප්‍රතිලාභීන් අතරින් සවිබලගැන්වීම සඳහා තෝරාගන්නා ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කර ඔවුන් ආර්ථික සහ සමාජීය වශයෙන් සවිබල ගැන්වීමට අමතරව මානසික, සමාජීය සහ නීතිමය ආදී වශයෙන් විවිධ අංශ යටතේ ඔවුන් සවිබල ගැන්වීමට තෝරා ගත් අස්වැසුම ප්‍රතිලාභීන්ගේ විභව ශක්තීන් හඳුනාගෙන ඔවුන් සවිබල ගැන්වීම සඳහා විවිධ වැඩසටහන් පැවැත්වීමට සැලැසුම් කර ඇත. ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ දිස්ත්‍රික් මට්ටමින් පුහුණු සංචිතයක් සකස් කිරීමත් එම පුහුණු සංචිතය මඟින් ප්‍රාදේශීය මට්ටමින් සේවය කරන සමෘද්ධි නිලධාරීන් පුහුණු කිරීම මේ වන විට අවසන් කර ඇත. එලෙස පුහුණු කරන ලද නිලධාරීන් මඟින් ප්‍රතිලාභීන් දැනුවත් කිරීමටත්, සවිබලගැන්වීමේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කර ඇත.

ලෝක බැංකු හදිසි ණය වැඩසටහන ක්‍රියාත්මක වන දිස්ත්‍රික්කවල අස්වැසුම ප්‍රතිලාභී පවුල් මනෝ සමාජීය වශයෙන් බලගැන්වීම සඳහා ප්‍රාදේශීය කවුන්සිල නිලධාරීන් පුහුණු කිරීම සහ පවුල් සංවර්ධන සැලසුම්කරණය (FDP) පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම අවසන් කර ඇත.

සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම.

සමෘද්ධි දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල පුහුණුව සඳහා යොදාගනු ලබන මාතර, සමනළ වැව නිල්ලඹ පිහිටි පුහුණු මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදි. තවද මෙම මධ්‍යස්ථානයන්වල කටයුතු කරගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය තාක්ෂණික උපකරණ සහ නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදි.

උසස් අධ්‍යාපන සහ වෘත්තීය පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් යොමු කිරීම.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම සඳහා උසස් අධ්‍යාපන පාඨමාලා සහ වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා උනන්දු කරවීමේ අරමුණින් නිලධාරීන් පෞද්ගලිකව තෝරාගෙන හදාරනු ලබන පාඨමාලා සඳහා පාඨමාලා ගාස්තු අදාළ ආයතන වෙත ගෙවන ලදී.

ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදල්

- **සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ සමාජ වැඩ පිළිබඳ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) හා ඒකාබද්ධව පවත්වනු ලැබූ සඳහා සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ කටයුතු අවසන් කරන ලදී.

ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ හා ව්‍යාපාර අධ්‍යයනය ආයතනය හා ඒකාබද්ධව සමෘද්ධි බැංකු සමිති සහ ප්‍රජාමූල බැංකු සමෘද්ධි කළමණාකරුවන් හා සංවර්ධන නිලධාරීන් සඳහා ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වූ අතර නිලධාරීන් 385 දෙනෙකු පුහුණු කරන ලදී. රාජ්‍ය හා පෞද්ගලික බැංකු වල අනුගමනය කරනු ලබන කළමනාකරණය, ගිණුම්කරණය, බැංකු කරණය ඇතුළු අනෙකුත් සම්මත ගිණුම් ක්‍රම පිළිබඳ දැනුම සහ පුහුණුව ලබා දී එතුළින් අපගේ බැංකු පද්ධතිය වඩාත් කාර්යක්ෂම හා සඵලදායී තත්ත්වයට පත් කිරීමේ අරමුණින් දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් විෂය නිර්දේශයන් යටතේ ඉහත පුහුණු වැඩසටහන දින 06 ක් පුරා නේවාසිකව පවත්වා අවශ්‍ය දැනුම ලබා දීමට කටයුතු කරන ලදී.

2024 - ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල - භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
දිස්ත්‍රික් කාර්යාල විසින් සංවිධානය කළ නිලධාරී පුහුණු වැඩසටහන්							
01	විගණන විමසුම් වලට පිළිතුරු ලිවීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම (මාතලේ දිස්ත්‍රික්කය)	85	දින 01	16,500		දේශීය	විගණන විමසුම් වලට පිළිතුරු ලිවීම කාර්යක්ෂම කිරීම.
02	අල්ලස් හා දූෂණ පිළිබඳ කළමනාකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් පැවැත්වීම - අනුරාධපුරය දිස්ත්‍රික්කය	70	දින 01	27,500		දේශීය	නිලධාරි රැකියා කටයුතු වඩාත් ගුණාත්මක සහ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
03	බදුල්ල, මාතර, මොණරාගල, ගාල්ල, හම්බන්තොට දිස්ත්‍රික්කවල නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන පුහුණුව	67	දින 02	295,514		දේශීය	නිලධාරි රැකියා කටයුතු වඩාත් ගුණාත්මක සහ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
04	නුවරඑළිය දිස්ත්‍රික්කයේ නිලධාරීන් විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳව පුහුණු කිරීම.			121,350		දේශීය	
05	රත්නපුර දිස්ත්‍රික්කයේ නිලධාරීන් මූලික විමර්ශන පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.			13,000		දේශීය	විමර්ශන කටයුතු කාර්යක්ෂම කිරීම
06	රියදුරන් සඳහා දෙමළ භාෂා ප්‍රවීණතා පාඨමාලාවක් පැවැත්වීම.	03	දින 01	4,500		දේශීය	භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීම

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
07	මූලික විමර්ශන රාජකාරි ඉටු කරන කළමනාකරුවන් සඳහා පුහුණුව පැවැත්වීම.	50	දින 03	259,779		දේශීය	මූලික විමර්ශන රාජකාරි කටයුතු විධිමත් කිරීම.
08	පාලන අංශයේ නිලධාරීන් සඳහා වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු කිරීම.		දින 03	287,820		දේශීය	වැටුප් සකස් කිරීමට අදාළ කටයුතු විධිමත් කිරීම.
09	කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම		දින 01	15,119		දේශීය	කාර්යක්ෂමතා කඩඉම් විභාගය
10	කාර්යක්ෂමතා කඩඉම් විභාගය - ප්‍රශ්න පත්‍ර සකස් කිරීම.			43,500			
11	විධායක නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.	17	දින 01	244,800		දේශීය	
12	කාර්යාල සහායක - කාර්යක්ෂමතා කඩඉම්	31	දින 01	9,000		දේශීය	ලබා ගැනීමට හැකියාව ලැබේ.
13	MN6 කළමනාකරුවන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් I	22		129,548		දේශීය	
14	සහකාර අධ්‍යක්ෂවරු සඳහා දෙමළ භාෂා ප්‍රවීණතා පාඨමාලාවක් (මාර්ග ගතව) පැවැත්වීම.	12		-			දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබාදීම.
15	උසස් අධ්‍යාපනය සඳහා සේවකයින් දිරිමත් කිරීම සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම.	20		1,027,000		දේශීය	නිලධාරි රැකියා කටයුතු වඩාත් ගුණාත්මක සහ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය
අස්වැසුම ප්‍රතිලාභී පවුල් 300,000 ක් සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා මූලික කටයුතු							
16	ප්‍රධාන පුහුණුකරුවන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.	100	දින 01	8,505		දේශීය	ප්‍රධාන පුහුණුකරුවන් තෝරා ගැනීම.

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
17	ප්‍රධාන පුහුණුකරුවන් සඳහා එක්දින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම- නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	29	දින 01	79,936		දේශීය	අස්වැසුම ප්‍රතිලාභී පවුල් 300,000 ක් සවිබලගැන්වීමේ වැඩසටහන පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන් 72 දෙනෙකු සඳහා මූලික දැනුවත් කිරීම කටයුතු සාර්ථකව ඉටු කරන ලදී.
18	ප්‍රධාන පුහුණුකරුවන් සඳහා එක්දින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම. සමනලවැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	43	දින 02	110,206		දේශීය	
19	ගම්පහ දිස්ත්‍රික් නිලධාරීන් සඳහා අස්වැසුම වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	235	දින 01	58,750		දේශීය	අස්වැසුම වැඩසටහන පිළිබඳව දැනුවත්වීම.
20	අස්වැසුම ජාතික වැඩසටහනට අදාළ ව්‍යාපෘති කළමනාකරුවන් පුහුණු කිරීම - නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	131	දින 03	520,996		දේශීය	අස්වැසුම වැඩසටහන පිළිබඳව ව්‍යාපෘති කළමනාකරුවන් දැනුවත්වීම.
21	අස්වැසුම ජාතික වැඩසටහනට අදාළ ව්‍යාපෘති කළමනාකරුවන් පුහුණු කිරීම සමනලවැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය	124	දින 03	560,641		දේශීය	අස්වැසුම වැඩසටහන පිළිබඳව ව්‍යාපෘති කළමනාකරුවන් දැනුවත්වීම.
22	අස්වැසුම ජාතික වැඩසටහනට අදාළ ව්‍යාපෘති කළමනාකරුවන් පුහුණු කිරීම නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය (දෙමළ මාධ්‍ය)	137	දින 03	577,190		දේශීය	අස්වැසුම වැඩසටහන පිළිබඳව ව්‍යාපෘති කළමනාකරුන් දැනුවත් වීම.

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
23	ප්‍රතිලාභීන් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම.	ප්‍රා. ලේ. කො. වසම් නිලධාරීන්	එක් දින	1,752,750		දේශීය	අස්වැසුම වැඩසටහන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් වීම.
ආසියානු සංවර්ධන බැංකු (ADB) අරමුදල්							
24	ප්‍රධාන පුහුණු කරුවන් (TOT කණ්ඩායම) පුහුණු කිරීමේ විශේෂ පුහුණු වැඩසටහන	53	දින 05	589,859		දේශීය	සවිබලගැන්වීම පිළිබඳව තාක්ෂණික දැනුමෙන් යුත් පුහුණුකරුවන් බිහිවීම
25	දිස්ත්‍රික්ක 13 ක ක්ෂේත්‍ර නිලධාරීන් (සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරුවන්)	464	එක් දින	-		දේශීය	සවිබලගැන්වීම වැඩසටහන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත්වීම
26	ත්‍රිකුණාමලය, අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම-නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය	97	දින 03	636,760		දේශීය	සවිබලගැන්වීම වැඩසටහන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් වීම.
27	කුරුණෑගල සහ මඩකලපුව දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම - නිලාවේලි මධ්‍යස්ථානය	115	දින 03	725,120		දේශීය	සවිබලගැන්වීම වැඩසටහන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත්වීම
28	මහනුවර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණුව- නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානයේදී	57	දින 02	402,375			අස්වැසුම වැඩසටහන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් වීම.
29	නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් නිල්ලඹ මධ්‍යස්ථානහිදී පුහුණු කරන ලදී.	71	දින 02	461,514			අස්වැසුම වැඩසටහන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත්වීම

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
30	කළුතර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් බලංගොඩ පුහුණුමධ්‍යස්ථානයේදී පුහුණු කරන ලදී.	65	දින 02	469,498			අස්වැසුම වැඩසටහන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් වීම.
31	කිලිනොච්චි, යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන්ට නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණුව ලබා දෙන ලදී.	72	දින 02X2	-			අස්වැසුම වැඩසටහන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් වීම.
32	මුලතිව්, කිලිනොච්චි, මඩකලපුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික් කළමනාකරුවන් සඳහා වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය සහ ප්‍රතිලාභීන් තෝරා ගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන- දෙමළ මාධ්‍ය - නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය	31		130,831			සවිබලගැන්වීමට අදාළ ප්‍රතිලාභීන් තෝරාගැනීම සහ වැඩසටනේ දිශානතිය පිළිබඳ දිස්ත්‍රික් හා ප්‍රදේශීය විෂයභාර නිලධාරීන් දැනුවත් කිරිම
33	මාතලේ, මහනුවර නුවරඑළිය කෑගල්ල, පොලොන්නරුව, අනුරාධපුර,කුරුණෑගල, කළුතර යන දිස්ත්‍රික් කළමනාකරුවන් සඳහා ADB සවිබලගැන්වීමේ වැඩසටහනක්‍රියාත්මක කරන ආකාරය සහ ප්‍රතිලාභීන් තෝරා ගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන - නිල්ලම්බ පුහුණු මධ්‍යස්ථානයේ	61	02	230,007			සවිබලගැන්වීමට අදාළ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සහ වැඩසටනේ දිශානතිය පිළිබඳ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය විෂය භාර නිලධාරීන් දැනුවත් කිරීම.

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු.) දේශීය	විදේශීය	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
34	ADB මෙහෙයුම් අත්පොත නිකුත් කිරීම පිළිබඳ දිස්ත්‍රික් අධ්‍යක්ෂවරු සහ කලමනාකරුවන් දැනුවත් කිරීම නිල්ලඹ	47	දින 02	423,296			ADB මෙහෙයුම් අත්පොත පිළිබඳ මනා දැනුමක් ලැබීම
35	ආසියානු සංවර්ධන බැංකුවේ ජීවනෝපාය සංවර්ධන හදිසි ණය ආධාර වැඩසටහන යටතේ පවුල් සංවර්ධන	56	දින 02	342,475			පවුල් සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳව පුහුණුකරුවන් දැනුවත් වීම
36	ආසියානු සංවර්ධන බැංකුව හදිසි ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිස්ත්‍රික්කවල අස්වැසුම ප්‍රතිලාභී පවුල් මනෝ සමාජීය ලෙස සවිබලගැන්වීම පිළිබඳව උපදේශන නිලධාරීන් පුහුණු කිරීම - දෙමළ මාධ්‍ය	19	දින 02	198,935			ප්‍රාදේශීය උපදේශන නිලධාරීන්ට ප්‍රතිලාභී පවුල් මනෝ සමාජීය ලෙස සවිබලගැන්වීම පිළිබඳව දැනුම ලැබීම
සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සහ මිලදී ගැනීම්							
37	සමනලවැව, නිල්ලඹ, මාතර සහ නිලාවෙලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන සඳහා උපකරණ මිලදී ගැනීම.			2,773,000			උපකරණ මිලදී ගෙන ඇති අතර ගෙවීම් සම්පූර්ණ කර ඇත.
ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදල් මත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම							
38	සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති නිලධාරීන් සඳහා ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යයනය	385		9,936,850			ගිණුම්කරණය පිළිබඳව විධිමත් දැනුමක් බැංකු කාර්ය මණ්ඩලය වෙත ලැබීම

පරිච්ඡේදය - 07- අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ.	වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.	ගබඩා අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.	විශේෂ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.6	වෙනත්	අදාළ නොවේ.	වෙනත් අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග
	පවත්වාගෙන යාම			
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට , සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.	නිකුත් කරනු ලබන විමසුම් සඳහා පිළිතුරු ලැබිය යුතුය.	දිස්ත්‍රික් විගණන ඒකක හරහා පිළිතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මු.රෙ. 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	ආයතන ඒකාබද්ධ කිරීමේදී මතුවූ තත්ව හේතුවෙන් ගැටළු මතුවන තව දුරටත්	ණය ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය විධි විධාන සලසා ඇත.

අං ක ය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
			නිරවුල් කළ යුතු ණය ශේෂ පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රේ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රේ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
15.3	මු.රේ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
16	**මානව සම්පත් කළමනාකරණය**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය තුළ තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කර තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

09. සංවර්ධන වැඩසටහන්වලට අදාල ඡායාරූප
Photographs related to Development Programs
அபிவிருத்தி நிகழ்ச்சித் திட்டம் தொடர்பான புகைப்படங்கள்

සමාජ සංවර්ධන අංශය - සමෘද්ධි ලොතරැයි නිවාස /
සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන
Social Development Division – Samurdhi
Special Housing Programme
சமூக அபிவிருத்திப் பிரிவு – சமுர்த்தி வீட்டுச்
சீட்டிழுப்பு / சமுர்த்தி விஸேட வேலைத்திட்டம்

සතුටු පවුල් වැඩසටහන
Sathutu Pawul Programme
மகிழ்ச்சியான குடும்பம் வேலைத்திட்டம்

ජාත්‍යන්තර දින වැඩසටහන්
International Day Programmes
சர்வதேச தின வேலைத்திட்டங்கள்

සැලසුම් හා මෙහෙයුම් අංශය
Planning & Monitoring Programme
திட்டமிடல் மற்றும் செயற்பாட்டு பிரிவு

ජීවනෝපාය අංශය
Livelihood Programme
வாழ்வாதாரப் பிரிவு

මානව සම්පත් සංවර්ධන අංශයේ වැඩසටහන්
Programs of Human Resource Development
Programme
மனிதவள அபிவிருத்திப் பிரிவின்
வேலைத்திட்டங்கள்

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development,
Social Security and Community Empowerment

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
DEPARTMENT OF SAMURDHI DEVELOPMENT

Government Digital PRESS